TVEC

2020

ANNUAL REPORT

වාර්ෂික වාර්තාව ஆண்டு அறிக்கை

තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව
மூன்றாம் நிலைக்கல்வி, தொழிற்கல்வி ஆணைக்குழு
TERTIARY AND VOCATIONAL EDUCATION COMMISSION

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
திறன்கள் அபிவிருத்தி, தொழிற் கல்வி, ஆராய்ச்சி மற்றும் புத்தாக்க இராஜாங்க அமைச்சு
State Ministry of Skills Development, Vocational Education, Research & Innovation

පටුන **පිටු අංකය**

කොමිෂන් සභා තොරතුරු II

දැක්ම හා මෙහෙවර III

සභාපතිතුමාගේ පණිවිඩය V

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය VII

1.0 හැඳින්වීම 1

2.0 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය 1

3.0 කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය 5

4.0 පාලන හා මුදල් අංශය 7

5.0 සැලසුම් හා පර්යේෂණ අංශය 15

6.0 පාඨමාලා ලියාපදිංචි, පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය 23

7.0 ජාතික නිපුණතා සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම් අංශය 29

8.0 තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය 39

9.0 කර්මාන්ත සම්බන්ධතා අංශය 49

10.0 තොරතුරු පද්ධති අංශය 65

මූල්‍ය ප්‍රකාශය 77 - 100

මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශය 77

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 78

ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 79

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 80

මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන් 82

මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ උප සටහන් 90

මූල්‍ය තත්ත්ව ප්‍රකාශ උප ලේඛන 01 - පාරිතෝෂික වෙන්කිරීම් 97

විගණණකාධිපති වාර්තාව 101

විගණකාධිපති වාර්තාවේ පැහැදිලි කිරීම් හා පිළිතුරු 112

කොමිෂන් සභා තොරතුරු

ආයතනය	:	තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව.
අමාත්‍යාංශය	:	නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය.
ලිපිනය	:	තුන්වන මහල ''නිපුණතා පියස'' 354/2 ඇල්විටිගල මාවත, කොළඹ 05.
ඊමේල් ලිපිනය	:	info@tvec.gov.lk
වෙබ් අඩවිය	:	www.tvec.gov.lk
දුරකථන අංකය	:	011-7608000
ෆැක්ස් අංකය	:	011-2555007
විගණකවරු	:	විගණකාධිපති. විගණකාධිපති දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.
බැංකුකරුවන්	:	මහජන බැංකුව වයි. එම්. බී. ඒ. ශාඛාව, බොරැල්ල..

දැක්ම

රැකියා වෙළඳපොළට ගැළපෙන හා ගුණාත්මක තෘතීයික
හා වෘත්තීය අධ්‍යාපනය අපේක්ෂා කරන සියළු දෙනාට
වෘත්තීය පුහුණුව ලැබීම අපගේ දැක්ම වේ.

මෙහෙවර

අභියෝගාත්මක ලෝක ශ්‍රම අවශ්‍යතා හා
සමාජ ආර්ථික අරමුණු ඉටුවන
කාර්යක්ෂම, ඵලදායී හා ගුණාත්මභාවය සහතික කළ
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමයක්
ස්ථාපිතකර පවත්වාගෙන යෑම අපගේ මෙහෙවර වේ.

සභාපතිතුමාගේ පණිවිඩය

විද්‍යාජෝති මහාචාර්ය දයන්ත විජයසේකර

2020 වසරේදී මා සභාපතිවරයා වශයෙන්ද කටයුතු කළ අතර ආර්.ඩී.එස්.කුමාරරත්න මහතා අධ්‍යක්ෂ ජනරාල් ලෙස මැයි 31 දක්වා රාජකාරී කරන ලදී. ජූනි මස 01 වනදා සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වන ජානක ජයලත් මහතා වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන්ද කටයුතු කළේය.

මේ වසර තුළදී ආරම්භ කළ අන්දමට අංශ ප්‍රධානීන්ගේ එකඟත්වයෙන් කොමිෂන් සභාවේ පරිපාලන ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කරගෙන ගිය අතර එය සියලුම අංශයන්හි මෙන්ම නිලධාරීන්ගේද කාර්යක්ෂමතාවය හා යෝග්‍යතාව ඉහළ නැංවීමට හේතු විය.පාර්ශවකරුවන්ගේ දුර්මත ඉවත් වී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ නියාමන ආයතනය ලෙස නැවත ප්‍රතිස්ථාපනය කිරීමට උත්සුක විය.

කෙසේ නමුත් අධ්‍යක්ෂ ජනරාල් තනතුර පිරවීම එසැනින් සිදු කළ යුතු කාරණයක් වූ අතර, ඒ සඳහා පුවත්පත් දැන්වීමක් මඟින් පත් කර ගතයුතුව තිබුණි. මෙම කාර්යය කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ ද, නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ හා මුදල් අමාත්‍යාංශයේ ද, මැතිවරණ කොමිෂන් සභාවේ ද අනුමැතිය මත සිදුකරන ලදී.

ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ක්‍රමය සමාලෝචනය කරගෙන ගිය අතර ඒ සඳහා ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර ප්‍රවීණ උපදේශවරයෙකු වන ඩේවිඩ් ලයිත් මහතාගේ ලැබුණු උපදෙස් අනුව අදාළ කාර්යය සිදු කරන ලදී.

කෙසේ වෙතත්, වසර දෙකකට ආසන්න කාලයක් අධ්‍යක්ෂ තනතුරු තුනක් පුරප්පාඩු ව පැවති අතර, එම තනතුරු සඳහා නිලධාරීන් පත් කරනු ලැබුවේ වැඩ බැලීමේ පදනම මතයි. විවිධ හේතූන් මත වැඩ බැලීමේ කාලය ඉක්මවා ගොස් තිබූ බැවින් අනෙකුත් තනතුරු පුරප්පාඩු සමඟ දැන්වීම් පළකරන ලදී. නමුදු ජනාධිපතිවරණය වැනි විවිධ කාරණා හේතුවෙන් තවදුරටත් තනතුරු පුරප්පාඩුව පවතී. පසුකාලීනව අධ්‍යක්ෂ තනතුරු පිරවීමට නොයෙක් පියවර ගත් නමුත් ඒවා සාර්ථකව නිම කිරීමට නොහැකි විය.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යය භාර්යයක්ව ඇති කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ප්‍රකාශය සකස් කිරීම සඳහා මෙම වර්ෂය තුළදී ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව හා එක්ව කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනය එළිදැක්වීම සඳහා උපරිම දායකත්වය ලබා දුන් අතර මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වැඩමුළුවක් ද පවත්වන ලදී. මෙම වැඩමුළුව අනුව එම කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ප්‍රකාශය සකස් කිරීමේ වැඩකටයුතු කාර්යක්ෂමව සිදුකරන ලදී.

නිපුණතා ආංශික සභාවේ කාර්යය සාධනය මීට වඩා ඵලදායීව තිබිය යුතු වූ අතර මේ හරහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් පරිමේයකරණය විධිමත් කළ යුතුව ඇත.

වෘත්තීය මාර්ගෝපදේශනය සැපයීමේ අවශ්‍යතාවය සඳහා TVET Guide 2020 තොරතුරු පද්ධති අංශය මඟින් ඩිස්ත්‍රික් වශයෙන් පිටපත් සකස් කිරීම සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය හරහා ඉතා පුළුල් ලෙස තොරතුරු සපයා තිබුණද වෘත්තීය මාර්ගෝපදේශන අවශ්‍යතාව සැපිරීමට තවදුරටත් කළ හැකිය.

ජාතික වෘත්තීය සුදුසුකම් අංශය සීමිත කාර්යය මණ්ඩලයක් සමඟ අවශ්‍ය ලියකියවිලි සකස් කර පාර්ශවකරුවන්ට හැකි උපරිමයෙන් මඟ පෙන්වීම ලබා දුන්නේය. කාර්යය මණ්ඩල හිඟයක් තිබියදී ලියාපදිංචි කිරීමේ හා ප්‍රතීතන අංශය නැවත වරක් දිවයින පුරා සිය රාජකාරී කටයුතු උපරිමයෙන් සිදු කළේය. එලෙසම අක්‍රමිකතා ඇතුළු බොහෝ අඩුපාඩුකම් මඟහරවා ගැනීම සඳහා තත්ත්ව පාලන හා නියාමන අංශය ක්‍රියාපටිපාටිවල විශාල වෙනස්කම් සිදු කිරීමට උත්සාහ ගත්තේය. සැලසුම් හා පර්යේෂණ අංශය විසින් TVET පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් කිහිපයක් සකස් කර තිබුණි.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පනත් සංශෝධන සැලසුම් සමඟ ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි වූ නමුත් නව ක්‍රමවේදයකට 2021 දී සංශෝධනය කිරීමට යෝජනා කර ඇත.

2021 වර්ෂය තුළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත අපේක්ෂිත ඉලක්කයන් සහ සේවාවන් සපුරාගැනීමට හැකි වෙතැයි මම බලාපොරොත්තු වෙමි.

කොමිෂන් සභාවේ පාලක සභාවේ සාමාජිකයින්ගෙන් හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලයේ සියළු දෙනාගෙන්ම මේ දක්වා කාලය තුළ ලැබුණු සහයෝගයට මම ඉතා කෘතඥ වෙමි.



විද්‍යාජෝති මහාචාර්ය දයන්ත විජයසේකර
සභාපති

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව 1990 අංක 20 දරණ පනතින් පිහිටුවා 1999 අංක 50 දරණ පනතින් සංශෝධනය කර ඇත. කොමිෂන් සභාවේ මූලික පරමාර්ථ අතර ප්‍රතිපත්ති හා සැලසුම් සැකසීම, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණුවේ ගුණාත්මකභාවය පවත්වාගෙන යාම හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රදානයන් සඳහා ක්‍රමවේදයන් පවත්වාගෙන යාම ආදී කරුණු වේ.

රටේ ආර්ථිකයට අවශ්‍ය නිපුණතා ශ්‍රම සම්පත ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සැකසීම හා පුහුණුව සම්බන්ධීකරණය ද කිරීම කොමිෂන් සභාවේ කාර්යයභාර්යයන් වේ. එහිදී කර්මාන්තයේ දායකත්වය අතිශයින් වැදගත් වන අතර එම නිසා කොමිෂන් සාමාජිකයන් අතර සේවායෝජකයින්ගේ සංගම් නියෝජිතයින්ගේ, වාණිජ්‍ය මණ්ඩල නියෝජිතයින්ගේ හා අනෙකුත් සාමාජිකයින්ගේ කාර්යයභාරය ඉතා අගය කළ යුතුය.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 89 දෙනෙකුගෙන් යුක්ත කාර්යය මණ්ඩලය අභිප්‍රේරණය සඳහා විවිධ ක්‍රියාමාර්ග 2020 වසරේදී ගනු ලැබූ අතර සේවයට අදාළ පුහුණු පාඨමාලා කාර්යය මණ්ඩලය වෙත ප්‍රදානය කරන ලදී. මෙම වසරේදී ප්‍රසිද්ධ දැන්වීම මඟින් අත්‍යවශ්‍ය අනුමත කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

ආයතනයේ මූල්‍ය ප්‍රගතිය සැළකීමේදී 2020 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 131 ක් ද ප්‍රාග්ධන වියදම සඳහා රුපියල් මිලියන් 5.25 ක්ද මහාභාණ්ඩාගාරය විසින් නිදහස් කරන ලද අතර 2020 වසර සඳහා උපයන ලද මුළු ආදායම රුපියල් මිලියන 28.5ක් විය. 2020 වසරේදී මහාභාණ්ඩාගාරය විසින් නිදහස් කරනු ලැබූ පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යයන් සඳහා 100% උපයෝගී කරගෙන ඇත.

මෙම වසරේදී කළ වැදගත් හා තීරණාත්මක කාර්යයන් අතර 2019 වසරේදී සංවර්ධනය කළ ප්‍රතිපත්ති රාමුවට අනුව ශ්‍රී ලංකාවේ වෘත්තීය හා කාර්මික අධ්‍යාපනය හා පුහුණුව සඳහා පස් අවුරුදු සංවර්ධන සැලැස්ම (2021 - 2025) සැකසීම සඳහන් කළ හැකි අතර, 2020 වසරේදී ආබාධිත පුද්ගලයන්ගේ නිපුණතා ඇගයීම සඳහා විශේෂිත වූ ක්‍රමවේදයක් හා නම්‍යශීලී ඉගෙනුම් ක්‍රමයක් (FLM) හඳුන්වාදීමද සඳහන් කළ හැකිය.

කොවිඩ් 19 තත්වය හමුවේ වුවත් ආයතන ලියාපදිංචි හා ප්‍රතීතනය සඳහා කළ කාර්යභාරය අතර ආයතන 319 ලියාපදිංචි කිරීම හා ආයතන 453 ලියාපදිංචිය යාවත්කාලීන කිරීම ප්‍රශංසනීයවේ. තවද පාඨමාලා 604 අලුතින් ප්‍රතීතනය කළ අතර 623 යාවත්කාලීන කරන ලදී.

මෙම වසරේදී ජාතික නිපුණතා සම්මත 39ක් සංවර්ධනය හා 26ක ප්‍රමාණයක් යාවත්කාලීන කර ඇත. තවද අනෙකුත් සමාන හා සමාන්තර පාඨමාලා සඳහා සමාන කිරීමේ සහතික ද 1742 නිකුත් කර ඇත. තවද රජයේ භාෂා ප්‍රතිපත්තිය අනුව විෂයමාලා අදාළ පරිදි භාෂා ත්‍රිත්වයෙන්ම පළකරන ලද අතර මෘදු පිටපත් නොමිලේ බාගත කිරීමට ඉඩප්‍රස්ථා සැලසීම කොමිෂන් සභාව විසින් ගනු ලැබූ වැදගත් තීරණයකි.

කර්මාන්ත සම්බන්ධතා වැඩි දියුණු කිරීම සඳහාද විශාල කාර්යයභාරයක් මෙම වසරේදී සිදුකර ඇති අතර නිපුණතා ආංශික සභාවල (Skill Council) කටයුතු ශක්තිමත් කිරීම හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පිහිටුවීමත් වැදගත් කාර්යයක් විය. ආංශික සභාවන් හරහා ඒ ඒ කර්මාන්ත ව්‍යවසායකයිනගේ අදහස් අනුව කර්මාන්ත හා වෘත්තීය පුහුණුව සම්බන්ධ කිරීම සඳහාද වැඩසටහන් රාශියක් සිදුකරන ලදී.

ඇගයීම් හා තත්ව පාලන ක්‍රමවේදයන් තවදුරටත් ශක්තිමත් කිරීම 2020 වසරේදී සිදුකල අතර නව NVQ ඇගයීම්කරුවන් 139 පත් කල අතර 145 දෙනෙකුගේ ඇගයීම් බලපත්‍ර යාවත්කාලීන කරන ලදී. පරිගණක ගත අහඹු ඇගයීම්කරුවන් පත් කිරීම් පද්ධතිය ස්ථාපිත කිරීම 2020 වසරේදී අප ලැබූ ජයග්‍රහණයකි. දැනුම ඇගයීම් ක්‍රමවේදය තුළින් NVQ සහතිකයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා පියවරයන් තවදුරටත් ශක්තිමත් කිරීම මෙම වසරේදී සිදු කරන

ලදී. පාඨමාලා හා ඇගයීම් නොපැවැත්වීමේ හේතුව නිසා නිකුත් කරන සහතික ප්‍රමාණය 47,621ක් විය. මෙය සහතික 30,000 ප්‍රමාණයක් පෙර වසරට සාපේක්ෂව අඩු වීමකි.

2020 වසරේදී අප ක්ෂේත්‍රයේද තොරතුරු තාක්ෂණය භාවිතය වැඩි වූ අතර දුරස්ථ අධ්‍යාපනය, මාර්ගගත හා මිශ්‍ර ඉගෙනුම් ක්‍රමවේදය (Blended Learning) සඳහා 2008 වසරේදී සෑදූ පුහුණු පාඨමාලා ඇගයීම් ක්‍රමවේදය යාවත්කාලීන කරනු ලැබීය. තවද 2020 වසරේ ජූලි 15 ලෝක තරුණ නිපුණතා දිනයට සමගාමීව ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සහ ලංකා සේවය සම්මේලනය (EFC) හා එකතුව නිපුණතා බලපත්‍රය (Skills Passport) ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් එලිදැක්වීමට හැකිවිය.

ශ්‍රම වෙළඳපොල තොරතුරු මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබාදීමද මෙම වසරේදී සිදු විය. රැකියා දැන්වීම් 160,933 ක ප්‍රමාණයකට අදාළ තොරතුරු විශ්ලේෂණය කර එහි සාරාංශගත කොට තිබුණි. ලියාපදිංචි හා ප්‍රතීතනය කරන ලද පුහුණු පාඨමාලා 6000 පමණ තොරතුරු ඇතුළත් TVET Guide පලකිරීමද මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කරන ලදී.

2020 වසර ඉතාමත් දුෂ්කර වසරක් වූ නමුත් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට සාධනීය මෙහෙවරක් ඉටු කිරීමට සහ ඉහළ ප්‍රගතියක් ලඟාකර ගැනීමට හැකි වූ බව සඳහන් කරන අතර, ඊට දායක වූ කොමිෂන් සභා සාමාජිකයන්ටත් සියලු කාර්යය මණ්ඩලයට හා අමාත්‍යාංශයට ද ස්තූති කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ජානක ජයලත්
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)

1.0 හැඳින්වීම

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපනය කරන ලද අතර 1999 අංක 50 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන(සංශෝධිත) පනත මඟින් 1999 දෙසැම්බර් 16 දින සිට ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ක්‍රියාත්මක වේ..

කොමිෂන් සභාවේ පොදු අරමුණු පහත සඳහන් පරිදි වේ.

(අ) ආර්ථිකයේ මිනිස් සම්පත් අවශ්‍යතා වලට සරිලන අයුරින් සියළුම මට්ටම්වල තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම

(ආ) සහතික පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ඇතුළුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රධානයන් පිරිනැමීම සඳහා ජාතික වශයෙන් පිළිගත් ක්‍රමයක් සංවර්ධනය කිරීම සහ

(ඇ) තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය සලස්වන ශිල්ප ආයතන, නියෝජ්‍ය ආයතන සහ වෙනත් සියළු ආයතනවල ශාස්ත්‍රීය හා පුහුණුවීම් සම්මතයක් පවත්වාගෙන යාම

2.0 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය

නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම කොමිෂන් සභාව 1999 අංක 50 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනතේ දැක්වෙන විධි විධාන අනුව පත් කරනු ලබන සභාපතිවරයෙකු ඇතුලු සාමාජිකයන් 17 දෙනෙකුගෙන් සමන්විත වේ.

2020 වසර තුල කොමිෂන් සභා සංයුතිය

පනතේ (6:1) (ඌ) වගන්තිය යටතේ කර ඇති පත්වීම්,

1.	මහාචාර්ය දයන්ත එස් විජේසේකර මහතා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව	-	සභාපති
2.	මහාචාර්ය ටී.එම්.බන්දුල පාලවත්ත මහතා ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත	-	සාමාජික
3.	වෛද්‍ය සේනක දේවේන්ද්‍ර පිලපිටිය මහතා ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත	-	සාමාජික

4.	එම්.පී.කේ.එම්.ප්‍රනාන්දු මහතා ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත	-	සාමාජික
5.	ක්‍රිෂාන්ති විරකෝන් මහත්මිය ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත	-	සාමාජික
6.	පී.ඒ.ඩි.ආර්.චන්ද්‍රසිරි මහතා ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත	-	සාමාජික
7.	කනිෂ්ක වීරසිංහ මහතා ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත	-	සාමාජික
8.	මහාචාර්ය එන්.ආර්.අබේනායක මහත්මිය ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත	-	සාමාජික
9.	ජයන්ත විජේසිංහ මහතා ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත	-	සාමාජික
10.	මංජුල හිරන්‍ය ද සිල්වා මහතා ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත	-	සාමාජික
11.	මහාචාර්ය කපිල පෙරේරා මහතා ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත (අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් තනතුරට පත්වීම ලැබීමෙන් පසු 2020.08.17 වන දින කොමිෂන් සභා සාමාජිකත්වයෙන් ඉල්ලා අස් වී ඇත.)	-	සාමාජික
12.	මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත (මහාචාර්ය කපිල පෙරේරා මහතා ඉල්ලා අස්වීම නිසා ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා නව පත් කිරීම)	-	සාමාජික

පනතේ 6 (1) (අ) සිට (උ) වගන්ති යටතේ කර ඇති පත්විම්

අ)	ආර්.ඩි.එස්.කුමාරරත්න මහතා අධ්‍යක්ෂ ජනරාල් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව - 2020.06.01 දක්වා	-	සාමාජික
	ජානක ජයලත් මහතා අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව - 2020.06.01 සිට	-	සාමාජික
ආ)	තරංග නලීන් ගම්ලත් මහතා සභාපති ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය	-	සාමාජික
ඇ)	දමිත වික්‍රමසිංහ මහතා සභාපති ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය	-	සාමාජික
ඈ)	පි.එන්.කේ.මලලසේකර මහත්මිය අධ්‍යක්ෂ ජනරාල් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තුමේන්තුව	-	සාමාජික
ඉ)	ආචාර්ය කේ.එල්.ජයරත්න මහතා අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය	-	සාමාජික
ඊ)	ගීතා විමලවීර මහත්මිය මුදල් අමාත්‍යාංශය මහා භාණ්ඩාගාර නියෝජිත	-	සාමාජික

3.0 කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිළධාරියා ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කරන අතර ඔහුගේ සහාය සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු, අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකු සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/සහකාර අධ්‍යක්ෂවරුන් 25 දෙනෙකු ඇතුළුව 89 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් මගින් 2020 වසර තුලදී කොමිෂන් සභාවේ කාර්යභාර්ය ඉටු කරන ලදී. ඒ අනුව කොමිෂන් සභාවේ අරමුණු හා පරමාර්ථ කාර්යක්ෂමව ඉටු කර ගැනීම පිණිස පහත දැක්වෙන අංශ යටතේ කටයුතු සංවිධානය කරනු ලැබ ඇත.

- පාලන හා මුදල් අංශය
- සැලසුම් හා පර්යේෂණ අංශය
- ආයතන ලියාපදිංචි ප්‍රතිපාදන හා තත්ත්ව කළමනාකරණ පද්ධති අංශය
- තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය
- කර්මාන්ත සම්බන්ධතා (වෘත්තික හා කර්මාන්ත) අංශය
- ජාතික වෘත්තීය සුදුසුකම් අංශය
- තොරතුරු පද්ධති අංශය
- නීති අංශය

කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ට අනුව කොමිෂන් සභාව සඳහා 116 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුමතව ඇතත්, 2020.12.31 දිනට කාර්ය මණ්ඩලය 89 දෙනෙකුගෙන් සමන්විත විය. විස්තර පහත දක්වා ඇත.

වගුව 3.1 කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය - 2020

තනතුරු නාමය		අනුමත සංඛ්‍යාව	2020/12/31 දිනට සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව
1	අධ්‍යක්ෂ ජනරාල්	01	00
2	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	01	01
3	අධ්‍යක්ෂ	07	05
4	ශ්‍රම වෙළඳපොල විශ්ලේෂක	01	01
5	නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ	29	25
6	නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක හා විමර්ෂන)	01	01

	තනතුරු නාමය	අනුමත සංඛ්‍යාව	2020/12/31 දිනට සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව
7	සහකාර අධ්‍යක්ෂ (නීති/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)	01	01
8	නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)	01	01
9	සංඛ්‍යාලේඛනඥ	01	01
10	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පුස්තකාල)	01	01
11	පරිපාලන නිලධාරි	01	01
12	භාෂා පරිවර්තක (සිංහල/දෙමල/ඉංග්‍රීසි)	01	01
13	වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරි	06	06
14	සංවර්ධන නිළධාරි	17	10
15	තොරතුරු තාක්ෂණ නිළධාරි	01	00
16	තොරතුරු තාක්ෂණ සහකාර	02	01
17	පරිගණක යෙදවුම් සහායක	06	03
18	කළමණාකරන සහකාර (I ශ්‍රේණිය / II ශ්‍රේණිය / III ශ්‍රේණිය)	16	10
19	තොරතුරු සහායක	01	00
20	රියදුරු (I ශ්‍රේණිය / II ශ්‍රේණිය / III ශ්‍රේණිය)	14	12
21	කාර්යාල කාර්ය සහායක	07	07
	එකතුව	**116**	**89**

2020.07.10 දින කළමනාකරණ සහකාර තනතුරේ සේවය කරන ලද නලින් ද සිල්වා මහතා වැඩසටහන් සම්බන්ධීකරණ නිළධාරී තනතුරට උසස් වීම් ලද අතර, 2020.08.28 දින කළමනාකරණ සහකාර තනතුරේ සේවය කරන ලද ඩබ්.පී.සුමින්ද අරුණාකීර්ති මහතා සහකාර අධ්‍යක්ෂ තනතුරට උසස්වීම් සිදු කරන ලදී.

සහකාර අධ්‍යක්ෂ,කළමනාකරණ සහකාර,පරිගණක යෙදවුම් සහායක,සංවර්ධන නිළධාරී, තොරතුරු සහායක, තොරතුරු තාක්ෂණ සහකාර යන තනතුරු සඳහා 2020.10.21 දින පළකරන ලද ප්‍රසිද්ධ දැන්වීම් අනුව ලද අයදුම්පත් කෙටිලැයිස්තු ගත කිරීමේ කාර්යය ක්‍රියාත්මක කරන ලදී.

.

4.0 පාලන හා මුදල් අංශය

කොමිෂන් සභාවේ කාර්යභාරය කාර්යක්ෂමව හා සඵලදායීව ඉටුකරලීමට අවශ්‍යය වන මානව හා මුල්‍ය සම්පත් කළමනාකරණය ඇතුළුව යටිතල පහසුකම් සැපයීමේ කාර්යය ඉටුකරනු ලබයි.

මානව සම්පත් කළමනාකරණයට අදාලව තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත නම් සඳහන් නිලධාරීන් 2020 වසර තුළදී කොමිෂන් සභාවේ විධානය පරිදි පහත තනතුරු වලට පත්කර ගන්නා ලදී.

4.1 2020 වසරේ උසස්වීම්.

නම		තනතුර	උසස්වීම් ලද දිනය
1	ආචාර්ය අපිත් කුසුම් පොල්වත්ත මයා	අධ්‍යක්ෂ (තත්ත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන)	2020.02.28
2	ආර්.එන්.පී.ද සිල්වා මහතා	වැඩසටහන් සම්බන්ධීකරණ නිළධාරී	2020.07.10
3	ඩබ්.පී.සුමින්ද අරුණාකීර්ති මහතා	සහකාර අධ්‍යක්ෂ	2020.08.28

4.2 2020 වසරේ සේවයෙන් ඉවත්වීම්

නම		තනතුර	සේවයෙන් ඉවත් වූ දිනය
1	කේ.ටී.අමරසිංහ මිය	පරිගණක යෙදවුම් සහායක	2020.01.09
2	එච්.ඒ.ඩී.ඩී නයනහාරී	සංවර්ධන නිළධාරී	2020.11.02

4.3 2020 වර්ෂය තුල ක්‍රියාත්මක වූ වැඩ බැලීමේ / වැඩ ආවරණය කිරීමේ තනතුරු සඳහා කොමිෂන් සභාව තුලින් තේරී පත් වූ නිළධාරීන්

නම		වැඩ බැලීමේ / වැඩ ආවරණය කිරීමේ තනතුර	දිනය
1	ජේ.ඒ.ඩී.ජේ.ජයලත් මයා	අධ්‍යක්ෂ පාලන වැඩ බලන	2020.02.10-2020.05.31
2	ජේ.ඒ.ඩී.ජේ.ජයලත් මයා	අධ්‍යක්ෂ ජනරාල් වැඩ බලන	2020.06.01
3	මංජුල විදානපතිරණ මයා	අධ්‍යක්ෂ (කර්මාන්ත සබඳතා) වැඩ බලන	2017.03.16

4	ඒ.එස්.අමරසිංහ මිය	අධ්‍යක්ෂ (පාලන) වැඩ ආවරණ	2020.06.01 -2020.07.09
5	ඒ.එස්.අමරසිංහ මිය	අධ්‍යක්ෂ (පාලන) වැඩ බලන	2020.07.10

4.4 දේශීය හා විදේශීය පුහුණු

කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ විෂය දැනුම වර්ධනය කිරීම පෙරදැරිව නිළධාරීන් දේශීය පුහුණුවීම් සම්මන්ත්‍රණවලට යොමු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දේශීය පුහුණු වීම් / සම්මන්ත්‍රණ වලට සහභාගි වූ නිළධාරීන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

නම		අංශය	තනතුර	පුහුණු පාඨමාලාව	ආයතනය / පුහුණුකරු	කාල සීමාව
1	පී.සී.ජනක් ද සිල්වා මයා	අභ්‍යන්තර විගණන හා විමර්ෂණ අංශය	සංවර්ධන නිළධාරි	අභ්‍යන්තර විගණන නිළධාරීන්ගේ කාර්යය භාර්යය	SSDP	දින 1
2	පී.එල්.අයි.ඒ.එස්.ද සොයිසා මෙනවිය	අභ්‍යන්තර විගණන හා විමර්ෂණ අංශය	සංවර්ධන නිළධාරි	අභ්‍යන්තර විගණන නිළධාරීන්ගේ කාර්යය භාර්යය	SSDP	දින 1
3	යූ.ඒ.ප්‍රියන්ත ධර්මසේන මයා	සැලසුම් හා පර්යේෂණ අංශය	සහකාර අධ්‍යක්ෂ	Competency and expertise through learning and un learning in the work place Assessment	B.H.S. Suraweera Charted Engineer	දින 1
4	නිලූකා රාජපක්ෂ මිය	ආයතන ලියාපදිංචි ප්‍රතීතන හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරී	Competency and expertise through learning and un learning in the work place Assessment	B.H.S. Suraweera Charted Engineer	දින 1
5	වජිර විජේසිංහ මයා	කර්මාන්ත සම්බන්ධතා අංශය	සහකාර අධ්‍යක්ෂ	Competency and expertise through learning and un learning in the work place Assessment	B.H.S. Suraweera Charted Engineer	දින 1

නම		අංශය	තනතුර	පුහුණු පාඨමාලාව	ආයතනය / පුහුණුකරු	කාල සීමාව
6	නදීෂ් ද සිල්වා මයා	තොරතුරු පද්ධති අංශය	සහකාර අධ්‍යක්ෂ	Competency and expertise through learning and un learning in the work place Assessment	B.H.S. Suraweera Charted Engineer	දින 1
7	එච්.බී.සී. හඳපාන්ගොඩ මිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	සහකාර අධ්‍යක්ෂ	Competency and expertise through learning and un learning in the work place Assessment	B.H.S. Suraweera Charted Engineer	දින 1
8	අනුෂා කුමාරි ද සිල්වා මිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	සහකාර අධ්‍යක්ෂ	Competency and expertise through learning and un learning in the work place Assessment	B.H.S. Suraweera Charted Engineer	දින 1
9	ජී. චතුරි උපේක්ෂා මිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	සහකාර අධ්‍යක්ෂ	Competency and expertise through learning and un learning in the work place Assessment	B.H.S. Suraweera Charted Engineer	දින 1
10	අනුෂා කුමාරි ද සිල්වා මිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	සහකාර අධ්‍යක්ෂ	Master In Labour Relation and Human Resource Management	University of Colombo	අවුරුදු 2
11	පී.ඩී.එස්. කාරියවසම් මිය	නීති අංශය	සහකාර අධ්‍යක්ෂ	Master In Labour Relation and Human Resource Management	University of Colombo	අවුරුදු 2

4.5 විදේශීය සම්මන්ත්‍රණ වලට සහභාගි වීම

2020 වර්ෂයේදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට විදේශ සම්මන්ත්‍රණ වලට සහභාගී වීමට ආරාධනා නොලැබුණු හෙයින් විදේශීය සම්මන්ත්‍රණවලට සහභාගිවීමක් මෙම වර්ෂයේදී සිදු නොවුණි.

4.6 වාර්ෂික වෘත්තීය සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය

කොමිෂන් සභාවේ නිලධාරීන් වෘත්තීය ආයතන වල සාමාජික ගාස්තු ගෙවීමේදී පහත සඳහන් නිලධාරීන් සඳහා ඔවුන්ගේ සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය කර ඇත.

1. **ජේ. ඒ. ඩී. ජේ. ජයලත් මහතා -** නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
   බ්‍රිතාන්‍ය පරිගණක සංගමය.
   ශ්‍රී ලංකා පරිගණක සංගමය.

2. **පී.ඒ.එම්.යූ.ගනේපොල මහතා -** අධ්‍යක්ෂ (තොරතුරු පද්ධති)
   ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනය

3. **ඒ.එස්. අමරසිංහ මහත්මිය** - නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)
   ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය.
   සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී සාමාජික ගාස්තු

4. **ආර්.ජේ. සමරවීර මහතා** - නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන හා විමර්ශන)
   ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය.
   සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී සාමාජික ගාස්තු

5. **එස්.යූ.කේ. රුබසිංහ මහතා** - අධ්‍යක්ෂ
   ආයතන ලියාපදිංචි ප්‍රතිපත්ති හා තත්ත්ව කළමනාකරණ පද්ධති අංශය
   ශ්‍රී ලංකා වරලත් ඉංජිනේරු ආයතනය.

6. **වජිර පෙරේරා මහතා** - අධ්‍යක්ෂ
   සැලසුම් හා පර්යේෂණ අංශය
   ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ආයතනය
   රාජකීය රසායන විද්‍යා සංගමය - එක්සත් රාජධානිය

7. **ආචාර්ය එච්.එම්.ඒ.ඩී.කේ. හේරත් මහත්මිය** - සහකාර අධ්‍යක්ෂ
   ශ්‍රී ලංකා පරිගණක සංගමය

8. **පී.ඩී.එස්.කාරියවසම් මිය** - සහකාර අධ්‍යක්ෂ
   මහාධිකරණය

9. **එච්.බී.අයි.සම්පත් මයා** - වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරී
   ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනය

4.7 මූල්‍ය ප්‍රගතිය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය මගින් ලබා දෙනලදී.

2020 වර්ෂය සඳහා කොමිෂන් සභාව සිය වියදම් සඳහා පහත පරිදි ඇස්තමේන්තු කරන ලදී.

- පුනරාවර්තන වියදම සඳහා රුපියල් මිලියන 151 කි.
- ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 5.650 කි.

2020 වර්ෂය සඳහා මහාභාණ්ඩාගාරය විසින් කොමිෂන් සභාව වෙත ඇස්තමේන්තු ගත කරන ලද අගයෙන් පුනරාවර්තන වියදම සඳහා රුපියල් මිලියන 131ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 5.25ක්ද නිදහස් කර තිබුණි.

2020 වර්ෂයෙහි උපයනලද ආදායම පිළිබඳ විස්තර පහත පරිදි වේ.

ආදායම් වර්ගය	ඇස්තමේන්තුගත ආදායම (රු.)	සත්‍ය ආදායම (රු.)
ආයතන ලියාපදිංචි ආදායම	2,000,000.00	2,517,800.00
ආයතන ප්‍රතිනත හා ඇගයුම්	2,000,000.00	1,522,900.00
සහතිකපත් නිකුත් කිරීම	5,075,000.00	2,794,330.00
සහතිකපත් සැසඳීම	4,000,000.00	1,281,500.00
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික කිරීම	500,000.00	415,000.00
විභාග ගාස්තු	25,000,000.00	17,772,251.00
විෂය මාලා අලෙවිය	700,000.00	418,050.00
ශිෂ්‍ය වාර්තා පොත් අලෙවිය	2,500,000.00	981,187.00
ඇගයුම් ගාස්තු	350,000.00	86,250.00
අනෙකුත් පොත් අලෙවිය	200,000.00	1,600.00
තත්ව කළමණාකරන සහතික කිරීම	1,000,000.00	741,600.00
මුළු ආදායම	**43,325,000.00**	**28,532,468.00**

4.8 අභ්‍යන්තර විගණනය හා විමර්ශනය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යයන්ට අදාලව විගණන පරීක්ෂණ පැවැත්වීම අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ඇත.පෙර වර්ෂ වලදී මෙන් අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් බව, චක්‍රලේඛ උපදෙස් වලට, කොමිෂන් සභා පනත හා කොමිෂන් සභාවට අදාල වන වෙනත් නීතිරීති වලට අනුකූලවීම විමසමින් මූල්‍ය හා කාර්ය සාධනය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන හා විමර්ශන කටයුතු අභ්‍යන්තර විගණන සැළැස්මට අනුව ඉදිරියට ගෙන යන ලදී.

අභ්‍යන්තර විගණන හා විමර්ශන වැඩසටහන අනුව සැලසුම් කරන ලද ප්‍රධාන විගණන ප්‍රදේශ 06 ට ආවරණ කරන ලද අතර අභ්‍යන්තර විගණන හා විමර්ශන වැඩසටහන අනුව සැලසුම් නොකරන ලද විගණන විමර්ශනයන් ද අභ්‍යන්තර විගණනය විසින් අධ්‍යක්ෂ ජනරාල්ගේ හා විගණන හා කළමණාකරන කමිටුවේ උපදෙස් පරිදි ඉටු කරන ලදී.

විගණන හා විමර්ශන කටයුතු සහ නව ප්‍රතිපත්ති යෝජනා කිරීම හෝ වෙනස් කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙන්ම විගණන හා කළමනාකරණ කමිටුව විසින් කෙරුණු අතර කොමිෂන් සභාවේ දුර්වලතා හා ඌනතා අවම මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය යෝජනා අදාළ නිලධාරීන්ගේ අවධානයට යොමු කිරීමට අවශ්‍ය කටයුතු වර්ෂය තුළදී සිදු කරන ලදි.

1. විගණන හා කළමනාකරණ කමිටුව

2020 වර්ෂයේ දී විගණන හා කළමනාකරණ කමිටුව අවස්ථා දෙකකදී දී රැස්වූ (කොවිඩ් 19 නිසා කමිටු රැස්වීම් සීමා විය) අතර එම අවස්ථාවලදී විගණන හා කළමනාකරණ කමිටුව විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කළමනාකරණ තීරණ කොමිෂන් සභාව වෙත නිර්දේශ කරන ලදී.

i. අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

ii. මූල්‍ය වාර්තා සමාලෝචනය හා ඒ සම්බන්ධ කළමණාකරන තීරණ.

iii. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධ කළමණාකරන තීරණ.

iv. අභ්‍යන්තර විගණනයේ හා විමර්ෂණයන්හි කාර්ය සාධනය.

v. කොමිෂන් සභාවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සමාලෝචන හා කළමණාකරන තීරණය.

vi. විගණකාධිපති වාර්තා සමාලෝචනය.

vii. අනිකුත් මෙහෙයුම් හා පාලන කාර්යයන් සම්බන්ධ විවිධ කළමණාකරණ තීරණ.

මේ අනුව විගණන හා කළමනාකරණ කමිටුව මනා ලෙස ඉහත තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන ලදී.

මෙම කමිටු කාර්යයන් ඉටු කිරීමේදී විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත පරිදී විය.

2020 ජනවාරි මස 01 දින සිට 2020 දෙසැම්බර් 31 දක්වා විගණන හා කළමනාකරණ කමිටුව පහත නම් සඳහන් කොමිෂන් සභා සාමාජිකයන්ගෙන් යුක්ත ව පවත් වන ලදී.

2020 වසරේ විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

- ගීතා විමලවීර මිය - අධ්‍යක්ෂ ජනරාල් (මුදල් අමාත්‍යාංශය) - කමිටු සභාපති
- එම්.පී.කේ.එම්. ප්‍රනාන්දු මයා - කමිටු සාමාජික
- තරංග නලින් ගම්ලත් මයා - සභාපති - කමිටු සාමාජික
  (ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව)
- එල්.ඒ.පී.එස් ගුණසේකර මිය - විගණන අධිකාරී - නිරීක්ෂක
  (රාජ්‍ය විගණන දෙපාර්තමේන්තුව)
- එස්.සී. ජගත් මයා - ප්‍රධාන අභ්‍යන්තර විගණක - නිරීක්ෂක
  (නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ
  හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය)
- රවීන්ද්‍ර සමරවීර - අභ්‍යන්තර විගණක - කැඳවුම්කරු
  (තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව)

4.8 නීති කටයුතු

පනත සංශෝධනය කිරීමේ ප්‍රගතිය

1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත 1999 අංක 50 දරණ (සංශෝධන) පනත මඟින් සංශෝධන වී ඇත. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන ආයතන ලියාපදිංචි කිරීම විධිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන පනතට අන්තර්ගත කිරීමේ වැදගත්කම හඳුනාගැනීමෙන් පසු අඳාළ පනත තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරන ලදී.

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මෙන්ම ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියද 1990 අංක 20 දරණ පනත තුළින්ම පිහිටුවා ඇති හෙයින් එම දෙපාර්ශවයන්ගේම සහභාගිත්වයෙන් අදාළ සාකච්ඡා පැවැත්වීමට කටයුතු කරන ලදී.ඒ අනුව අමාත්‍යාංශයේ මුලිකත්වයෙන් සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලද අතර තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංශෝධිත කෙටුම්පත් සාකච්ඡා කරන ලදී. මේ හා සමගාමිව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් කෙටුම්පතක් ඉදිරිපත් වී නොමැති අතර එම කෙටුම්පතෙහි අවශ්‍යතාවය ද එහිදී සාකච්ඡා විය.ඒ අනුව අමාත්‍යාංශයේ මුලිකත්වයෙන් ආයතන දෙකෙහිම කෙටුම්පත් එක්ව සියළුම පාර්ශවයන්ගේ (අමාත්‍යාංශයේ, TVEC සහ NAITA) සහභාගිත්වයෙන් TVEC සහ NAITA කෙටුම්පත් එක්ව සාකච්ඡා කිරීම සඳහා කටයුතු කරනු ඇත.

අවසන් කළ නඩු කටයුතු

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය යටතේ පවත්වාගෙන යනු ලබන කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය අතර පැවති Writ 94/2019 පැවති නඩුවේ හි අදාළ ආයතනයන් හා ශිෂ්‍යයන් අතර පාඨමාලා පැවැත්වීම සහ එහි ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැගී තිබිණි.එම නඩුවෙහි මැදිහත්කරුවකු වශයෙන් ක්‍රියා කරමින් තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ විශේෂිත කාර්යභාර්යක් වන නියාමන කාර්යය ඉටු කිරීම සඳහා කටයුතු කරනු ලැබිණි. ඒ අනුව පාර්ශවයන් අතර ගැටුමකින් තොරව නඩු කටයුත්ත සමතයකට පත් කිරීම සඳහා කොමිෂන් සභාව වශයෙන් ක්‍රියා කරන ලදී.

තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ආයතන වල පාඨමාලා ප්‍රතිනය සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීමේ ක්‍රියාවලිය යටතේ එකී ආධාර ලබාගත් පාර්ශවයක් වූ HICMA කාර්මික අධ්‍යාපන ආයතනයට එරෙහිව පනවා තිබූ DMR2675/2019 නඩු කටයුතු මඟින් අදාළ මුදල එම ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබිණි.

ලියාපදිංචි නොවූ තෘතීයික හා වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචි කිරීමට ගන්නා ලද පියවර

කොමිෂන් සභාවේ ලියාපදිංචි වීමෙන් තොරව පවත්වා ගෙන යනු ලබන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන ආයතන ලියාපදිංචි කර කොමිෂන් සභාවේ නීත්‍යානුකූල අවසරය යටතේ පවත්වාගෙන යාමට අවශ්‍ය පියවරයන් ගනු ලැබිණ.

ඒ අනුව පුවත්පත් දැන්වීම් පලකරමින් ලියාපදිංචි නොකර පවත්වා ගෙන යනු ලබන ආයතන වෙත දැනුවත් කිරීමේ ලිපි යැවීම මඟින් අදාල ආයතන ලියාපදිංචිය සඳහා යොමු කරන ලද අතර මේ වන විට 2020 වසර සඳහා එවැනි ලිපි 50 ක් පමණ යවා ඇති අතර ආයතන 15 ක් පමණ මේ සඳහා යහපත් ප්‍රතිචාර දක්වා ඇත. එමෙන්ම සියළු මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ආයතන වෙතද ලියාපදිංචි නොකළ වෘත්තීය පුහුණු ආයතනවල වෙළඳ දැන්වීම් සහ වෙනත් තොරතුරු ප්‍රකාශයට පත් කිරීමේදී සත්‍යාපනය කර ඉදිරිපත් කරන ලෙස ලිපි මඟින් දැනුවත් කර ඇත.

කොමිෂන් සභා රැස්වීම පැවැත්වීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නීති) සහ කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් ද කටයුතු කරන අතර 2020 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 09 ක් පවත්වන ලදී.

5.0 සැලසුම් හා පර්යේෂණ අංශය

කොමිෂන් සභාවේ සැලසුම් හා පර්යේෂණ අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පාර්ලිමේන්තු පනතෙහි පළමු අරමුණ වූ, ශ්‍රී ලංකාවේ ආර්ථික හා මානව සම්පත් සංවර්ධන අවශ්‍යතාවන් අනුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම සඳහා සක්‍රීය දායකත්වය ලබාදීමයි. සැලසුම් හා පර්යේෂණ අංශය පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටුකිරීම සඳහා වගකීම දරයි.

- එක් එක් ක්ෂේත්‍ර සඳහා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ සම්බන්ධීකරණ කටයුතු කිරීම
- ශ්‍රී ලංකාවේ පළාත්බද වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ප්‍රතිපත්ති සකස්කිරීම හා යාවත්කාලීන කිරීම
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ පර්යේෂණ අධ්‍යයන ආශ්‍රිත සම්බන්ධීකරණය කටයුතු සිදුකිරීම
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කිරීම හා ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම
- කොමිෂන් සභාවේ මාසික, කාර්තු හා වාර්ෂික ප්‍රගති වාර්ථා සකස්කිරීම හා ඊට අදාළ සමාලෝචනයන් ක්‍රියාත්මක කිරීම

ඉහත කාර්යයන් ඉටුකර ගැනීම සඳහා එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට, සැලසුම් හා පර්යේෂණ අංශය කාර්යමණ්ඩල සාමාජිකයින් 03 දෙනෙකුගෙන් සමන්විත වේ. කාර්ය මණ්ඩලය අතර අධ්‍යක්ෂවරයෙකු, සහකාර අධ්‍යක්ෂවරයෙකු, සංවර්ධන නිලධාරිනියක, ගෙන් සමන්විතය.

ඒ අනුව, සැලසුම් හා පර්යේෂණ අංශය පහත සඳහන් වැඩසටහන් 2020 වසරේදී ක්‍රියාත්මක කර ඇත.

5.1 ජාතික සංවර්ධන සැලැස්ම

සැලසුම් හා පර්යේෂණ අංශය පාර්ලිමේන්තු පනතට අනුව සංවර්ධන සැලසුමක් (Development Plan) සකස්කිරීමට 2019 වර්ෂයේ නියමිතව තිබිණි. මේ සඳහා කණ්ඩායම් 06 කින් යුත් කමිටුවක් පත්කොට තේමා 06 ක් යටතේ අදාළ සැකැස්ම සාර්ථකව අවසාන කරන ලදී. තවද, මෙම ක්‍රියාවලියේදී සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්තිය, තිරසාර සංවර්ධන (Sustainable Development Goals) ඉලක්ක, ජාතික වෘත්තීය පුහුණු ප්‍රතිපත්ති, සහ මහබැංකු වාර්ථා යෝජනා හා ජාතික වෘත්තීය සුදුසුකම් මෙහෙයුම් අත්පොත, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත හා සංශෝධිත පනත් ඉහත සැලසුම් සඳහා මූලාශ්‍ර ලෙස යොදාගන්නා ලදී. මෙම ජාතික සංවර්ධන සැලැස්ම වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයෙහිම සංවර්ධනය සඳහා වැදගත්ම සංකල්පයකි. මෙය වලංගු (Validation) කොට කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ඇති අතර ඉදිරි අවුරුදු 05 දී එය ක්‍රියාත්මක කිරීමට නියමිතය.

සංවර්ධන සැලැස්මේ පිටකවරය



5.2 වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම හා යාවත්කාලීන කිරීම (VET Plan)

සැලසුම් හා පර්යේෂණ අංශය, වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීමෙහි නිරතව සිටී. ඒ අනුව 2020 වර්ෂය තුලදී විදුලි හා ඉලෙක්ට්‍රොනික අංශය සඳහා වූ පුහුණු සැලසුම යාවත්කාලීන කොට සම්පූර්ණ කරන ලදී. ඒ සඳහා ක්‍රියාත්මක කරනලද ක්‍රියාවලිය 5.2.(a) හි සඳහන් වේ. බස්නාහිර පළාත සඳහා වූ පළාත්බද පුහුණු සැලසුම 2013 වර්ෂයේ සංවර්ධනය ආරම්භ කළ නමුත් එය අර්ධ ලෙස අවසන් කිරීම හේතුවෙන් එහි වැඩකටයුතු සම්පූර්ණ කිරීම 2021 වර්ෂයේදී සිදුවනු ඇත.

a) විදුලි හා ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රය සඳහා වූ පුහුණු සැලැස්ම යාවත්කාලීනකොට සකස් කිරීම

වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැසුම් යාවත්කාලීන කිරීමේ වැඩසටහන යටතේ විදුලි හා ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රය සඳහා වූ සැලැස්ම යාවත්කාලීන කිරීම 2020 වර්ෂයේ පළවන කාර්තුවේදී ආරම්භ කරන ලදී. මේ සඳහා අදාළ ඉල්ලීම හා මූල්‍යාධාර සැපයීම අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) සිදු කරන ලදී.

මේ සඳහා බාහිර උපදේශක කණ්ඩායමක සහභාගිත්වය ලබා ගන්නාලදී. මෙම සැලැස්ම සකස් කිරීම සඳහා 2020 වර්ෂය තුලදී රු. මිලියන 1.73 ක් වැයකර ඇති අතර, 2020 වර්ෂයේදී මෙම වාර්ථාව සාර්ථකව අවසන් කොට වලංගු

(validation) කිරීමේ වැඩසටහනක් සිදුකරන ලදී. තවදුරටත් මේ සඳහා අදාළ ක්ෂේත්‍ර නිළධාරීන් ගෙන්වා ඔවුන්ට ඉදිරිපත් කිරීමේ (Launching) වැඩසටහනක් ද සිදුකිරීමට 2021 වර්ෂයේ සැලසුම්කර ඇත. අදාළ වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්ම මුද්‍රණය කොට අදාළ ආයතනයන් සඳහා පිටපත්ද නිකුත් කිරීමට තීරණය කර ඇත.



විදුලි හා ඉලෙක්ට්‍රොනික පුහුණු සැලැස්මේ පිටකවරය



පුහුණු සැලැස්මේ වලංගු කිරීමේ වැඩසටහනේ ඡායාරූපයකි

5.3 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සැලසුම් හා පර්යේෂණ අංශය මගින් පර්යේෂණ කවය පවත්වාගෙන යනු ලබයි (Research Cell). 2005 වර්ෂයේ සිට ආරම්භ කරන ලද පර්යේෂණ කවය මේවන විට කාර්මික හා වෘත්තීය ක්ෂේත්‍රයට වැදගත් පර්යේෂණ රාශියක් එළිදැක්වීම සඳහා මූල්‍යමය හා ශ්‍රම දායකත්වය ලබාදී ඇත. එමෙන්ම නිමකරන ලද පර්යේෂණ කොමිෂන් සභා වෙබ් අඩවිය තුල පරිශීලනය සඳහා ඇතුලත්කර ඇත. 2020 වර්ෂයේදී පර්යේෂණ කවය මගින් ඉදිරිපත් කරනලද කාර්යයන් 5.4 වගුවෙහි සඳහන් කොට ඇත..

5.3.1 නව පර්යේෂණ අධ්‍යයන

2020 වර්ෂය තුලදී, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට අයත් පුහුණු ආයතන තුලින් පර්යේෂණ යෝජනා මෙන්ම, කෙටි ව්‍යාපෘති සඳහාද යෝජනා කැඳවන ලදී. පර්යේෂණ සිදුකලද මේ දක්වා සිදුකර ඇති පර්යේෂණයන්හි සඳහන් යෝජනා හා ඉදිරි වැඩපිළිවෙල ක්‍රියාත්මක කරවීමේ අඩුපාඩු හඳුනාගත් බැවින්, 2020 වර්ෂයේදී පර්යේෂණ වලට අමතරව කෙටි ව්‍යාපෘති සඳහා ද ඉඩ ප්‍රස්ථාව සලසා දෙන ලදී. මෙමගින් කෙටි ව්‍යාපෘති අවසානයේ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ගැටලු සහ දියුණුවීම් කෙටිකලකින් ලඟා කර ගැනීම මෙහි අරමුණව ඇත. ඒ අනුව, විවිධ ආයතන නියෝජනය කරමින් පර්යේෂණ යෝජනා 11 ක්ද හා කෙටි ව්‍යාපෘති 02 ක් ද පර්යේෂණ කවය වෙත ලැබුණි.



ඉන් 2020 වර්ෂයේ සඳහා පර්යේෂණ 04 ක් සහ කෙටි ව්‍යාපෘති 01 ක් ක්‍රියාත්මක කිරීමට තෝරාගන්නා ලදී. එම යෝජනා පර්යේෂණ මෙහෙයුම් කමිටුව (Research Steering Committee) විසින් ඇගයීමට ලක් කිරීමෙන් පසුව ක්ෂේත්‍රයට අයත් උචිත, කාලීන පර්යේෂණ අධ්‍යයන 04 ක් හා කුඩා ව්‍යාපෘති 01 සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගන්නා ලදී. එම පර්යේෂණ අධ්‍යයනවල ගුණාත්මකභාවය රැකගැනීම සඳහා පර්යේෂණ කටයුතු මෙහෙයවීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පර්යේෂණ කවය සහ පර්යේෂණ කමිටුව විසින් සිදුකරන ලදී. ඒ සඳහා රු. මිලියන 2.0 ක මූල්‍ය අනුග්‍රහය ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් දරන ලදී. එක් එක් පර්යේෂණ අධ්‍යයනයන් සඳහා වෙන්කරන ලද වියදම් පහත වගු අංක 5.4 මගින් දැක්වේ.

නව දුරටත් 2019 වර්ෂයේ නිමකරන ලද පර්යේෂණ සම්පූර්ණයෙන්ම අවසන් කොට එකී පර්යේෂණයන්හි සාරාංශ එකතුකොට පොත් පිංචක් (Booklet) සකස්කොට බෙදා හරින ලදි.

වගුව 5.4: ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් මූල්‍ය අනුග්‍රහය දක්වන පර්යේෂණ අධ්‍යයනයන් 2020

අංකය	පර්යේෂණ මාතෘකාව	පර්යේෂණයේ අරමුණු	පර්යේෂණ කණ්ඩායම	අනුමත කරන ලද මුදල (රු.)	2020 වර්ෂයේ දී වැයවූ මුදල (රු.)
1.	කුරුණෑගල දිස්ත්‍රික්කයේ වෘත්තීය පුහුණු අධිකාරියේ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සඳහා නවීන ප්ංගම දුරකථන වල බලපෑම පිළිබඳ අධ්‍යයනය	කුරුණෑගල දිස්ත්‍රික්කයේ වෘත්තීය පුහුණු අධිකාරියේ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සඳහා නවීන ප්ංගම දුරකථන වල බලපෑම පිළිබඳ අධ්‍යයනය. අරමුණු වන්නේ, ● වෘත්තීය පුහුණු අධ්‍යාපනය ලබන සිසුන් තම අධ්‍යාපන කටයුතු සඳහා ස්මාර්ට් ප්ංගම දුරකථන කොපමණ දුරකට භාවිතා කරනවාද යන්න හඳුනා ගැනීම. ● ස්මාර්ට් ප්ංගම දුරකථන භාවිතය නිසා ඇතිවන වෘත්තීය අධ්‍යාපනය ලබන සිසුන්ගේ ගැටළු හඳුනා ගැනීම. ● ස්මාර්ට් ප්ංගම දුරකථන භාවිතය නිසා ඇතිවන ගැටළු සඳහා නිර්දේශ හඳුනා ගැනීම. ● වෘත්තීය පුහුණු අධ්‍යාපනය හරහා ප්ංගම දුරකථන ඵලදායී ලෙස භාවිතා කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම.	වෘත්තීය පුහුණු අධිකාරිය	205,000.00	61,500.00

අනු අංකය	පර්යේෂණ මාතෘකාව	පර්යේෂණයේ අරමුණු	පර්යේෂණ කණ්ඩායම	අනුමත කරන ලද මුදල (රු.)	2020 වර්ෂයේ දී වැයවූ මුදල (රු.)
2.	තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය සඳහා මෘදු කුසලතා වල බලපෑම විශ්ලේෂණය කිරීම	• සේවා නියුක්තිය සඳහා වඩාත් අදාළ මෘදු කුසලතා අංග හඳුනා ගැනීම. • මෘදු කුසලතා අංග සහ සේවා නියුක්තිය අතර සම්බන්ධතාවය විශ්ලේෂණය කිරීම • සේවා නියුක්තිය සඳහා මෘදු කුසලතා අංගයන්ගේ බලපෑම සොයා ගැනීම. • උපාධිය, ඩිප්ලෝමාව සඳහා අවශ්‍ය මෘදු කුසලතාවන්හි සැලකිය යුතු වෙනසක් තිබේදැයි සොයා බැලීම	සාගර විශ්ව විද්‍යාලය	259,700.00	77,700.00
3.	ශ්‍රී ලාංකික වටපිටාව සැලකිල්ලට ගනිමින් සමුද්‍රීය ලොජිස්ටික් කළමණාකරණය පිළිඳ වෘත්තීය පුහුණුව ලබා ගැනීමේ වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක්	සමුද්‍රීය පුහුණුව හා ධීවර ක්ෂේත්‍රයේ කාන්තාවන්ට වෘත්තීය අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් සඳහා ප්‍රවේශ වීමට සහ සහභාගී වීමට බලපාන සාධක සමාලෝචනය. • පුහුණුව සහ අධ්‍යාපනය සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය වැඩි දියුණු කිරීම • පසුගිය වසර 10 තුළ සමත් වූ පිරිමි සහ ගැහැණු ළමයින්ගේ රැකියා තත්ත්වය සොයා ගැනීම • ධීවර හා නාවික අංශවලට අදාළ වෘත්තීය අධ්‍යාපනයට කාන්තාවන්ගේ වැඩි සහභාගිත්වය සඳහා නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීම	සාගර විශ්ව විද්‍යාලය	83,000.00	24,900.00

අනු අංකය	පර්යේෂණ මාතෘකාව	පර්යේෂණයේ අරමුණු	පර්යේෂණ කණ්ඩායම	අනුමත කරන ලද මුදල (රු.)	2020 වර්ෂයේ දී වැයවූ මුදල (රු.)
4.	අවසාන ඇගයීම සහ ශක්‍ය විසඳුම සඳහා පුහුණුවන්නන්ගේ සහභාගීත්වය පිළිබඳ වැදගත් වන තීරණාත්මක සාධක පිළිබඳ අධ්‍යයනය	• පුහුණුවන්නන්ට සාධාරණ සාධකවල බලපෑම විමර්ශනය කිරීම සඳහා VTA හි ගොඩනැගිලි හා ඉදිකිරීම් ආශ්‍රිත පාඨමාලා පිළිබඳ අවසාන තක්සේරුවට සහභාගී වීමට හැකි වීම. • පුහුණුවන්නන් සඳහා ප්‍රායෝගික සාධකවල බලපෑම හඳුනා ගැනීම • පුහුණුවන්නන් සඳහා අභිප්‍රේරණ සාධකවල බලපෑම හඳුනා ගැනීම	වෘත්තීය පුහුණු අධිකාරිය	200,000.00	60,000.00
කෙටි ව්‍යාපෘති					
5.	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ උපදේශකවරුන්ගේ කාර්ය සාධනය ඇගයීමේ පද්ධතියක් මගින් හඳුනා ගැනීමේ ව්‍යාපෘතිය	• වෘත්තීය පුහුණු අධිකාරියෙහි ගුරුවරුන් /උපදේශකයින් අතර තරඟකාරී වතාවරණයක් ඇති කිරීම • වෘත්තීය පුහුණු අධිකාරියෙහි ගුරුවරුන් /උපදේශකයින් සඳහා ඵලදායී කාර්යසාධන ඇගයීම් ක්‍රමයක් හඳුන්වා දීම • රටතුළ හෝ ජාත්‍යන්තරව යම් යම් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීමේදී මෙම ක්‍රමය හරහා අපක්ෂපාතී ක්‍රමයක් හඳුනාගත හැකි වීම.	වෘත්තීය පුහුණු අධිකාරිය	150,000.00	45,000.00
මුළු එකතුව				**897,000.00**	**269,100.00**

2020 වර්ෂයේදී ආරම්භකල පර්යේෂණ අධ්‍යයන සඳහා රු. මිලියන 2 ක මුදලක් නිපුණතා සංවර්ධන අරමුදලෙන් ප්‍රතිපාදන ලෙස ලැබුණු අතර, 2020 වර්ෂයේදී එම අනුමත ප්‍රතිපාදන වලින් 50% ක ප්‍රතිශතයක් වැයකිරීමට හැකියාව ලැබුණි. ඉතිරි මුදල පර්යේෂණ අධ්‍යයන නිමකිරීමෙන් අනතුරුව 2021 වර්ෂයේදී ගෙවා නිමකිරීමට නියමිතය.

5.3.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම - 2020 (AIP 2020)

සැලසුම් හා පර්යේෂණ අංශය විසින් 2020 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කොට එකී සැලැස්ම සියලු අංශ සමඟ සාකච්ඡාවට ලක්කර ඒ සඳහා කොමිෂන් සභා අනුමැතිය ලබා ගෙන ඇත. තව දුරටත් 2021 වර්ෂය සඳහාද ඉහත ආකාරයට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කොට කොමිෂන්සභා අනුමැතිය ලබා ගන්නා ලදි.

මෙම සැලැස්මට අනුව සැකසුනු ප්‍රගතිය ඇතුළත් මාසික හා ත්‍රෛමාසික වාර්ථා නියමිත කාලයට අමාත්‍යාංශයේ සමාලෝචනයට යොමු කරනු ඇත.

5.3.3 ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් සඳහා පඩිපාලක නිර්ණායක සැකසීම

මේ යටතේ 2020 වර්ෂයේදී ශ්‍රමවෙළඳපොල තොරතුරු මහබැංකු වාර්තා දැනට සංවර්ධිත වෘත්තීය පුහුණු සැලැසුම් හා පඩි සැකසීම් සම්බන්ධ වෙබ් අඩවි අධ්‍යයනය කොට ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් සඳහා පඩි නිර්ණායකයක් සකසා නියෝජ්‍ය කම්කරු කොමසාරිස් හා එහි සාමාජිකයන් හා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව එකතුව සැකසුනු වාර්තාව කම්කරු කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය සඳහා ලබා දී ඇත මෙහි මූලික අධ්‍යරයේ රැස්වීම් 05 ක් පවත්වා ඇත.

6.0 පාඨමාලා ලියාපදිංචි, පිළිගැනීම් හා තත්ත්ව කළමනාකරණ පද්ධති අංශය

1990, අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතට අනුව සහ වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය උදෙසා වූ සංවර්ධන සැලැස්මට අනුව, (1995 සැප්තැම්බර් 05 දින අංක 887/8 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් සියළු වෘත්තීය පුහුණු ආයතන සඳහා පහත පරිදි අදියර 4කින් යුතු තත්ත්ව ආරක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබයි.

1. වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය
2. පාඨමාලා ප්‍රතිනය
3. තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම
4. තත්ත්ව වැඩි දියුණු කිරීමේ පද්ධතිය ස්ථාපනය කිරීම (QIS)

ඉහත කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අංශයේ නිලධාරීන් 12 දෙනෙකුගේ සංයුක්තියකින් සමන්විත අතර, අධ්‍යක්ෂවරයකු, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් 02, සහකාර අධ්‍යක්ෂවරු 02,වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරීන් 02, සංවර්ධන නිලධාරීන් 02, කළමනාකරණ සහකාරවරුන් 02 සහ කාර්යාල කාර්යය සහායකයෙකු මීට ඇතුලත් විය.

6.1. වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය

වෘත්තීය පුහුණුව සපයන පුහුණු ආයතන මෙම කොමිෂන් සභාව යටතේ ආයතන ලියාපදිංචිය ලබා ගැනීම නෛතික අවශ්‍යතාවකි. ඒ අනුව දිවයින තුල ක්‍රියාත්මකවන සියළු වෘත්තීය පුහුණු ආයතන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි විය යුතුය. ඉහත සඳහන් කරන ලද පනතට අනුව ලියාපදිංචිය සඳහා ඇගයීමේදී ආයතනයන්හි යටිතල පහසුකම්හි ප්‍රමාණවත් බව, පුහුණු උපකරණ සහ ඒවායේ ප්‍රමාණාත්මක බව උපදේශකයන්ගේ සුදුසුකම්, පුහුණුව ලබාදීමේ ක්‍රමවේදය, විෂය මාලාවන්හි ප්‍රමාණවත්බව ආදී නිර්ණායක පිළිබඳ විමර්ශණය කර ඒ අනුව අදාළ නිර්ණායක සපුරන්නේ නම් වර්ෂ දෙකක කාලයකට කොමිෂන් සභාව එම ආයතන සඳහා ලියාපදිංචිය ලබාදේ. 2020 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කොමිෂන් සභාව 730 ආයතන ප්‍රමාණයක් ලියාපදිංචිය සඳහා ඇගයීම් කිරීම ඉලක්ක ගත කර ඇති අතර Covid 19 ආපදා තත්ත්වය යටතේ වුවද ආයතන 772 ප්‍රමාණයක් ඇගයීමට ලක්කිරීමට හැකි වී ඇත.

පුහුණු ආයතන ලියාපදිංචිය සඳහා ඇගයීම් කිරීම් (නව සහ යාවත්කාලීන) වර්ගීකරණයට අනුව සංඛ්‍යා පහත වගුවෙහි දක්වා ඇත.

ආයතන වර්ගය	ආයතන ප්‍රමාණය		එකතුව
	නව ලියාපදිංචි කිරීම්	ලියාපදිංචිය යාවත්කාලීන කිරීම්	
(ඉලක්කගත) ඇගයීම් ප්‍රමාණය	250	480	730
අයදුම්පත් ලද සංඛ්‍යාව	257	490	747
ඇගයීම් කල ප්‍රමාණය	319	453	772

2020 වර්ෂයේ පුහුණු ආයතන ලියාපදිංචි කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලද පුහුණු ආයතන එහි හිමිකාරිත්වය අනුව පහත දක්වා ඇත.

ආයතන වර්ගය හිමිකාරිත්වය	ලියාපදිංචි කල ප්‍රමාණය නව*	ලියාපදිංචි කල ප්‍රමාණය (යාවත්කාලීන කිරීම්)
රාජ්‍ය ආයතන	05	80
ව්‍යවස්ථාපිත හෝ සංස්ථා, මණ්ඩල	25	83
පුද්ගලික	149	207
එකතුව	**179**	**370**

2020 වර්ෂයේ අවසානයේ වෘත්තිය පුහුණු ආයතන 1239 ක් ලියාපදිංචිය වලංගු තත්වයේ පවතින ලද අතර පුහුණු ආයතන හිමිකාරිත්වය අනුව පහත දක්වා ඇති පරිදි වේ.

ආයතන වර්ගය හිමිකාරිත්වය	ලියාපදිංචි වලංගු ප්‍රමාණය
රාජ්‍ය ආයතන / ව්‍යවස්ථාපිත සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල	570
පෞද්ගලික / රාජ්‍ය නොවන ආයතන	669

පුහුණු මධ්‍යස්ථාන ලියාපදිංචි ඇගයීම් කටයුතු සඳහා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පලපුරුදු නිලධාරීන්ගේ සේවය ලබාදෙනු ලැබේ. නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනියුක්ත කර ඇති නිපුණතා සංවර්ධන නිලධාරීන් 46 දෙනෙකු ඉහත ඇගයීම්කිරීමට සම්බන්ධව පුහුණුව ලබාදී ඔවුන්ගේ සෙවය ලබාගැනීමට කටයුතු කර ඇත. 2020 වර්ෂය තුල එම නිළධාරීන් සඳහා සාර්ථක පුහුණු වැඩ මුළුවක් පැවැත්වීමට ද හැකි විය.

ලියාපදිංචිය ලත් වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය තහවුරු කිරීමේ ලිපි නිකුත් කිරීම

වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන මගින් පුහුණුව ලබන ලද සහතිකපත්‍රලාභීන් විදේශගතවීම් සඳහා අදාල පුහුණු ආයතනයන්හි ලියාපදිංචිය තහවුරු කිරීමේ ලිපි විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත නිකුත් කිරීම මෙම අංශය සිදු කරනු ලැබේ. එවැනි ලිපි 415ක් 2020 වසර තුල විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත නිකුත් කර ඇත.

6.2 NVQ සහතික ලබා දීම සඳහා පාඨමාලා ප්‍රතීතනය

ජාතික වෘත්තිය සුදුසුකම් රාමුව 2004 වර්ෂයේ හඳුන්වා දෙන ලදී. යම් වෘත්තීයන් සඳහා NVQ සුදුසුකම් ප්‍රදානය කිරීම සඳහා ජාතික නිපුණතා සම්මතයන් සංවර්ධනය කර තිබිය යුතුය. එම නිපුණතා සම්මත අනුව ජාතික විෂය මාලාවන් සකස් කරන අතර ඒ අනුව නිපුණතා පාදක ක්‍රමය යටතේ පුහුණු කටයුතු සිදු කරන පාඨමාලාවන් ප්‍රතීතනය කිරීම මෙම කොමිෂන් සභාව මඟින් සිදු කරනු ලැබේ. 2020 වර්ෂය තුල සිදු කරන ලද පාඨමාලා ප්‍රතීතනය ඇගයීම් ප්‍රමාණය පහත වගුවේ සඳහන් පරිදි වේ. ප්‍රතීතනය ලබා ඇති පාඨමාලා හරහා පුහුණුවක් ලබන පුහුණුවන්නන් අවසන් ඇගයීම මෙම කොමිෂන් සභාව මඟින් සිදු කරන අතර එහි ප්‍රතිඵල අනුව NVQ සුදුසුකම් ප්‍රදානය කරනු ලැබේ.

ආයතන වර්ගය	පාඨමාලා ප්‍රතීතන ඇගයීම් ප්‍රමාණය		එකතුව
	නව	යාවත්කාලීන	
ඉලක්ක ගත ඇගයීම් ප්‍රමාණය	300	400	700
අයදුම් පත්‍ර ලද ප්‍රමාණය	524	572	1096
ප්‍රතීතන ඇගයීම් සිදු කල ප්‍රමාණය	604	623	1227

2020 වර්ෂය තුල මෙම කොමිෂන් සභාව මඟින් ප්‍රතීතනය කරන ලද මුළු පාඨමාලා සංඛ්‍යාව 982 වන අතර හිමිකාරිත්වය අනුව එය පහත දක්වා ඇති වගුවේ පරිදි වේ.

ආයතන හිමිකාරිත්වය	පාඨමාලා ප්‍රතීතන සංඛ්‍යාව (නව)	පාඨමාලා ප්‍රතීතන සංඛ්‍යාව (යාවත්කාලීන)
රාජ්‍ය ආයතන	326	339
ව්‍යවස්ථාපිත හෝ සංස්ථා මණ්ඩල	78	35
පෞද්ගලික	141	63

6.3 වෘත්තීය පුහුණු ආයතන තුල තත්ත්ව කළමණාකරන පද්ධතිය (QMS) ස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය සහ සහතිකකරණය

වෘත්තිය පුහුණු ආයතන තුල තත්ත්ව කළමණාකරණ පද්ධති ස්ථාපනය කිරීම සඳහා බාහිර තත්ත්ව විගණනය කිරීම මෙම සභාව මඟින් සිදු කරනු ලැබේ. 2020 වර්ෂයේදී සැලසුම් කරන ලද බාහිර තත්ත්ව පාලන විගණනයන් සංඛ්‍යාව 60 වන අතර එමඟින් විගණනයන් 36ක සංඛ්‍යාවක් කර ඇත. 2020 වර්ෂයේදී පුහුණු ආයතන 19 ක නව තත්ත්ව පද්ධති ස්ථාපනය කරන ලද අතර ආයතන 19ක තත්ත්ව පද්ධති යාවත්කාලීන කරන ලදී. පහත දක්වා ඇති පුහුණු ආයතන තත්ත්ව කළමණාකරණය ස්ථාපනය සඳහා සහතිකකරණය ලබා දීම සිදු කරන ලදී.

නව කළමණාකරන පද්ධති ස්ථාපනය කිරීම

1. යුනයිටඩ් ට්‍රැක්ටර් සහ ඉක්විප්මන්ට් සමාගම - වත්තල
2. ජාතික තරුණ සේවා සභාව - රිකිල්ලගස්කඩ
3. ජාතික තරුණ සේවා සභාව - පොල්ගොල්ල
4. වෘත්තීය පුහුණු අධිකාරිය - ගොතටුව
5. වෘත්තීය පුහුණු අධිකාරිය - රාජගිරිය
6. වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය සඳහා ජාතික ආයතනය - කොළඹ 05
7. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය - කොළඹ 05
8. ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය - මීගමුව
9. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය - ඇල්පිටිය ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය
10. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය - බද්දේගම
11. වෘත්තීය පුහුණු අධිකාරිය - පොල්ගහවෙල
12. ශ්‍රී ලංකා සත්ව පාලන විද්‍යාලය - කුණ්ඩසාලේ
13. ශ්‍රී ලංකා තරුණ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - දෙහිවල
14. APSS ඉන්ටනැෂනල් නෙට්වර්ක් ප්‍රයිවට් ලිමිටඩ් - කොළඹ 06
15. නිල භාෂා හා වෘත්තීය අධ්‍යාපන පුද්ගලික ආයතනය - බත්තරමුල්ල
16. වෘත්තීය පුහුණු අධිකාරිය - කඳුරුවෙල
17. ඩිල්මා සැලුන් සහ රූපලාවන්‍ය පුහුණු මධ්‍යස්ථානය - අංගොඩ
18. වෘත්තීය පුහුණු අධිකාරිය - සීතාවක
19. ජාතික අධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය - තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන ආයතනය මහනුවර

කළමණාකරණ පද්ධති යාවත්කාලීන කිරීම

1. විශ්ව විද්‍යාල විද්‍යාතනය - කුලියාපිටිය
2. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මහනුවර
3. කෘෂිකර්ම විද්‍යාලය - වවුනියාව
4. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වේයන්ගොඩ
5. ඉංජිනේරු කර්මාන්ත අභ්‍යාස ආයතනය - කටුබැද්ද
6. ටෙක්සාස් නැෂනල් මොන්ටිසෝරි ඇන්ඩ් ටීචර් ට්‍රේනින් සෙන්ටර් - නාරාහෙන්පිට
7. කෘෂිකර්ම විද්‍යාලය - ලබුදූව
8. කාර්මික විද්‍යාලය - මාතර
9. කාර්මික විද්‍යාලය - බණ්ඩාරවෙල
10. ලලිත් ඇතුලත්මුදලි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - රත්මලාන
11. කාර්මික විද්‍යාලය - මඩකළපුව
12. ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - කුණ්ඩසාලේ
13. විශ්ව විද්‍යාල විද්‍යාතනය - යාපනය
14. කාර්මික විද්‍යාලය - කෑගල්ල
15. කාර්මික විද්‍යාලය - ගම්පහ
16. ඩොන් බොස්කෝ කාර්මික මධ්‍යස්ථානය - මීගමුව
17. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මින්නේරිය
18. කෘෂිකර්ම විද්‍යාලය - බිබිල
19. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - අනුරාධපුරය

මීට අමතරව පුහුණු මධ්‍යස්ථාන තුල තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා එක්දින වැඩසටහන් 03 ක් පවත්වා ඇත. මේ සඳහා වෘත්තීය පුහුණු ආයතනයන්හි නිලධාරීන් 120ක ආසන්න ප්‍රමාණයක් සහභාගී වී ඇත.

2019 වර්ෂයේදී නිලධාරීන් 04 දෙනෙකු ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශයේ විගණනක සුදුසුකම් ලබා ඇත. දැනට වෘත්තීය විගණනකවරුන්ගේ අවශ්‍යතාවයක් පවතින අතර, ඒ අනුව විගණන සංසදයේ විගණකවරු 35 දෙනෙකු සක්‍රීය සේවයේ සිටී. ඒ සඳහා තවත් නිලධාරීන් පුහුණු කිරීමට නියමිතය.

6.4 තත්ත්ව වැඩි දියුණු කිරීමේ පද්ධතිය (QIS) පද්ධතිය ස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය සහ සහතිකකරණය

2016 තත්ත්ව වැඩි දියුණු කිරීමේ පද්ධතිය (Quality Improvement System) නමින් නව ප්‍රවේශයක් TVEC විසින් නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ මූල්‍ය හා තාක්ෂණික සහය ඇතිව හඳුන්වා දෙන ලදී. 2020 වර්ෂය තුල ආයතන 90 වැඩි සංඛ්‍යාවක් සඳහා QIS සහතික නිකුත් කොට ඇති අතර මේ දක්වා ආයතන 232ක් සඳහා IQS පද්ධතිය ස්ථාපනය කර ඇත.

6.5 ආදායම් උපයා ගැනීම්

2020 වර්ෂය තුල කොමිෂන් සභාව ආයතන ලියාපදිංචිය පාඨමාලා ප්‍රතීතනය සහ අදාල කටයුතු තුලින් උපයා ඇති මුදල පහත අයුරුවේ.

පුහුණු මධ්‍යස්ථාන ලියාපදිංචි ගාස්තු ආදායම	-	රු.	2,517,800.00
ප්‍රතීතන ගාස්තු ආදායම	-	රු.	1.522.900.00
ශිෂ්‍ය වාර්තා පොත් විකිණීමෙන් (Student Record books) (ශුද්ධ)	-	රු.	981,187.00
තත්ත්ව කළමනාකරණ (QMS) සහතික පත්‍ර නිකුත් කිරීම	-	රු.	741,600.00
පුහුණු ආයතන ලියාපදිංචි තහවුරු කිරීමේ ලිපි	-	රු.	415.000.00
එකතුව.	**-**	**රු.**	**6,178,487.00**

මෙම ආදායමද සැලකිල්ලට ගනිමින් වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිලියෙල කෙරේ.

7.0 ජාතික නිපුණතා සම්මත, විෂය මාලා සහ ජාතික වෘත්තීය සුදුකම් අංශය

7.1 ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීන්ට අදාලව ජාතික නිපුණතා සම්මතයන් සහ නිපුණතා පාදක විෂය මාලාවන් සකස් කිරීම ප්‍රධාන අවශ්‍යතාවයකි. ඒ අනුව 2020 වසරේ දී පහත සඳහන් නව ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කරන ලදුව ඒවා බලලත් කරන ලදි.

7.1.1 කර්මාන්ත ක්ෂේත්‍ර සහා මගින් යෝජනා වූ උපදෙස් මත සකස් කරන ලද නව ජාතික නිපුණතා සම්මත සහ විෂය මාලාවන් 39ක් පහත සඳහන් වේ.

- පුහුණුකරු (ක්‍රීඩා) 4 වන මට්ටම
- රියදුරු 3 වන මට්ටම
- ක්‍රීඩා පුහුණුකරු (ශාරීරික යෝග්‍යතාව) 4 වන මට්ටම
- නාවික වෑද්දුම්කරු 4 වන මට්ටම
- යන්ත්‍ර ක්‍රියාකරු (සහල් මෝල්) 4 වන මට්ටම
- මාතෘ හා ළදරු සත්කාර සපයන්නා 4 වන මට්ටම
- පිරිස් සාමාජික (පීසා) 4 වන මට්ටම
- පරිගණක දෘඩාංග හා ජාලකරණ ශිල්පී 4 වන මට්ටම
- එම්බාම්කරු 4 වන මට්ටම
- රියදුරු සහායක 2 වන මට්ටම
- විදුලි කාර්මික සහකාර 2 වන මට්ටම
- සෞඛ්‍යය රැකවරණ හා සත්කාරක සහායක 2 වන මට්ටම
- ක්‍රීඩා, යෝග්‍යතා හා ජලජ මධ්‍යස්ථාන සහකාර 2 වන මට්ටම
- ප්‍රවාහන උදව්කරු 2 වන මට්ටම
- ඇඳුම් සකසන්නා (Outfit Maker) 2 වන මට්ටම
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සහකාර 2 වන මට්ටම
- සන්නිවේදන සහායක 2 වන මට්ටම
- වාහන ලිහිසි සේවාකරු 2/3 වන මට්ටම
- ප්‍රජා සෞඛ්‍යය සහායක 2/3 වන මට්ටම
- සහායක බංගලා භාරකරු 3 වන මට්ටම
- ආපදා අවදානම් අවම කිරීමේ සහකාර 3 වන මට්ටම
- මත්ද්‍රව්‍ය නිවාරණ සහායක 3 වන මට්ටම

• මාළු ඇල්ලීමේ මෙවලම් අළුත්වැඩියා කිරීමේ සහායක	3 වන මට්ටම
• පශු සම්පත් සහායක	3 වන මට්ටම
• පරිසර සුරැකුම් සහකාර	3 වන මට්ටම
• සත්ත්ව භාරකරු	3/4 වන මට්ටම
• හස්ති පාලක	3/4 වන මට්ටම
• ප්‍රවාහන සහායක	3 වන මට්ටම
• මින් මැදුරු භාරකරු	3/4 වන මට්ටම
• Automative Detailer වාහන රැඳවුම්කරු	4 වන මට්ටම
• නර්තන ශිල්පී	3/4 වන මට්ටම
• කඩදාසි ප්‍රතිචක්‍රීකරණ තාක්ෂණික ශිල්පී (ආබාධිත පුද්ගලයින් සඳහා)	3/4 වන මට්ටම
• Computer Numerrically Controlled Manufacturing Technology	5 වන මට්ටම
• දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම	5 වන මට්ටම
• ඖෂධ නිෂ්පාදන තාක්ෂණය	5 වන මට්ටම
• වැවිලි ව්‍යාප්ති කළමනාකරණය	5 වන මට්ටම
• රෙදිපිළි තාක්ෂණය සහ කළමනාකරණය	5 වන මට්ටම
• තරල බල තාක්ෂණය (හයිඩ්‍රොලික් සහ නියුමැටික්)	5 වන මට්ටම
• ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණය	5/6 වන මට්ටම

7.1.2 නව ජාතික නිපුණතා සම්මතය පමණක් සකස් කරන ලද වෘත්තීන් පහත සඳහන් වේ.

• රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන තාක්ෂණය	5 වන මට්ටම

7.1.3 නව විෂය මාලා පමණක් සකස් කරන ලද වෘත්තීන් පහත සඳහන් වේ.

• සාගර ආහාර තාක්ෂණය	5/6 වන මට්ටම

7.2 පහත සඳහන් ජාතික නිපුණතා සම්මත හා විෂයමාලා යාවත්කාලීන කිරීමෙන් අනතුරුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා බලාත්මක කරන ලදී.

7.2.1 යාවත්කාලීන කරන ලද නිපුණතා සම්මත සහ විෂය මාලා 26ක් පහත සඳහන් වේ.

• මෝටර් රථ වෑද්දුම් ශිල්පී	3/4 වන මට්ටම
• පිළිගැනීමේ නිලධාරී	4 වන මට්ටම
• සැපයුම් ක්‍රියාකාරකම් (ගබඩා පාලක)	3/4 වන මට්ටම
• ප්‍රථමාධාරකරු	4 වන මට්ටම
• පළතුරු හා එළවළු පැසුරුම් ශිල්පී	3/4 වන මට්ටම
• රසායනාගාර සහායක	3/4 වන මට්ටම
• විදුලි සෝපාන කාර්මික ශිල්පී	3/4 වන මට්ටම
• කාර්මික ඉලෙක්ට්‍රොනික ශිල්පී	3/4 වන මට්ටම
• රූපලාවන්‍ය ශිල්පී	2 වන මට්ටම
• පාරිභෝගික සේවා සහායක (බනිජ තෙල්)	2 වන මට්ටම
• ගෘහස්ථ නිවෙස් පාලන සහකාර	2/3 වන මට්ටම
• ක්ෂේත්‍ර සහකාර (කෘෂිකර්මය)	3 වන මට්ටම
• සුපිරි වෙළඳසැල් පාරිභෝගික සේවා සහකාර	2 වන මට්ටම
• පෙදරේරු කාර්මික ශිල්පී	2 වන මට්ටම
• ජලනල සහායක	2 වන මට්ටම
• භෝජනාගාර සේවක/ ස්ටුවඩ්	2 වන මට්ටම
• රූපලාවන්‍ය ශිල්පී	3/4 වන මට්ටම
• බේකරි ශිල්පී (පේස්ට්‍රි සහ බේකරි)	3/4 වන මට්ටම
• මෝටර් රථ කාර්මික ශිල්පී	2/3 වන මට්ටම
• මෝටර් රථ තාක්ෂණික ශිල්පී	4 වන මට්ටම
• කළමනාකරණ සේවා නිලධාරී	4 වන මට්ටම
• කළමනාකරණ සේවා සහකාර	3 වන මට්ටම
• යන්ත්‍ර ශිල්පී	3/4 වන මට්ටම
• සත්කාර කළමනාකරණය	6 වන මට්ටම
• ගිණුම්කරණය	5/6 වන මට්ටම
• වැවිලි බෝග තාක්ෂණය	5/6 වන මට්ටම

7.2.2 නිපුණතා සම්මත පමණක් යාවත්කාලීන කරන ලද වෘත්තීන් පහත සඳහන් වේ.

- අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු 2/3 වන මට්ටම

7.2.3 විෂය මාලා පමණක් යාවත්කාලීන කරන ලද වෘත්තීන් පහත සඳහන් වේ.

- මෝස්තර නිර්මාණ ශිල්පී 3/4 වන මට්ටම
- කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය 5/6 වන මට්ටම

7.3 ජාතික නිපුණතා සම්මත හා විෂයමාලා පරිවර්තන කටයුතු.

7.3.1 සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා 42ක් පහත සඳහන් වේ.

- සෞඛ්‍යය රැකවරණ හා සත්කාර සහකාර
- පාරිභෝගික සේවා සහකාර
- සුපිරිවෙළෙඳසැල් පාරිභෝගික සේවා සහකාර
- පාරිභෝගික සේවා සහායක (බනිජ තෙල්)
- ඇඟලුම් නිර්මාණ ශිල්පී
- බර වාහන ක්‍රියාකරු
- මාළු ඇල්ලීමේ මෙවලම් අළුත්වැඩියා කිරීමේ සහායක
- ආරක්ෂක නිළධාරී
- සැපයුම් ක්‍රියාකාරකම් (ගබඩා පාලක)
- රියදුරු
- සහායක බංගලා භාරකරු
- ක්ෂේත්‍ර සහකාර (කෘෂිකර්මය)
- කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන සහකාර
- ආපදා අවදානම් අවම කිරීමේ සහකාර
- මත්ද්‍රව්‍ය නිවාරණ සහකාර
- පශු සම්පත් සහකාර
- ගොඩනැගිලි පින්තාරුකරු

- පළතුරු හා එළවළු පැසුරුම් ශිල්පී
- ප්‍රවාහන උදව්කරු
- හෙද සහායක
- ටේලර්
- සත්ත්ව භාරකරු
- මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී
- ප්‍රජා සෞඛ්‍යය සහායක
- වඩු කාර්මික ගෘහ භාණ්ඩ
- මාතෘ හා ළදරු සත්කාර සපයන්නා
- කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහායක
- මින් මැදුරු භාරකරු
- ළමා සත්කාර සපයන්නා
- හස්ති පාලක
- යන්ත්‍ර ක්‍රියාකරු (සහල් මෝල්)
- පිළිගැනීමේ නිලධාරී
- මෝටර් රථ කාර්මික ශිල්පී
- රසායනාගාර සහායක
- පෙලඹොටමිස්ට්
- මෝටර් රථ වෑද්දුම් ශිල්පී
- හෝජනාගාර සේවක
- වෑද්දුම් ශිල්පී
- නර්ථන ශිල්පී
- පුහුණුකරු (ක්‍රීඩා)
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සහකාර
- පිරිස් සාමාජික (පීසා)

7.3.1.2 ජාතික නිපුණතා සම්මතය පමණක් සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද වෘත්තීන් 13ක් පහත සඳහන් වේ.

- ළමා රැකවරණ මධ්‍යස්ථාන මෙහෙයවීම
- වියළි රබර් සැකසීමේ යන්ත්‍ර කාර්මික ශිල්පී
- වියළි රබර් සැකසීමේ යන්ත්‍ර ක්‍රියාකරු
- අත්යන්ත්‍ර පේෂකර්ම කාර්මික

- ජීවිත ආරක්ෂක වෘත්තිය
- ටයිල් අතුරන්නා
- මනාලියන් හැඩගන්වන්නා
- විදුලි කාර්මික ශිල්පී
- හෝමියෝපති වෙදකම
- ඖෂධ තාක්ෂණික ශිල්පී
- නිෂ්පාදන සහායක (විද්‍යුත් මාධ්‍යය)
- පරිගණක යෙදවුම් සහායක
- රූපලාවන්‍ය ශිල්පී

7.3.1.3 විෂයමාලාව පමණක් සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද වෘත්තීන් පහත සඳහන් වේ.

- පැළ තවාන් සංවර්ධන සහකාර
- අධිවේගී මහන යන්ත්‍ර කාර්මික

7.3.2 පහත සඳහන් නිපුණතා සම්මත හා විෂයමාලා 28ක් දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලදී.

- ශීතකරණ සහ වායු සමීකරණ කාර්මික ශිල්පී
- ඇඟලුම් නිර්මාණ ශිල්පී
- පිළිගැනීමේ නිලධාරී
- සත්කාර සපයන්නා (සෞඛ්‍ය රැකවරණ හා සත්කාර සහයක)
- මාතෘ හා ළදරු සත්කාර සපයන්නා
- ඉදිකිරීම් වැඩබිම් අධීක්ෂක
- භූමි අලංකරණ සහායක
- අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු
- මත්ද්‍රව්‍ය නිවාරණ සහායක
- වෑද්දුම් ශිල්පී
- සත්ත්ව භාරකරු
- අලි භාරකරු/ඇත්ගොව්වා
- පරිසර සුරැකුම් සහකාර

- සහායක බංගලා භාරකරු
- පාරිභෝගික සේවා සහායක (බනිජ තෙල්)
- ප්‍රජා සෞඛ්‍යය සහායක
- සත්කාර සපයන්නා
- ආපදා අවදානම් අවම කිරීමේ සහකාර
- ආරක්ෂක නිළධාරී
- මාළු ඇල්ලීමේ මෙවලම් අළුත්වැඩියා කිරීමේ සහයක
- භෝජනාගාර සේවක/ ස්ටුවඩ්
- ඖෂධ තාක්ෂණික ශිල්පී
- පෙලබොටමිස්ට්
- පිරිස් සාමාජික (පීසා)
- යන්ත්‍ර ක්‍රියාකරු (සහල් මෝල්)
- එම්බාම්කරු
- සත්කාර සපයන්නා
- මෝටර් රථ වර්ණ කාර්මික ශිල්පී

7.3.2.2 ජාතික නිපුණතා සම්මතය පමණක් දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලද වෘත්තීන් 9ක් පහත සඳහන් වේ.

- වියළි රබර් සැකසීමේ යන්ත්‍ර කාර්මික ශිල්පී
- වියළි රබර් සැකසීමේ යන්ත්‍ර ක්‍රියාකරු
- හෝමියෝපති වෙදකම
- පශු සම්පත් සහායක
- වාහන ලිහිසි සේවාකරු
- ළමා රැකවරණ මධ්‍යස්ථාන මෙහෙයවීම
- සහකාර නිෂ්පාදක
- ගුවන් විදුලි ප්‍රචාරක කලාවේදී
- මාධ්‍යවේදී (මුද්‍රිත මාධ්‍ය)

7.4 ජාතික වෘත්තීය සුදුසුකම් නොවන පාඨමාලාවන්හි සුදුසුකම් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් වලට සමාන කිරීම.

7.4.1 ජාතික වෘත්තීය සුදුසුකම් නොවන පාඨමාලාවන් හදාරන ලද අයඳුම්කරුවන් හට ජාතික වෘත්තීය සුදුසුකම් සමාන සහතික නිකුත් කිරීම සඳහා වෘත්තීය සමාලෝචන පරීක්ෂණ සිදුකරන ලද අතර එමගින් සමත් වූවන් හට ජාතික වෘත්තීය සුදුසුකම් සමාන කිරීමේ සහතික නිකුත් කරන ලදී.

පාඨමාලාවේ නම	ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම	නිකුත් කරන ලද සමානතා සහතික සංඛ්‍යාව
කර්මාන්ත තාක්ෂණ ජාතික සහතික පත්‍රය (සිවිල් ඉංජිනේරු)	5 වන මට්ටම	4

7.4.2 ජාතික තාක්ෂණ සහතිකපත්‍ර ලාභීන්ට ජාතික වෘත්තීය සුදුසුකම් සමානතාවය පිරිනැමීමට පුවත්පත් දැන්වීමක් මගින් අයඳුම්පත් කැඳවා දැනුම පරීක්ෂා කිරීම සඳහා 2019 දී පවත්වන ලද පොදු විභාගයෙන් සමත් වූවන්ට මෙම වසරේදී ද වෘත්තීය සමාලෝචන පරීක්ෂණ සිදුකරන ලද අතර එමගින් සමත් වූවන් හට ජාතික වෘත්තීය සුදුසුකම් සමාන කිරීමේ සහතික නිකුත් කරන ලදී. තව ද එම සහතිකපත්‍ර නැවත සහතික කර ගැනීම සඳහා නොයෙකුත් ආයතන මගින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් 53 ක් සඳහා ද සහතික කිරීමේ ලිපි නිකුත් කරන ලදී.

පාඨමාලාවේ නම	ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම	නිකුත් කරන ලද සමානතා සහතික සංඛ්‍යාව
ජාතික තාක්ෂණ සහතික පත්‍රය (සිවිල් ඉංජිනේරු) සහ කර්මාන්ත තාක්ෂණ ජාතික සහතික පත්‍රය (සිවිල් ඉංජිනේරු)	5 වන මට්ටම	1408
ජාතික තාක්ෂණ සහතික පත්‍රය (ප්‍රමාණ සමීක්ෂණ)	5 වන මට්ටම	306

7.4.3 තව ද පහත දක්වා ඇති සහතික පත්‍ර සඳහා ද ජාතික වෘත්තීය සුදුසුකම් සමාන කිරීමේ සහතික නිකුත් කිරීම සිදුකර ඇත.

ආයතනයේ නම	පාඨමාලාවේ නම	ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම	නිකුත් කරන ලද සමාන කිරීමේ සහතික සංඛ්‍යාව
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය / ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය	තොරතුරු සන්නිවේදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමාව	5 වන මට්ටම	10
වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය	ප්‍රමාණ සමීක්ෂණ ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	01
ඉංජිනේරු තාක්ෂණ ආයතනය	ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	06
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය	තොරතුරු තාක්ෂණ උසස් ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	03
	සිවිල් ඉංජිනේරු උසස් ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	02
	ආහාර තාක්ෂණ උසස් ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	02

7.5 ජාතික නිපුණතා සම්මත හා විෂය මාලාවන් හි පිටපත් සැකසීම.

සකස් කර ඇති ජාතික නිපුණතා සම්මත හා ඒවායේ ලේඛන ඇතුලත් මෘදුපිටපත් සහිත CD තැටි විකිණීම මෙම අංශය මගින් සිදු කරනු ලැබේ. 2020 වසර තුල දී මෙම CD තැටි 836 ක් විකුණා ඇති අතර එමගින් රු 418,000.00 ක ආදායමක් උපයා ඇත.

2020 වසරේ ඔක්තෝම්බර් මස සිට මෙම ජාතික නිපුණතා සම්මත කොමිෂන් සභා වෙබ් අඩවිය ඔස්සේ නොමිලේ බාගත කරගැනීමට පහසුකම් සැපයීමේ කටයුතු සිදුකරන ලදී.

7.6 අන්තර් ආයතනික ජාතික වෘත්තීය සුදුසුකම් මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම.

ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළු හඳුනා ගෙන ඒවාට විසඳුම් සෙවීම සාමූහික තීරණ ගැනීම සහ නව යෝජනා ක්‍රියාත්මක කිරීම අරමුණු කර ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමවේදය ක්‍රියාත්මක කරන රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන් හි ජෙෂ්ඨ නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පිහිටුවා ඇත. 2020 වසර තුළ එම කමිටු රැස්වීම් 10 ක් පවත්වා ඇත.

7.7 ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කිරීමේ සහ අධීක්ෂණ කමිටුව

ජාතික වෘත්තීය සම්මතයන් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම දේශීය මෙන්ම විදේශීයව ද සලකා බලා අවසර ලබා දීමත්, ජාතික නිපුණතා සම්මතවල ගුණාත්මකභාවය පවත්වා ගෙන යාමත්, ජාතික නිපුණතා සම්මත සහ අදාළ අනෙකුත් ලේඛන සකස් කිරීමේ දී ඇතිවන ගැටලු නිරාකරණය කිරීම සඳහා ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කිරීමේ සහ අධීක්ෂණ කමිටුව පිහිටුවා ක්‍රියාත්මක කර ඇත. 2020 වසර තුළ එම කමිටු රැස්වීම් 10 ක් පවත්වා ඇත. අදාළ තීරණ ගැනීම හා ප්‍රගතිය සමාලෝචනය කිරීම සිදුකර ඇත.

7.8 ජාතික වෘත්තීය සුදුසුකම් නොවන පාඨමාලා ජාතික වෘත්තීය සුදුසුකම් 5/6 මට්ටම් සමඟ සමාන කිරීම/ගැළපීම.

ජාතික වෘත්තීය සුදුසුකම් 5/6 මට්ටම් සඳහා නිකුත් කර ඇති 02/2019 චක්‍රලේඛයට අනුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ඉල්ලුම් කර තිබූ ජාතික වෘත්තීය සුදුසුකම් නොවන ඩිප්ලෝමා පාඨමාලා වන NCIT (Mechanical) පාඨමාලාව NVQ 5 වන මට්ටම හා සමාන බව තහවුරු කළ අතර ඊට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ අංක 02/2020 නිකුත් කරන ලදී. තවද BMS ආයතනය මඟින් අයඳුම් කළ Bio Medical Science පාඨමාලාව සමාන නොවන බවට තහවුරු කරන ලදී.

7.9 ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛන

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් නිකුත් කරනු ලබන චක්‍රලේඛන ප්‍රකාශයට පත් කිරීම මෙම අංශයෙහි කාර්යභාරයක් වේ. ඒ යටතේ 2020 වර්ෂය සඳහා පහත සඳහන් චක්‍රලේඛන නිකුත් කරන ලදී.

- ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ අංක 01/2020
  ආබාධ සහිත අයඳුම්කරුවන් හට උචිත අයුරින් ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයීම් ගැළපීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ අංක 02/2020
  කර්මාන්ත තාක්ෂණඥයින් සඳහා ජාතික සහතිකය (යාන්ත්‍රික ඉංජිනේරු) පාඨමාලාව ජාතික වෘත්තීය සුදුසුකම් 05 වන මට්ටමට සමාන කිරීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ අංක 03/2020
  නම්‍යශීලී ඉගෙනුම් ක්‍රමයේ දී (Flexible Learning Model) මොඩියුලර් පාඨක පුහුණු වැඩසටහන් හරහා නිපුණතා වාර්තා නිකුත් කිරීම (Record of Achivement) සඳහා වන රෙගුලාසි සහ මාර්ගෝපදේශ

7.10 වෘත්තීය පරිණතභාවය සහිත අයඳුම්කරුවන් ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමේ සුදුසුකමට සමාන කිරීම.

වෘත්තීය පරිණතභාවය මත ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමට සමාන කිරීමේ සහතික ලබාදීම සඳහා අයදුම් කළ ක්ෂේත්‍රයන්ට අදාළව සම්මුඛ පරීක්ෂණ 15 ක් පවත්වා සහතිකපත් 50 ක් සුදුසුකම්ලාභීන් හට ප්‍රදානය කර ඇත.

8. තත්ත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන

8.1 හැඳින්වීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ ජූලි මාසයේ දී ජාතික වෘත්තීය සුදුසුකම් අංශයේ හා පාලන අංශයේ NVQ සහතිකපත් අංශය ඒකාබද්ධ කරමින් ඇගයීම් තත්ත්ව ආරක්ෂණ අංශය ස්ථාපනය කරන ලදී. ඒ සඳහා ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනේ මූල්‍ය දායකත්වය ලබා දෙන ලදී.

ඒ අනුව මෙම අංශය අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂවරුන් 04, වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් 01, සංවර්ධන නිලධාරීවරුන් 03, කළමණාකාර සහකාරවරුවන් 04 හා පරිගණක යෙදවුම් සහකාර 03 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම මිනිස් සම්පත් උපයෝගී කර ගනිමින් 2020 වර්ෂයේදී පහත සඳහන් කාර්යයන් ඉටුකරනු ලැබීය.

8.2 ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කරලීම හා නියාමනය කිරීම

8.2.1 ඇගයීම් නිලධාරී සංචිතය පවත්වාගෙන යාම

මෙම වර්ෂයතුල ඇගයීම් සංචිතයේ සිටින සියලුම නිලධාරීන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම සිදුකිරීම මඟින් ඇගයීම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය හා ගුණාත්මකභාවය වර්ධනය කර ඇත.

8.2.1.1 අවශ්‍යවන ඇගයීම් නිලධාරී ප්‍රමාණය පුරෝකථනය කිරීම

සංවර්ධනය කර ඇති නව ජාතික නිපුණතා සම්මත හා 2019 වර්ෂයේ අවසන් වන විටදී සංචිතයේ ලියාපදිංචි වී සිටි ඇගයීම් නිලධාරි/ නිලධාරිනියන් සංඛ්‍යාවත්, එම නිලධාරීන්ගේ භූගෝලීය පැතිරීමත්, යන කරුණු සැලකිල්ලට ගෙන අවශ්‍යවන ඇගයීම්කරුවන් සංඛ්‍යාව පිළිබඳ පුරෝකථන වාර්තාව සකස්කරන ලදී.

8.2.1.2 නිපුණතා පාදක ඇගයීම් නිලධාරීන් ලෙස පුහුණු කිරීම සඳහා අයඳුම්කරුවන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම

නිපුණතාපාදක ඇගයීම් නිලධාරීන් ලෙස පත්වීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයෙන්ද ඉල්ලුම්පත් කැඳවන ලදී. මෙම අයඳුම්පත් කැඳවීම සඳහා නිශ්චිත කාලවකවානුවක් නොමැති අතර, ලැබෙන අයඳුම්පත් අතරින් සුදුස්සන් තෝරාගැනීම, සම්මුඛ පරීක්ෂණ මණ්ඩල මඟින් සිදුවේ.

අදාල වෘත්තීන් පිළිබඳව විශේෂඥ දැනුමින් යුත් පුද්ගලයන් මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පත්කරන අතර, එවැනි සම්මුඛ පරීක්ෂණ දින 14ක් 2020 වසර තුල පවත්වා වෘත්තීන් 31කට ඇගයුම්කරුවන් 139 දෙනෙක් තෝරාගන්නා ලදී.

8.2.2 ඇගයීම් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා එයට පහසුකම් සැපයීම

කොවිඩ් තත්වය හමුවේ වුවද පුහුණුකිරීමේ වැඩසටහන් 08ක් පවත්වා නිලධාරීන් 101 සඳහා ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳව පුහුණුව ලබාදෙන ලදී.

8.2.3 ඇගයීම්කරුවන් වෙත බලපත්‍ර ලබාදීම

2020 වර්ෂයේ දී ඇගයීම්කරුවන් 145 දෙනෙක්ගේ ඇගයීම් බලපත්‍ර යාවත්කාලීන කරන ලදී.

8.2.4. නිපුණතා පාදක ඇගයීම් කටයුතු නියාමනය කිරීම

මේ යටතේ මෙතෙක් පැවති ඇගයීම්කරුවන් පත්කිරීමේ ක්‍රියාවලිය වේගවත්කොට ඩිජිටල් ක්‍රමයට ඇගයීම්කරුවන් පත්කිරීම හා ඇගයීම් පැවැත්වීමේ කාලවකවානු තීරණය කිරීමට ඉවහල් වන පරිගණක ආශ්‍රිත ක්‍රම මගින් ඇගයීම්කරුවන් පත්කිරීමේ ක්‍රමවේදය හඳුන්වාදෙන ලදී. මෙම ඩිජිටල් ක්‍රමවේදය තුලින් මෙතෙක් පැවති පක්ෂග්‍රාහී හා අවිධිමත් ක්‍රමය ඉවත් කරන ලදී. ඒ අනුව CBT, EBT, RPL හා අලුතින් හඳුන්වාදුන් FLM ක්‍රම 04 හිම ඇගයීම්කරුවන් පත්කිරීම පරිගණක ක්‍රම මත පදනම් වූ නව ක්‍රමය මගින් සිදුවේ. ඒ තුලින් අපක්ෂපාතී ලෙස ඇගයීම්කරුවන් පත්කිරීම සිදුවන අතර එම ක්‍රියාවලියේ ගුණාත්මකභාවය සැලකියයුතු ලෙස ඉහල නංවන ලදී.

මේ යටතේ කාර්යයන් 03ක් පහත සඳහන් පරිදී සිදු කරන ලදී

- පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීම.
- රාජ්‍ය අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දීම.
- අදාළ ආයතන සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

8.2.4.1 පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල නිපුණතා පාදක ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීම

තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාදිංචි වී ඇති පෞද්ගලික අංශයට අයත් පුහුණු ආයතනවල ප්‍රතිනතය කර ඇති පාඨමාලා අවසානයේ එම පාඨමාලා හදාරනු නිබූ ආධුනිකයින් ඇගයීමට ලක්කොට නිපුණතාවය ලබා ඇති ආධුනිකයින් හට ජාතික වෘත්තිය සුදුසුකම් පිරිනැමේ.

එහිදී අදාල නිර්නායක පරීක්ෂා කොට ඒවා සපුරන ලද අවස්ථාවන්හී දී කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන ඇගයීම් සංචිතයේ සිටින ඇගයීම්කරුවන් පත්කොට ඔවුන් ලවා ඇගයීම් කටයුතු සංවිධානය කල යුතුය. විවිධ පුහුණු මධ්‍යස්ථාන/ ආයතන විසින් 2020 වසර තුළ පෞද්ගලික අංශය සඳහා කරන ලද ඉල්ලීම් 557 සඳහා ඇගයීම්කරුවන් පත්කරන ලදී.

8.2.4.2 රාජ්‍ය අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීම

රාජ්‍ය අංශයට අයත් පුහුණු ආයතනවල පැවැත්වෙන පුහුණු පාඨමාලාවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීමේ කාර්යය කොමිෂන් සභාවේ ඇගයීම් හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් ඉටුකරන ලදී. 2020 වර්ෂයේ පෙබරවාරි මස සිට පැවති කොවිඩ් 19 වසංගත තත්වය නිසා බොහෝ ඇගයීම් කල්දමන ලද නමුත්, වරින් වර පවත්වන ලද ඇගයීම් 386ක් සඳහා අනුමැතිය ලබා දෙන ලදී. එම ඉල්ලීම් ඉදිරිපත් වූයේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යංශයට අයත් මෙන්ම ඊට පරිබාහිරව ක්‍රියත්මක රාජ්‍ය අංශයට අයත් පහත සඳහන් පුහුණු මධ්‍යස්ථාන වලිනි.

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යංශයට අයත්

- කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව
- සාගර විශ්වවිද්‍යාලය
- ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
- ජාතික තරුණාසේවා සභාව

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යංශයට අයත් නොවන රාජ්‍ය ආයතයන

- ශ්‍රී ලංකා යොවුන් බලකාය
- ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යංශය
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- සමාජසේවා දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව
- ශ්‍රී ලංකා නාවික හමුදාව

නිපුණතා පාදක පුහුණු පාඨමාලා තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමට අමතරව තවත් ක්‍රමයකට එම සුදුසුකම් ලබාදේ. එනම්, කර්මාන්තය තුළ වෘත්තීන්හි නියැලි අත්දැකීම් ලබා ඇති පුද්ගලයන්ට පාඨමාලා හැදෑරීමට අපහසු නිසා RPL සුදුසුකම සඳහා ඉල්ලුම් කළහැකි අතර, එවැනි අත්දැකීම් ලබා ඇති පුද්ගලයන්ගේ නිපුණතා ඇගයීම් කර NVQ සහතිකය ලබාදේ. එම ක්‍රමය පෙරදැනුම ඇගයීමේ ක්‍රමය (RPL) ලෙස හැඳින්වේ. එම ක්‍රමය තුළින් ජාතික වෘත්තීය සුදුසුකම ලබා දීමට පහත සඳහන් රාජ්‍ය ආයතන 3කට බලය පවරා ඇත.

එම ආයතන 03 වන්නේ,

- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව

8.2.5 පෙර දැනුම් ඇගයීමේ ක්‍රමය පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවතීම

වරින්වර ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලද අතර, මෙහෙයුම් කමිටු රැස්වීම්වලදී ද විභාග මණ්ඩල රැස්වීම්වලදී ද ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය සහ වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ පෙර දැනුම ඇගයීම් ක්‍රමය පිළිබඳ ගැටළු හා අභියෝග පිළිබඳව සාකච්ඡා කරන ලදී.

8.3 නිපුණතා පාදක ඇගයීම්වල සංෂතභාවය තහවුරු කිරීම

8.3.1 සංෂතභාවය තහවුරුකිරීමේ හා ඇගයීම්කරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩමුළු පැවැත්වීම

ඉහත සඳහන් කරන ලද අභිමතාර්ථය සපුරාගැනීමේ අරමුණින් වැඩමුළු 5 ක් වසර තුල පැවැත්වීමට සැලසුම් කරන ලදි. නමුත් කොවිඩ් 19 වසංගත තත්වයේ ව්‍යාප්තිය හමුවේ රැස්වීම් වැඩමුළුව සඳහා ඇගයීම්කරුවන් සියළුදෙනාම ගෙන්වා ගැනීම සිදුකල නොහැකි නිසා මේ වර්ෂයතුල අදාල වැඩමුළු නොපවත්වන ලදී. කෙසේ නමුත් එම ප්‍රතිපාදන යොදාගෙන ඇගයීම්කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 3ක් පවත්වන ලදී. ඒ තුලින් ඇගයීම්කරුවන්ගේ සංචිතය තවදුරටත් පුළුල්කිරීමට හැකිවිය.

8.3.2 රාජ්‍ය හා පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල පැවැත්වෙන නිපුණතා පාදක ඇගයීම් කටයුතු අධීක්ෂණය කිරීම

ගත වූ වසර තුල රාජ්‍ය හා පෞද්ගලික අංශයට අයත් පුහුණු ආයතනවල පවත්වන ලද නිපුණතා පාදක ඇගයීම් 38 ක් අධීක්ෂණය කරන ලදී. එම අධීක්ෂණ ප්‍රතිඵල අනුව NVQ චක්‍රලේඛණ අංක 2017/1 අනුව සහ ඉහල කළමණාකාරිත්වයේ උපදෙස් මත ඇගයීම් ඇගයීම් ක්‍රියාවලියට හා මූලධර්මවලට පටහැනිව කටයුතු කළ අවස්ථාවලදී ඇගයීම්කරුවන්ට අවශ්‍ය උපදෙස් ලබාදීම හා අනෙකුත් අදාල විනයානුකූල තීරණ ගන්නා ලදී.

8.4 පැමිණිලි විභාග කිරීම

2020 වසර තුල අපේක්ෂා කල මට්ටමේ ඇගයීම් කටයුතුද සිදුකිරීමට නොහැකිවූ බැවින් අපහට විභාග කලයුතු මට්ටමේ පැමිණිලි නොලැබුණි.

8.5 දැනුම පරීක්ෂා කිරීමේ පොදු ලිඛිත විභාගය පැවැත්වීම

8.5.1 ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 4 ප්‍රදානය කිරීම සඳහා පොදු ලිඛිත විභාගය පැවැත්වීම

2020 වර්ෂය තුළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 04 සඳහා වෘත්තීන් 13 සඳහා පවත්වනු ලබන පොදු ලිඛිත පරීක්ෂණය මෙවරද ජනවාරි මස තුලදී පවත්වන ලදී. එහිදී එක් එක් වෘත්තීන් සඳහා පහත පරිදි අයදුම්කරුවන් විභාග සඳහා ඉදිරිපත් විය.

වගුව 8.5.1 2020 වර්ෂයේ පැවති පොදු පරීක්ෂණ වලට සහභාගිවූ අයදුම්කරුවන්

ක්ෂේත්‍රය	මුළු එකතුව
මෝටර් රථ කාර්මික ශිල්පී	946
බේකරි ශිල්පී	743
රූපලාවන්‍ය	3011
වැඩබිම් සුපරීක්ෂක	864
සූපවේදී ශිල්පී	988
සැලසුම් ශිල්පී	1067
විදුලි ශිල්පී	1504
කේෂාලංකරණ	2843
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී	7171
හෙද සහායක	87
පෙර පාසල් ගුරු (මුල් ළමාවිය සංවර්ධන)	1404
ප්‍රමාණ සමීක්ෂණ සහායක	691
ශීතකරණ හා වායුසමීකරණ කාර්මික ශිල්පී	524
මුළු එකතුව	21843

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිත

Covid 19 තත්ත්වය යටතේ ලිඛිත පරීක්ෂණ තවදුරටත් පැවැත්වීමට නොහැකි විය. මෙම සියලුම පරීක්ෂණවල ප්‍රතිපල එම වර්ෂය තුලදිම නිකුත්කරන ලදී. පැවැත්වීමට නියමිතව තිබූ පොදු ලිඛිත පරීක්ෂණය කොවිඩ් 19 වසංගත තත්තවය හමුවේ 2021 මාර්තු මස දක්වා කල් දමන ලදී.

8.5.2 ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 සහ 6 ලිඛිත විභාගයන් පැවැත්වීම

ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 සහ 6 පාඨමාලාවල පොදු ලිඛිත විභාගය 2020 වසර තුල අදාල ආයතනවල ඉල්ලීම මත පහත සඳහන් වෘත්තීන් සඳහා පවත්වන ලදී.

පොදු ලිඛිත පරීක්ෂණය පවත්වන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 සහ 6 පාඨමාලා
පරිගණක හා තොරතුරු තාක්ෂණය
ප්‍රමාණ සමීක්ෂණ
ඉදිකිරීම් තාක්ෂණය
විලේපන වේදය
කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය
මෙකාට්‍රොනික් තාක්ෂණය
ශීතකරණ හා වායු සමීකරණ
නිෂ්පාදන තාක්ෂණය
පෙරපාසල් කළමනාකරණය
මුද්‍රිත තාක්ෂණය
සැලසුම් තාක්ෂණය
යාන්ත්‍රික තාක්ෂණය



8.6 ඇගයීම් නිලධාරීන් සඳහා ගෙවීම් කිරීම

මේ යටතේ ඇගයීම් නිලධාරීන්ගේ ගෙවීමේ ක්‍රියාවලිය Slip Transfer ක්‍රමයට හරවන ලදී. ඒ තුලින් චෙක්පත් ගෙවීම නතර කොට අදාල ගෙවීම කෙලින්ම අදාල ඇගයීම්කරුවන්ගේ ගිණුම් වලට යැවීමට කටයුතු කරන ලදී. ඒ තුලින් එම ගෙවීම් නිවැරදිව හා කාර්යක්ෂමව ඉටුකිරීමට හැකිවිය.

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ඇගයීම් සඳහා සහභාගීවූ ඇගයීම්කරුවන්ට දීමනා හා ගමන් ගාස්තු කොමිෂන් සභාවේ ඇගයීම් ඒකකය විසින් ගෙවීමට කටයුතු කරන ලදී.

මෙම ශීර්ෂය යටතේ ඇගයීම් නිලධාරින්ගේ වවුචර්පත් 1194ක දීමනා ඇගයීම් ඒකකය විසින් සහතික කොට ගිණුම් අංශයට ඉදිරිපත් කරනලදී. එම වවුචර්පත්වල මුළු වටිනාකම රු. මිලයන 14.886 ක් විය.

8.7 ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් නිකුත් කිරීම

Covid 19 වසංගතය හේතු කොටගෙන NVQ සහතිකපත් නිකුත් කිරීමේ සැලකියයුතු පහලයාමක් 2020 වර්ෂයේදී දක්නට ලැබුනි. මෙයට ප්‍රධාන වශයෙන් බලපානු ලැබුවේ පුහුණු හා ඇගයීම් කටයුතු අඩාලවීමය. ඒ අනුව අපේක්ෂිත ඉලක්කයෙන් 50% ක් පමණ ඉටුකරගැනීමට හැකිවිය.

ඒ අනුවල 2020 වසර තුළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සහතිකපත් 47621 ක් නිකුත් කර ඇති අතර ඒ පිලිබඳ විස්තර පහත දැක්වේ.

වගුව 8.7.1 2020 වර්ෂය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් ලාභීන් (ආයතන අනුව)

ආයතනය	සහතිකපත් ලාභීන්				සහතිකපත් ප්‍රමාණය			
	නිපුණතා පාදක ඇගයීම් ක්‍රමය	පෙර දැනුම ඇගයීම් ක්‍රමය	කර්මාන්ත ගත පුහුණු ක්‍රමය	එකතුව	නිපුණතා පාදක ඇගයීම් ක්‍රමය	පෙර දැනුම ඇගයීම් ක්‍රමය	කර්මාන්ත ගත පුහුණු ක්‍රමය	එකතුව
කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව	7907	174	0	8081	8493	177	0	8670
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය	1041	4999	1389	7426	1181	5614	1471	8266
වෘත්තීය පුහුණු අධිකාරිය	11824	690	0	12512	14721	887	0	15608
ජාතික තරුණ සේවා සභාව	1748	0	0	1748	2118	0	0	2118
පෞද්ගලික අංශය	11555	7	0	11557	12952	7	0	12959
එකතුව	**34075**	**5870**	**1389**	**41334**	**39465**	**6685**	**1471**	**47621**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිත

NVQ 1 සිට NVQ 6 දක්වා මට්ටම් වලට 2020 වර්ෂය තුලදී නිකුත් කර ඇති සහතිකපත් ප්‍රමාණයන් ඒ ඒ ආයතන අනුව පහත වගුවේ දැක්වේ.

වගුව 8.7.2 2020 වර්ෂය තුලදී නිකුත් කර ඇති සහතිකපත්‍ර

ආයතනය	පළමු මට්ටම	දෙවන මට්ටම	තෙවන මට්ටම	සිව්වන මට්ටම	පස්වන මට්ටම	හයවන මට්ටම
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය	8	499	4385	3374	0	0
කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව	3	246	3332	3933	988	168
ජාතික තරුණ සේවා සභාව	0	143	702	1269	4	0
වෘත්තීය පුහුණු අධිකාරිය	168	817	7127	7285	211	0
පෞද්ගලික අංශය	3	547	8943	2644	470	352
එකතුව	**182**	**2252**	**24489**	**18505**	**1673**	**520**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

2020 වර්ෂයේදී පුහුණු ආයතන විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් සහතික (ස්ත්‍රී / පුරුෂ භාවය අනුව) පහත වගුවේ දැක්වේ.

වගුව 8.7.3 2020 වර්ෂය සඳහා නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් සහතික (ස්ත්‍රී / පුරුෂ භාවය අනුව)

ආයතනය	සහතිකපත් ලාභීන්			සහතිකපත් ප්‍රමාණය		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව	**4713**	**3368**	**8081**	**5242**	**3428**	**8670**
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය	**4628**	**2798**	**7426**	**5087**	**3179**	**8266**
වෘත්තීය පුහුණු අධිකාරිය	**7012**	**5500**	**12512**	**8949**	**6659**	**15608**
ජාතික තරුණ සේවා සභාව	**665**	**1083**	**1748**	**790**	**1328**	**2118**
පෞද්ගලික අංශය	**4947**	**6610**	**11557**	**5628**	**7331**	**12959**
එකතුව	**21965**	**19359**	**41324**	**25696**	**21925**	**47621**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2020 වසර තුල සහතිකපත් 273ක් නැවත මුද්‍රණය කරන ලදී. ඒ පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

වගුව 8.7.4 2020 වර්ෂයේදී නැවත මුද්‍රණය කරන ලද සහතිකපත්‍ර පිළිබඳ විස්තර

සහතික වර්ගය	සහතික පත්‍ර ප්‍රමාණය
මුද්‍රණ දෝෂ හේතු කොටගෙන නැවත මුද්‍රණය කරන ලද සහතිකපත්‍ර	69
අස්ථානගත වූ සහතික වෙනුවට අනු පිටපත් මුද්‍රණය	204

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

2006 වර්ෂයේ සිට නිකුත් කරන ලද සහතික පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

වගුව 8.7.5 2006 සිට 2019 දක්වා නිකුත් කරනලද මුළු සහතිකපත්‍ර ප්‍රමාණය

වර්ෂය	සහතිකපත්‍ර සංඛ්‍යාව
2006	259
2007	1,629
2008	8,915
2009	11,249
2010	13,256
2011	16,572
2012	18,111
2013	22,855
2014	28,546
2015	44,148
2016	47,017
2017	65,212
2018	61,150
2019	78,007
2020	47,621
එකතුව	**464,457**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

ප්‍රස්තාරය 8.7.1 2006 සිට 2020 දක්වා නිකුත්කල සහතිකපත්‍ර ප්‍රමාණය



මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ආරම්භයේ සිට 2020 වර්ෂය අවසාන වන විට සහතිකපත් 464,457 ක් නිකුත්කර රටේ ශ්‍රමබලකාය ශක්තිමත් කිරීම සඳහා සක්‍රීය දායකත්වයන් සපයන ලදී.

9.0 කර්මාන්ත සම්බන්ධතා අංශය

9.1 පසුබිම

කර්මාන්ත ක්ෂේත්‍රයට අවශ්‍ය කරන නිපුණතාවයෙන් හෙබි පුද්ගලයන් බිහිකිරීම කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ මූලික පරමාර්ථය වන අතර කාලීනව සිදුවන කර්මාන්තයේ අවශ්‍යතාවන්ට අනුකූලව වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය යාවත්කාලීන කිරීම රටක ආර්ථික තත්ත්වය වෙනස් කිරීම සඳහා සෘජුව බලපායි. කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන්ට අනුකූල නිපුණතාවයෙන් හෙබි තරුණ පරපුරක් බිහිකිරීම උදෙසා කර්මාන්තයේ හා කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍ර අතර මනා සම්බන්ධතාවයක් ගොඩ නැගීම සඳහාත් ඒ තුළින් සම්මත වෘත්තීය මාර්ගෝපදේශන සේවාවක් වඩාත් ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීමේ අපේක්ෂාව ඇතිව 2016 වර්ෂයේ කර්මාන්ත සම්බන්ධතා අංශය පිහිටුවනු ලැබීය.

ඒ අනුව 2020 වර්ෂයේදී කර්මාන්ත සම්බන්ධතා අංශය වඩාත් ශක්තිමත්ව අවශ්‍ය සම්බන්ධතාවයන් වර්ධනය කිරීමේ කාර්යයෙහි නියැලෙන අතරම ඊට සමගාමීව බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය නවමු මාවතකට ගෙන ඒම උදෙසා සේවාවන් රැසක් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. එහිදී ආංශික නිපුණතා සහා 4ක් ශක්තිමත් කිරීම තුළින් සහ දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුතුව දිස්ත්‍රික් කමිටු මෙහෙයවීමෙන් ප්‍රාදේශීයව ක්‍රියාත්මක වාණිජ මණ්ඩල සමඟ සම්බන්ධතාවය ශක්තිමත් කිරීම මඟින් කර්මාන්තයේ හා කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රයේ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමට හැකියාව පැවතුන බව කිව හැකිය. එමෙන්ම දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ශක්තිමත් කරමින් වසරේ මාධ්‍ය සැලසුම අනුව කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන්නට යෙදුනි.

2016 වර්ෂයේ ආරම්භ වූ කර්මාන්ත සබඳතා අංශය 2018 වර්ෂය අවසාන භාගය වන විට වඩාත් පුළුල්ව ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවක් පැන නැඟුණු අතර එම කාර්ය වඩාත් සාර්ථකව ඉටු කර ගැනීම සඳහා තොරතුරු කේන්ද්‍රය ආරම්භ කරන ලද අතර මේ වන විට එහි කාර්යභාරය සියලුම අංශයන්හි තොරතුරු ලබාදීමේ නිලධාරීන්ගේද සහය සහිතව ඉටු කරමින් පවතී.

9.2 කර්මාන්ත සම්බන්ධතා අංශයේ අරමුණු

කර්මාන්තයට අවශ්‍ය කෙරෙන නිපුණතාවයන්ගෙන් හෙබි මානව ශ්‍රමය සැපයීමට හැකි කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයක් ඇති කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර්මාන්ත සම්බන්ධතා අංශයේ ප්‍රධාන අරමුණ ලෙස හැඳින්විය හැකිය. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් වන උප අරමුණු ක්‍රියාවට නැංවීම කර්මාන්ත සම්බන්ධතා අංශයේ ප්‍රධාන වගකීම වේ.

- කර්මාන්ත ආංශික නිපුණතා සහා, කර්මාන්ත උපදේශ කමිටු, වෘත්තීය සංවිධාන හා ආයතන, වාණිජ මණ්ඩල, කර්මාන්ත සම්බන්ධිත ප්‍රධාන ආයතන, ස්වේච්ඡා වෘත්තිකයින් සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගෙන යාම.
- කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණු කිරීම සඳහා භාවිත වන නිපුණතා සම්මත හා පුහුණු පාඨමාලා සංවර්ධනය සඳහා කර්මාන්තයේ දායකත්වය ලබා ගැනීම.

- කර්මාන්තයේ සිදුවන තාක්ෂණික වෙනස්කම් හා නව ප්‍රවණතාවයන් පිළිබඳව කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණු කිරීම් කටයුතුවල නියැලෙන අධ්‍යයන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම හා ඒ සම්බන්ධව පුහුණුවීම් අවශ්‍ය වෙතොත් ලබා දීම.

- දැනට ලබාදෙනු ලබන වෘත්තීය පුහුණුවත් කර්මාන්තයේ ඉල්ලුමත් අතර නිපුණතා පරතරයක් ඇතිදැයි විමසා බලා ඊට අවශ්‍ය නිගමන හා නිවැරදි කිරීම් ඉටු කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

- කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණුව ලබන ආධුනික ආධුනිකාවන් උදෙසා කර්මාන්ත ආශ්‍රිත පුහුණුව ලබා දීම පිළිබඳ පසුවිපරම් කිරීම හා ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු ඉටුකිරීම.

- කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණුව අවසන් කරන ආධුනික ආධුනිකාවන් කර්මාන්තයේ පවතින රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන සම්බන්ධීකරණය කොට අවශ්‍ය වැඩසටහන් පැවැත්වීම.

- විධිමත් පුහුණුවකින් තොර කර්මාන්තයේ නියුතු ශිල්පීන් හට සුදුසුකම් සහතික ලබා දීම සඳහා කර්මාන්ත ආංශික නිපුණතා සභාවන්හි සහයෝගය සහිතව ඔවුන් දැනුවත් කිරීම හා වෘත්තීය ගමන් මඟේ ඉහළට යාම සඳහා ඔවුන් සූදානම් කිරීම.

- කර්මාන්තයන් හා ඒවායෙහි රැකියා පිළිබඳව සමාජයේ සුභවාදී ප්‍රතිරූපයක් ඇති කිරීම.

- කොමිෂන් සභාවේ සේවාවන් වඩාත් ඵලදායී හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- පාසල් හැර යන සිසු සිසුවියන් සඳහා කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව පිළිබඳව දැනුවත් කොට ඔවුන් මෙම කාර්මික පුහුණු ක්ෂේත්‍රය වෙත ආකර්ෂණය කර ගැනීම.

- කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය පිළිබඳ සමස්ථ ප්‍රජාව දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

- පොදු වෘත්තීය මාර්ගෝපදේශන සේවාවන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර අනුගමනය කිරීම.

- විවිධ වෘත්තික කණ්ඩායම්, වෘත්තිකයන් හා සම්බන්ධතාවය වැඩිදියුණු කරගනිමින් කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- ජාතික වෘත්තීය සුදුසුකම් සඳහා ජාත්‍යන්තර පිළිගැනීම ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- දේශීය හා ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධ වී කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

9.3 කාර්යභාරය

ඉහත දක්වන ලද අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කර්මාන්ත සම්බන්ධතා අංශය මඟින් පහත කාර්යයන් 2020 වර්ෂය තුළදී ඉටුකර ඇත.

9.3.1. ආංශික නිපුණතා සහා 4ක් පවත්වාගෙන යාම වෙනුවෙන් ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මඟින් ලබාදෙන ප්‍රතිපාදන ආංශික නිපුණතා සහා වෙත ප්‍රතිපූරණය කිරීම සහ වඩාත් ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

9.3.1.1 ඉදිකිරීම් කර්මාන්ත ආංශික නිපුණතා සභාව.

9.3.1.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත ආංශික නිපුණතා සභාව.

9.3.1.3 නිෂ්පාදන හා ඉංජිනේරු සේවා ආංශික නිපුණතා සභාව.

9.3.1.4 සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාව.

9.3.2. කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය ඉහළ නැංවීමට අදාලව සිදුකරනු ලබන සංවර්ධන කටයුතු වෙනුවෙන් ආංශික නිපුණතා සහා සඳහා මුදල් ලබා දීම හා මඟපෙන්වීම ඉටුකිරීම.

9.3.3 ආංශික නිපුණතා සභාවන්හි ප්‍රගති සමාලෝචනය හා ඉදිරි කටයුතු පැහැදිලි කිරීම සඳහා සභාපතිවරුන් සමඟ රැස්වීම් පැවැත්වීම.

9.3.4 දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථානයන්හි සේවාව ඇගයීම් සිදුකිරීම.

9.3.5 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂෙත්‍රයේ නව සංවර්ධන මානයන් පිළිබඳව දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් පැවැත්වීම හා පවත්නා රැකියා අවස්ථාවන් පිළිබඳව මහජනතාව, පාසල් සිසුන්, පාසල් හැරගිය සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය කටයුතු කිරීම.

9.3.6 සේවාලාභීන්ගේ දැනුවත් වීම උදෙසා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් කෙරෙන කාර්යයන් පිළිබඳව තොරතුරු සංග්‍රහයක් සකස් කිරීම.

9.3.7 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිබඳව පුහුණු ආයතන හා නිලධාරීන්, මහජනතාව, පාසල් සිසුන්, දෙමාපියන් දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා සකස් කිරීම.

9.3.8 ජනමාධ්‍ය සමඟ සම්බන්ධව වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රචාරය කිරීම හා තොරතුරු බෙදා හැරීම.

9.3.9 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි පවතින්නාවූ අවස්ථාවන් පිළිබඳව කණ්ඩායම් සඳහා සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් දැනුවත් කිරීම.

9.3.10 වෘත්තීය මාර්ගෝපදේශනය හා මෘදු කුසලතා සංවර්ධනය පිළිබඳ විශේෂ වැඩසටහන් පැවැත්වීම.

9.3.11 ආංශික නිපුණතා සහාවලින් ආවරණය නොවන ක්ෂේත්‍රයන් සඳහා පළාත් මට්ටමින් වැඩසටහන් පැවැත්වීම.

9.3.12 ආංශික නිපුණතා සහාව, වාණිජ හා කර්මාන්ත මණ්ඩලය මෙන්ම දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ඒකාබද්ධව ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම.

9.3.13 ප්‍රතිපත්ති සංවර්ධනය උදෙසා ජාතික වෘත්තීය මාර්ගෝපදේශන නියාමන කමිටුවක් ක්‍රියාත්මක කිරීම.

9.3.14 පොදු වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන සංවර්ධනය හා වැඩිදියුණු කිරීමට දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථානවලට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම.

9.3.15 කර්මාන්තගත පුහුණුව විධිමත්ව සිදුකිරීම පිළිබඳ සංවාද සහ ඇගයීම් අනුව නිර්දේශ ඉදිරිපත් කිරීම.

9.3.16 නිපුණතා සංවර්ධන නිලධාරීන්, වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන්, වෘත්තීය මාර්ගෝපදේශන ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා කුසලතා වර්ධන වැඩසටහන් පැවැත්වීම.

9.3.17 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිබඳ වාර්තාමය වැඩසටහනක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

9.3.18 ජාතික වෘත්තීය සුදුසුකම් ජාත්‍යන්තරව පිළිගැනීමට ලක්කිරීම සඳහා අදාල පාර්ශවයන් සමඟ සම්බන්ධ වීම.

9.3.19 කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා විවිධ ආයතන ව්‍යාපෘති සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.

9.3.1 ආංශික නිපුණතා සහා 4ක් පවත්වාගෙන යාම වෙනුවෙන් ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මඟින් ලබාදෙන ප්‍රතිපාදන ආංශික නිපුණතා සහා වෙත අත්තිකාරම් ලෙස ලබාදීම වඩාත් ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

කර්මාන්ත සම්බන්ධතා අංශයේ දායකත්වය අනුව ආංශික නිපුණතා සහා 4ක් 2016 වර්ෂයේ සිට ක්‍රියාකාරීව පැවති අතර පසුබෑමකට ලක්ව තිබූ සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සහාවද 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක විය. ඒ අනුව පහත සඳහන් අයුරින් ආංශික නිපුණතා සහා 4ක් සහ සෞඛ්‍ය හා රැකවරණ ක්ෂේත්‍රයේ ස්වේච්ඡා කමිටුව 2020 වර්ෂයේ සක්‍රීයව ක්‍රියාකාරී මට්ටමේ පැවතිනි.

1. ඉදිකිරීම් කර්මාන්ත ආංශික නිපුණතා සහාව
2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත ආංශික නිපුණතා සහාව
3. නිෂ්පාදන හා ඉංජිනේරු සේවා ආංශික නිපුණතා සහාව
4. සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සහාව
5. සෞඛ්‍ය හා රැකවරණ ක්ෂේත්‍රයේ කමිටුව

ආංශික නිපුණතා සහා පවත්වාගෙන යාමට අවශ්‍ය පරිපාලන වියදම් මාසිකව කර්මාන්ත සම්බන්ධතා අංශයෙන් නිකුත් කරන ලද අතර ආංශික නිපුණතා සහාවලින් අදාල වියදම් පියවා ඇත.

එමෙන්ම මෙම ආංශික නිපුණතා සහාවලින් විවිධ සංවර්ධන කටයුතු රාශියක් 2020 වර්ෂය තුළදී ඉටුකරන ලද අතර එකී කාර්යයන් පහත අයුරින් වේ.

9.3.1.1 ඉදිකිරීම් කර්මාන්ත ආංශික නිපුණතා සහාව.

- තෝරාගත් ඉදිකිරීම් සමාගම් හා ඒකාබද්ධව වෘත්තීය සංසද පිහිටුවීම සඳහා ජලනල කාර්මික ශිල්පී, ගොඩනැගිලි පින්තාරුකරු සහ පෙදරේරු යන එකිනෙකට වෙනස් වෘත්තීන් තුනක යෙදෙන ඉදිකිරීම් සමාගම් තුනක් සමඟ සාකච්ඡා වාර කිහිපයක් පවත්වන ලදී. ඒ අනුව සයෑම් සිටි සිමෙන්ට් (ලංකා) - පෙදරේරු වෘත්තිය සඳහාද නිපොන් පේන්ට් සමාගම - ගොඩනැගිලි හා පින්තාරුකරු වෘත්තිය සඳහාද සෙන්ට්‍රල් ඉන්ඩස්ට්‍රිස් සමාගම (නැෂනල්) - ජලනල කාර්මික ශිල්පී වෘත්තිය සඳහාද සාකච්ඡා කර ඇත.
- සෙන්ට්‍රල් ඉන්ඩස්ට්‍රිස් (පී.එල්.සී) සමාගම සමඟ ජලනල කාර්මික ශිල්පී සංසදයක් (Plumber Guild) පිහිටුවීම සඳහා සහයෝගිතා ගිවිසුමක් අත්සන් කර ජලනල කාර්මික ශිල්පී සංසදය පිහිටුවන ලදී. මෙම අවස්ථාවේදී ජලනල කාර්මික ශිල්පීන් 60 දෙනෙකු ලියාපදිංචි කරන ලද්දේ ප්‍රථම සාමාජික කණ්ඩායම ලෙසය.
- මෙහිදී සාමාජිකයින් යාවත්කාලීන කිරීම සඳහා විශේෂ දේශනයක් පවත්වන ලදී. මෙම වෘත්තීය සංසදවල මූලික පරමාර්ථය වනුයේ අදාල වෘත්තිකයන් සඳහා සමාජ පිළිගැනීමක් ප්‍රවර්ධනය කිරීමටත් ඉතා උසස් මට්ටමේ කාර්ය සාධනයක් තහවුරු කිරීමටත්ය. මෙම වැඩසටහන දිවයිනේ අනෙකුත් පළාත්වලටත් ව්‍යාප්ත කෙරෙනු ඇත.

- කර්මාන්ත ආයතනවල තාක්ෂණික මට්ටමේ සේවක පිරිස් වෙත NVQ පද්ධතියේ ඇගයීම්කරුවන් ලෙස සේවය කිරීම සඳහා පුහුණුවක් ලබා දීම සිදු කරන ලදී. ඉදිකිරීම් සමාගම් 4ක තාක්ෂණික මට්ටමේ සේවය කරන්නන් 15 දෙනෙකු NVQ පද්ධතියේ ඇගයීම්කරුවන් ලෙස පුහුණු කිරීමට අවශ්‍ය කටයුතු යොදන ලදී. ICC සමාගමේ 05 දෙනෙකු එඩ්වඩ් සහ ක්‍රිස්ටි සමාගමේ 04 දෙනෙකු නවලෝක ඉදිකිරීම් සමාගමේ 03 දෙනෙකු සන්කෙන් ඉදිකිරීම් සමාගමේ 03 දෙනෙකු ඒ අනුව පුහුණු කරන ලදී.

- දැනට භාවිත කරනු ලබන විෂය මාලා විමර්ෂණය හා පුනරීක්ෂණය කිරීමට ඉදිකිරීම් ආංශික නිපුණතා සභාව දායකත්වය ලබාදෙන ලදී. දැනට භාවිත කරනු ලබන නිපුණතා පාදක විෂය මාලා විමර්ෂණය කිරීමට සහ පුනරීක්ෂණය කිරීමට කර්මාන්ත ක්ෂෙත්‍රයේ විශේෂඥයින්ගේ සහභාගිත්වය ලබාදීමට අවශ්‍ය කටයුතු යොදන ලදී. විමර්ෂණයට හා පුනරීක්ෂණයට භාජනය වූ වෘත්තීන් වන්නේ කොන්ක්‍රීට්කරු, කපරාරුකරු, බ්ලොක් ගල් බඳින්නා යන වෘත්තීන්ය.

- නම්‍යශීලී ඉගෙනීම් ආකෘතිය හා සම්බන්ධ වැඩසටහන් හඳුන්වාදීම සිදුකිරීම. නම්‍යශීලී ඉගෙනුම් ආකෘතිය (FLM) වැඩසටහන හඳුන්වාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 3ක් පහත සඳහන් ඉදිකිරීම් සමාගම් ආශ්‍රිතව පවත්වන ලදී.
    - ඇක්සස් ඉංජිනේරු සමාගම
    - අයිසිසි ඉංජිනේරු සමාගම
    - ELS Group සමාගම

- මාගා ඉංජිනේරු සමාගම, නම්‍යශීලී ඉගෙනුම් ආකෘති (FLM) වැඩසටහන සඳහා ඉදිකිරීම් යන්ත්‍ර ක්‍රියාකරුවන් 60 දෙනෙකු බඳවාගන්නා ලදී.

- ELS Group ඉදිකිරීම් සමාගමේ විවිධ වෘත්තීන් හි යෙදෙන වෘත්තිකයින් 65 දෙනෙකු නම්‍යශීලී ඉගෙනුම් ආකෘති වැඩසටහන සඳහා තෝරා ගන්නා ලදී.

- මාගා ඉංජිනේරු සමාගම තෝරාගත් යන්ත්‍ර ක්‍රියාකරුවන් 60 දෙනාගේ වෘත්තීය නිපුණතා පරතරය හඳුනා ගැනීමට අවශ්‍ය තාක්ෂණික සහය ඉදිකිරීම් කර්මාන්ත නිපුණතා කවුන්සිල විසින් ලබා දෙන ලදී.

- ELS Group සමාගමේ සේවයේ නිරත 40 පමණ පිරිසකගේ නිපුණතා පරතරය හඳුනා ගැනීමට අවශ්‍ය තාක්ෂණික සහාය ඉදිකිරීම් කර්මාන්ත නිපුණතා කවුන්සිල විසින් ලබා දෙන ලදී.

- පරිණත මංපෙත mature candidate route තුළින් NVQ 5 මට්ටම ලබා දීම සඳහා පැවැත්වූ ඇගයීම් සඳහා සහභාගී වීම. පරිණත මංපෙත තුළින් NVQ 5 මට්ටම සමාන සුදුසුකමක් ලබා දීමට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ පැවැත්වූ ඇගයීම් සඳහා ඉදිකිරීම් ආංශික නිපුණතා සභාව ඍජුවම සම්බන්ධ විය . ඉදිකිරීම් හා සම්බන්ධ වෘත්තීන් 2 ක් සඳහා මෙම ඇගයීම් පවත්වන ලදී. ඇගයීමට භාජනය වූ අයඳුම්කරුවන් සංඛ්‍යාව 9 දෙනෙකි.

- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවක පිරිස් සහ පුහුණු කිරීමේ ආයතනවල ගුරුවරුන් නව තාක්ෂණය සහ එහි භාවිතයන් සඳහා නිරාවරණය කිරීම. ''නිරසාර ඉදිකිරීම් කර්මාන්තය සඳහා දැව භාවිතය ආරක්ෂණය හා කල්තබා ගැනීම" යන මාතෘකාව යටතේ සම්මන්ත්‍රණයක් පවත්වන ලද අතර එය විද්වත් වෘත්තිකයන්ගේ සංසදය(OPA) සංවිධානය කර ඒකාබද්ධව පවත්වන ලදී. 90කට අධික පිරිසක් මෙම වැඩසටහනට සහභාගී වූහ.

- 'වෘත්තීමය පිරිවිතර' (වානේ වයුහයන් සෙවිලි තහඩු පර්ලින් යනාදිය) මාතෘකාව යටතේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදි. මේ සඳහා 115 කට වැඩි පිරිසක් සහභාගී වූහ. මෙම වැඩසටහනට ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, ග්‍රීන් බිල්ඩින් කවුන්සිලය, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය සහ ඉදිකිරීම් කර්මාන්ත ආයතන 20 කට වැඩි සංඛ්‍යාවක් එනම් සිවිල් කොන්ත්‍රාත්කරුවන්, සිවිල් ඉංජිනේරුවරුන්, වාස්තු විද්‍යාඥයින්, (Structural) ඉංජිනේරුවරුන්, කර්මාන්ත ආයතනවල තාක්ෂණික නිලධාරීන්, පුහුණු ආයතනවල පුහුණුකරුවන් සහභාගි වන ලදී.

- ''මොඩියුලර් සමායෝජනය හා සම්මතකරණය'' මාතෘකාව යටතේ තවත් සම්මන්ත්‍රණයක් පැවැත්වීමට සියලු කටයුතු සංවිධානය කරන ලදී. මේ සඳහා අනුග්‍රහය-ඒකල ප්‍රී ස්ට්‍රෙස්ඩ් කොන්ක්‍රීට් ඉන්ඩස්ට්‍රීස් දරන ලද අතර බස්නාහිර පළාතට පැන වූ ඇඳිරි නීතිය නිසා මෙය තාවකාලිකව අත්හිටුවීමට සිදුවිය.

- පුහුණු මධ්‍යස්ථානවල පුහුණුලාභීන් ''රැකියා ගත පුහුණුව" සඳහා ස්ථාන ගත කිරීම. ඉදිකිරීම් වෘත්තීන්වල පුහුණුලාභීන් 13 දෙනෙක් පහත සඳහන් කර්මාන්ත ආයතනවල රැකියාගත පුහුණුව සඳහා ස්ථානගත කරන ලදී. එඩ්වඩ් සහ ක්‍රිස්ටි සමාගම සිසුන් 07දෙනෙකුද නවලෝක කන්ස්ට්‍රක්ෂන්ස් සමාගම සිසුන් 03 දෙනෙකුද මාගා එන්ජිනියරින් සමාගම සිසුන් 03 දෙනෙකුද ස්ථානගත කරන ලදී.

- ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින ''නිපුණතා පරතරය'' විමර්ශනය කිරීමට සමීක්ෂණයක් පැවැත්වීම. මෙම සමීක්ෂණය මෙහෙයවීම සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීමට සම්මත ක්‍රමවේදයන් අනුගමනය කරන ලදී. මෙම නිපුණතා පරතර විමර්ෂණ අභ්‍යාසයේ මූලික පර්යේෂණ පැවැත්වීම හා ගුණාත්මක හා ප්‍රමාණාත්මක ඇගයීම් උපකරණ සකස් කිරීම නිම කරන ලදී. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද වාර්තා ඉදිකිරීම් ආංශික නිපුණතා සභාව විසින් විමර්ෂණය කර අනුමත කරන ලදී.

9.3.1.2 තොරතුරු හා සන්නිවේදන තක්ෂණ කර්මාන්ත ආංශික නිපුණතා සභාව.

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුරුවරුන් හා සිසුන් 1604ක් විවිධ තාක්ෂණික විෂයන් සඳහා පුහුණු කිරීම. මේ සඳහා වැඩසටහන් 12ක් පැවැත්විය.

- ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 4 යටතේ ආවරණය නොවන නමුත් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ විශාල ඉල්ලුමක් ඇති විෂය ධාරාවන් දෙකක් (Mobile Application Development) සහ (Game Development) මුල සිට සරලව ඉගෙන ගන්නා ආකාරය සහ එම මෘදුකාංග නිපදවීම පිළිබඳ පුහුණු කිරීම. එම වැඩසටහන්වල පටිගත කිරීම් යූ ටියුබ් හරහා ලබාගෙන ඉගෙන ගැනීමට අවශ්‍ය පහසුකම් ලබාදීම. Mobile Application Development සඳහා ගුරුවරුන් හා සිසුන් 627ක් හා Game Development සඳහා ගුරුවරුන් 344ක් සහභාගි වී ඇත.

- YOULEAD ආයතනයේද සහභාගිත්වය ඇතිව වෘත්තීය මාර්ගෝපදේශකවරුන් 100ක් එම ක්ෂේත්‍රයට විෂය ධාරාවන් 5ක් ඔස්සේ වැඩසටහන් 5කින් පුහුණු කිරීම.

- YOULEAD ආයතනයේ සහභාගිත්වයෙන් තවත් වෘත්තීය පුහුණු උපදේශකවරුන් 100ක් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ඇති නවතම ප්‍රවණතාවන් පිළිබඳ දැනුවත් කිරීම. මෙය 2020 ජනවාරි මස 06වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදි පැවැත්වීමට යෙදුනි.

- තොරතුරු තාක්ෂණ නිපුණතා සහාවේ කාර්යභාරය හා වසර 2025 දැක්ම පිළිබඳව විවිධ පාර්ශවකරුවන් දැනුවත් කිරීම. එමෙන්ම අතිගරු ජනාධිපතිතුමන්, විෂය භාර ඇමතිතුමිය සහ අමාත්‍යාංශ ලේකම්වරුන් හට 2025 දැක්ම පිළිගැන්වීම.

- ලෝක නිපුණතා දිනයට සමගාමීව ආසියා ශාන්තිකර කලාපීය අනෙකුත් රටවල් සමඟ නිපුණතා දිරිගැන්වීම සඳහා අන්‍යෝන්‍ය සහයෝගීතාව වර්ධනය කරගැනීමට කතිකාවතක් ආරම්භ කිරීම. බංගලාදේශය, පකිස්ථානය සහ එංගලන්තය නියෝජනය කරමින් එම රටවල තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධන සම්මේලනවල නිලධාරීන් මේ සඳහා සහභාගි විය.

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ තොරතුරු තාක්ෂණ විෂයට අදාල නිපුණතා පරතරය හඳුනා ගැනීම සඳහා නිපුණතා පරතර සමීක්ෂණය ආරම්භ කිරීම.

- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාලව විරැකියාවට පාදක වන සාධක හඳුනාගැනීමට අභ්‍යන්තර පර්යේෂණ දෙකක් ආරම්භ කිරීම.

- වෘත්තීය මාර්ගෝපදේශන කාර්යය සඳහා භාවිත කිරීමට රැකියා පිළිබඳ විස්තර ඇතුළත් Job Outlooks තොරතුරු තාක්ෂණ සහය ශිල්පී, දත්ත විශ්ලේෂක, නිර්මාණ සැලසුම් ශිල්පී සහ මෘදුකාංග සංවර්ධක යනාදි ක්ෂේත්‍ර සඳහා සංවර්ධනය කිරීම.

9.3.1.3 නිෂ්පාදන හා ඉංජිනේරු සේවා ආංශික නිපුණතා සහාව.

- නිෂ්පාදන සහ ඉංජිනේරු සේවා අංශයේ ආයතන සහ නිෂ්පාදන හා ඉංජිනේරු සේවා ආංශික නිපුණතා සහාව අතර සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මෙහිදී අංශ 17ක් යටතේ ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලද අතර මීට සමගාමීව අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි නිෂ්පාදන සහ ඉංජිනේරු සේවා අංශයේ ආයතන සමඟ සම්බන්ධවීමේ වැඩසටහන් පවත්වන ලදී. ඒ සඳහා කාර්මික අංශ වන ප්ලාස්ටික් අංශය, රබර් අංශය, ලෝහ ආශ්‍රිත කර්මාන්ත අංශය, වාත්තු අංශය, දැව ආශ්‍රිත කර්මාන්ත අංශය සහ කෘෂිකාර්මික අංශය නියෝජනය විය.

- නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය මඟින් සංවිධානය කරනු ලබන Flexible Learning Module (FLM) වැඩසටහන සඳහා නිෂ්පාදන සහ ඉංජිනේරු සේවා අංශයේ ආයතන යොමු කිරීම. මේ සඳහා වැඩමුළු කිහිපයක් සංවිධානය කරනු ලැබූ අතර ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය පැවැත්වූ වැඩසටහන සඳහා පහත සඳහන් අංශවල දායකත්වය ලබාදෙන ලදී.
    - මෝටර් රථ අංශය
    - කෘෂිකාර්මික අංශය
    - ඇඟලුම් නිෂ්පාදන අංශය
    - ආහාර සැකසුම් අංශය

- Sinhagiri Pvt Ltd, Fame International Pvt Ltd , United Motors PLC, Cleantech Pvt Ltd වැනි පෞද්ගලික අංශයේ ද කණ්ඩායම් වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

- Employee Linked Training Purchased Programme වැඩසටහන සඳහා අවශ්‍ය පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර දීම. මෙහිදී කිරිදොවන යන්ත්‍ර ක්‍රියාකරු, ඒකාබද්ධ අස්වනු නෙලන්නා, නිෂ්පාදන සුපරීක්ෂක යනාදී රැකියා අවස්ථා සඳහා පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර දීම.

- නිෂ්පාදන සහ ඉංජිනේරු සේවා අංශයේ රැකියා දැක්ම නිර්මාණය කිරීම. ක්ෂේත්‍ර ගණනාවක් යටතේ රැකියා දැක්ම නිර්මාණය කරන ලද අතර මේ තුළින් තරුණ තරුණියන් හට පවතින රැකියා අවස්ථා පිළිබඳ මනා අවබෝධයක් ලබාදෙන ලදී.

- ඒ අනුව කිරි දොවන යන්ත්‍ර ක්‍රියාකරු, රෝද හතරේ ට්‍රැක්ටර් ක්‍රියාකරු, ඇලුමිනියම් පිරිසැකසුම්කරු, සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා කාර්මික ශිල්පී, වෑද්දුම්කරු සහ පෑස්සුම් ශිල්පී යන රැකියා සඳහා රැකියා දැක්ම නිර්මාණය කරන ලදී.

- නිෂ්පාදන සහ ඉංජිනේරු සේවා අංශයේ පවතින නිපුණතා පරතරය අඩුකිරීම සඳහා ජාතික පුහුණු සම්මත නිර්මාණය කිරීම. ඒ අනුව වාත්තු තාක්ෂණික ශිල්පී, රබර් කිරි සැකසුම් කාර්මික ශිල්පී යන අංශවල නිර්මාණ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

- ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය මඟින් කරන ලද ඉල්ලීමකට අනුව නිෂ්පාදන හා ඉංජිනේරු සේවා අංශයේ ඇගයීම්කරුවන් ලබාදීම සඳහා කටයුතු කිරීම. මේ යටතේ ක්ෂේත්‍ර කිහිපයක් සඳහා සම්පත්දායකයන් 10 දෙනෙකු පමණ ලබාදී ඇත.

9.3.1.4 සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාව.

- ජාතික වෘත්තීය මාර්ගෝපදේශ මෙහෙයුම් කමිටු රැස්වීමට සහභාගී වීම හා කමිටු නියෝජනය කිරීම.

- වර්ෂය පුරා සංචාරක ආංශික නිපුණතා සභාව නියෝජනය කරන අංශ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

- වාර්ෂික මහා සභා රැස්වීම (2018-2019) ජූනි මස 23 වන දින ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) ශ්‍රවණාගාරයේදී පැවැත්වීම.

- වසංගතය හේතුකොටගෙන සංචාරක ව්‍යාපාරයේ රැකියා අවස්ථා අහිමිවූ පුද්ගලයින් හට විකල්ප රැකියා අවස්ථා ගැන සාකච්ඡා කිරීම සඳහා අතිරේක ලේකම්, නිපුණතා අංශ සංවර්ධන වැඩසටහන සහභාගිත්වයෙන් රැස්වීමක් පැවැත්වීම.

- විකල්ප රැකියා ලෙස සෞඛ්‍ය සත්කාර (Health Care) වැඩිහිටි සත්කාර (Elder Care) කෘෂිකර්මාන්ත සහ භාෂා ඉගැන්වීම වඩාත් සුදුසු අංශයන් ලෙස තෝරා ගැනීම.

- සංචාරක ආංශික නිපුණතා සභාව වෙබ් අඩවිය (TISC-LK)නිර්මාණය කිරීම.

- Facebook page (මුහුණුපොත) Linkdin හා Twitter යන සමාජ ගිණුම් නිර්මාණය කර ක්ෂේත්‍රයේ තොරතුරු ප්‍රචාරය කිරීම.

- නවෝත්පාදන සමාජ සංවර්ධන පදනම විසින් මෙහෙයවන ලද සම්ප්‍රදායික නොවන වෘත්තීය සඳහා කාන්තා සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමේ වැඩමුළුවට සහභාගී වීම හා අදහස් ලබාදීම.

- කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සංචාරක කර්මාන්තයට එල්ල වී ඇති අහිතකර බලපෑම හා සංචාරක කර්මාන්තය නැවත පණගැන්වීමට අවශ්‍ය පුහුණුව තක්සේරු කිරීමටත් නිපුණතා පරතරය හඳුනා ගැනීමට සමීක්ෂණයක් පැවැත්වීම.

- බ්‍රිටිෂ් කවුන්සිල් (British Council) හා සම්බන්ධවී ඉංග්‍රීසි භාෂා පාඨමාලාව අන්තර්ජාලය ඔස්සේ නොමිලේ හැදෑරීමට සාමාජිකයින්ට හා ක්ෂේත්‍රයේ සිසු සිසුවියන්ට අවස්ථාව ලබාදීම.

- ඉවුම් පිහුම් නිරූපණ වැඩසටහන ජාත්‍යන්තර කම්කරු සංවිධානය කාර්ය්‍ය මණ්ඩලය සඳහා පැවැත්වීම.

- පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන යටතේ කමිටු සාමාජිකයින් දෙදෙනෙකුගේ සම්පත්දායකත්වය සහිතව ආහාර පාන හා උපදේශකයන් පුහුණු කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම.

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් පවත්වන ජාතික සංචාරක මාර්ගෝපදේශන හා සංචාරක රියදුරු මාර්ගෝපදේශන පාඨමාලා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතන (SLITHM) තුළින්ද පැවැත්වීමට අනුමැතිය ලබාදීමට අවශ්‍ය කටයුතු සැලැස්වීම.

- වාර්ෂික සභා රැස්වීම (2019-2020) දෙසැම්බර් මස 23 වන දින අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පැවැත්වීම.

9.3.2 කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය ඉහළ නැංවීමට අදාලව සිදුකරනු ලබන සංවර්ධන කටයුතු වෙනුවෙන් ආංශික නිපුණතා සභා සඳහා මුදල් ලබාදීම හා මඟපෙන්වීම ඉටුකිරීම.

කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් ආංශික නිපුණතා සභා විසින් සිදුකරනු ලබන සංවර්ධන කාර්යයන් සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනාවලීන් ඇගයීමට ලක්කරමින් එම යෝජනාවලීන්ගෙන් ක්‍රියාත්මක කළ හැකි හා ක්‍රියාකාරකම්වල අවශ්‍යතාවය අනුව ප්‍රතිපාදන ලබාදීම සඳහා කර්මාන්ත සම්බන්ධතා අංශය ක්‍රියාකරනු ලබයි. එහෙත් 2020 වර්ෂයේදී කෝවිඩ් 19 හේතුවෙන් සංවර්ධන කාර්යයන් සඳහා මුදල් ප්‍රතිපාදන ඉල්ලුම් කර නොමැත.

9.3.3 ආංශික නිපුණතා සභාවන්හි ප්‍රගති සමාලෝචනය හා ඉදිරි කටයුතු පැහැදිලි කිරීම සඳහා සභාපතිවරුන් රැස්වීම් පැවැත්වීම.

ආංශික නිපුණතාවන්හි ප්‍රගති සමාලෝචනය හා ඉදිරි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදි ඇතිවන ගැටළු නිරාකරණය සඳහා මාසිකව සභාපතිවරුන්ගේ රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ අතර 2020 වර්ෂයේදී රැස්වීම් 3ක් පමණක් පවත්වන්නට යෙදුනි. අවශ්‍ය සන්නිවේදන කටයුතු ඊමේල් මගින් සිදුකරන ලදි.

9.3.4 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව සංවර්ධන මානයන් පිළිබඳව දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් පැවැත්වීම හා පවත්නා රැකියා අවස්ථාවන් පිළිබඳව මහජනතාව, පාසල් සිසුන්, පාසල් හැරගිය සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

විවිධ රැකියාවන්වලට අදාලව ඒ ඒ රැකියාවන්හි ව්‍යුහය දැක්වෙන පරිදි Job Outlooks නිර්මාණය කරන ලදී. විශේෂයෙන්ම තොරතුරු සන්නිවේදන තාක්ෂණයට අදාලව හා නිෂ්පාදන හා ඉංජිනේරු තාක්ෂණයට අදාලව Job Outlooks 11ක් සම්පාදනය කොට ඒවා සිංහලයට පරිවර්තනය කරන ලදී.

9.3.5 සේවාලාභීන්ගේ දැනුවත් වීම උදෙසා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් කෙරෙන කාර්යයන් පිළිබඳව තොරතුරු සංග්‍රහයක් සකස් කිරීම.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සේවාවන් මහජනතාව අතරට ගෙන යාම හා නිවැරදි තොරතුරු ලබාදීම යන කරුණු පෙරදැරි කරගනිමින් තොරතුරු සංග්‍රහයක් මුද්‍රණය කිරීම 2019 වර්ෂයේදී සිදුකළ අතර එම තොරතුරු සංග්‍රහය ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණයට සැලසුම් කිරීම 2020 වර්ෂයේදී සිදුකරන ලදී.

9.3.6 අමාත්‍යාංශ යටතේ පවත්නා පුහුණු ආයතන හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිබඳව මහජනතාව, පාසල් සිසුන්, දෙමාපියන් දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා සකස් කිරීම

දැනට භාවිතයේ ඇති අත්පත්‍රිකා යාවත්කාලීන කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලද අතර කෝවිඩ් 19 වසංගත තත්ත්වය තුළදී Facebook සහ Youtube මඟින් අදාල ප්‍රචාරණ කටයුතු ඉටු කිරීමට අවශ්‍ය කටයුතු කරන ලදී. මේ සඳහා E-flyer, පෝස්ටර්, බැනර් සකස් කර ප්‍රචාරණය කරන ලදී.

9.3.7 ජනමාධ්‍ය සමඟ සම්බන්ධව වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රචාරය කිරීම හා තොරතුරු බෙදා හැරීම.

කාර්මික වෘත්තීය අධ්‍යාපනය පිළිබඳව තොරතුරු බෙදාහැරීම හා වෘත්තීය සංවර්ධනයන් පිළිබඳ දැනුවත් කිරීම උදෙසා ජනමාධ්‍ය උපයෝගී කරගනිමින් මහජනතාව දැනුවත් කිරීම මහජන සම්බන්ධතා අංශයෙන් 2020 වර්ෂයේදී සිදුකළ අතර වැඩසටහන් රැසක් සඳහා සහභාගී විය. ජාතික ගුවන් විදුලිය මෙන්ම පෞද්ගලික ගුවන් විදුලි වැඩසටහන්, රූපවාහිනී වැඩසටහන් සඳහා මේ යටතේ සම්පත්දායකත්වය ලබාදෙන ලදී. අප කොමිෂන් සභාව මඟින් කරන ලද ඉල්ලීමකට ලද ප්‍රතිචාර අනුව රූපවාහිනී වැඩසටහන් 05ක් සඳහා සහ ගුවන් විදුලි වැඩසටහන් 04ක් සඳහා සහභාගී වන ලද අතර කොමිෂන් සභාවේ සමස්ථ කාර්යභාරයන් ආවරණය වන පරිදි වැඩසටහන් 06ක් ජාතික ගුවන් විදුලිය මඟින් ප්‍රචාරය කරන ලදී.

කෝවිඩ් 19 ප්‍රථම අවස්ථාවේදී පුහුණු මධ්‍යස්ථාන වසා දැමීම නිසා විකල්ප ඉගැන්වීමේ ක්‍රමවේදයක් ලෙස චැනල් අයි නාලිකාව සහ නේත්‍රා නාලිකාව මඟින් කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයට අදාල භාෂා ත්‍රිත්වයෙන්ම පුහුණු වැඩසටහන් 80 ක් පමණ විකාශනය කෙරුණි.

තවද ස්වාධීන රූපවාහිනී හත්වෙනි පැය වැඩසටහන මඟින් සජීවී වැඩසටහන් සහ සිව්මංසල වැඩසටහන් 03ක් මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමවේදය සහ කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය පිළිබඳව දැනුවත් කරන ලදී.

ජාතික ගුවන් විදුලියේ සාර ප්‍රභාගිර සජීවී වැඩසටහන් 06ක් පැවැත්විය.ජාතික ගුවන් විදුලියේ ස්වදේශීය සේවය ඔස්සේ 2020/09/02 විකාශනය වූ ජනහමුව වැඩසටහනට සහභාගි විය. තවද රංගිරි ගුවන් විදුලියේ සජීවී වැඩසටහනක් ලෙස 2020/08/19 දින පැවැත්වූ වැඩසටහනට සහභාගි වෙමින් කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ නව ප්‍රවනතා පිළිබඳව මහජනයා දැනුවත් කරන ලදී.

ෆේස් බුක් පිටුව ඔස්සේ තෘතීයික හා වෘත්තීය අධාපන කොමිෂන් සභාව මඟින් ඉටුකරන ලබන කාර්යන් පිළිබඳව දැනුවත් කිරීම් 25 ක් ද නිපුණතා අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් නිර්මාණය කළ වට්ස්ඇප් සමූහය ඔස්සේ තෘතීයික හා වෘත්තීය අධාපන කොමිෂන් සභාව මඟින් ඉටුකරන ලබන කාර්යන් පිළිබඳව දැනුවත් කිරීම් 18 ක් හුවමාරු කරන ලදී.

චැනල් අයි නාලිකාව සහ නේත්‍රා නාලිකාව මඟින් කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයට අදාල භාෂා ත්‍රිත්වයෙන්ම පුහුණු වැඩසටහන් 60 ක් යූ ටියුබ් වීඩියෝ මාධ්‍ය මඟින් දැනුවත් කිරීමට සහ බාගත කිරීමට හැකිවන පරිදි ඇතුළත් කරන ලදී.

තවද තෘතීයික හා වෘත්තීය අධාපන කොමිෂන් සභාව මඟින් ඉටුකරන ලබන කාර්යන් පිළිබඳව මෙන්ම දැනුවත් කිරීම් 6 ක් ඇතුළත් කරන ලදී.

9.3.8 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින්නාවූ අවස්ථාවන් පිළිබඳව තෝරාගත් කණ්ඩායම් සඳහා විශේෂ වැඩසටහන් පැවැත්වීම.

කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයෙහි ප්‍රතිලාභ සියලුම පුරවැසියන්ට එකසේ ලැබිය යුතු අතර එහි එක් පියවරක් ලෙස වෘත්තීය ක්ෂේත්‍රයට දායකත්වය ලබා ගැනීම අරමුණු කරගනිමින් හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති නවක උපාධිධාරීන් හට කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව ගම් මට්ටමින් දැනුවත් කිරීමට අවශ්‍ය වැඩසටහන් 10ක් දින 5ක් තුළදී පවත්වන්නට යෙදුනි. ඒ සඳහා නවක උපාධිධාරීන් 265ක් සම්බන්ධ විය. මේ සඳහා සම්පත්දායකත්වය තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කර්මාන්ත සම්බන්ධතා අංශය මඟින් සිදුකෙරිනි.

9.3.9 ආංශික නිපුණතා සභාවලින් ආවරණය නොවන ක්ෂේත්‍රයන් සඳහා පළාත් මට්ටමින් වැඩසටහන් පැවැත්වීම.

එක් එක් දිස්ත්‍රික්කයන්වල කර්මාන්තකරුවන්, පුහුණු ආයතන, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනයට සම්බන්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන්ද එමෙන්ම වාණිජ හා කර්මාන්ත මණ්ඩලය ඒකාබද්ධව රැකියාවලට අනුකූලව පුහුණු අවශ්‍යතා හඳුනාගනිමින් ඒවා වැඩිදියුණු කිරීම, කර්මාන්තයට අවශ්‍ය මෘදු කුසලතා වර්ධනය මෙන්ම විවිධ ගැටළු නිරාකරණය කරමින් කර්මාන්ත ගත පුහුණුව වඩා ශක්තිමත් කර පුහුණු ආයතන හා කර්මාන්තකරුවන් අතර වඩාත් හොඳ සම්බන්ධතාවයක් ගොඩනැගීම මෙහි පරමාර්ථය විය. ඒ අනුව 2020/03/12 වෙනි දින මාතලේ දිස්ත්‍රික් කර්මාන්ත අංශික සංසදය පිහිටුවීමේ වැඩමුළුව 50 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මාතලේ නාඋල වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ශ්‍රවනාගාරයේ පැවැත්විය.

වෙළඳපොල රැකියා අවස්ථා පහසුකම් සැලසීම සම්බන්ධව දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව නිපුණතා අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් හා මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙහෙය වීමෙන් 110 දෙනෙකුගේ සහභාගීත්වයෙන්

මොනරාගල දිස්ත්‍රික්කය තුළ 2020 අගෝස්තු මස 13 වන දින උදෑසන 10.00 ට මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවත්වන ලදී. එමෙන්ම 2020 දෙසැම්බර් 12 දින බදුල්ල දිස්ත්‍රික් කාර්යාලයේදීද මෙහෙයුම් කමිටුව පවත්වන ලද අතර ඒ සඳහා 112 දෙනෙකු සහභාගි විය.

පහත සඳහන් අනු කමිටු පිහිටු වීම හා අදාල නිළධාරීන් පත්කර ගැනීම සිදු කෙරිණි.

- පාසල් අනු කමිටුව
- කර්මාන්ත අනු කමිටුව
- තෘතීයික හා කාර්මික සංවර්ධන අනු කමිටුව
- ව්‍යවසායකත්ව සංවර්ධන අනු කමිටුව
- ශ්‍රම වෙලඳපොළ හා රැකියා අනු කමිටුව
- සම්පත් යථාර්තීකරණ අනු කමිටුව

කර්මාන්තය සමඟ නිරන්තර සම්බන්ධතාවය පවත්වා ගැනීමේ අරමුණින් මහනුවර දිස්ත්‍රික්කයේ කර්මාන්තකරුවන් ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමවේදය සහ කර්මාන්තයට එයින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2020/03/05 දින පෙරවරු 9.30 සිට 10.30 දක්වා ආයෝජන කලාප ශ්‍රවනාගාරය, (BOI) පල්ලේකැලේ පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා කර්මාන්ත ආයතන 27ක් සම්බන්ධ විය. පොළොන්නරුව, හම්බන්තොට, ගාල්ල, යාපනය දිස්ත්‍රික්කයන්හි වැඩසටහන් සංවිධානය කළද කෝවිඩ් 19 තත්ත්වය තුළ පැවැත්වීමට නොහැකි විය.

9.3.10 ආංශික නිපුණතා සභාව, වාණිජ හා කර්මාන්ත මණ්ඩලය මෙන්ම දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ඒකාබද්ධව ප්‍රචාරණ වැඩසටහනක් පැවැත්වීම.

දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන සමඟ සම්බන්ධව සැලසුම් කරන ලද වැඩසටහන් 2020 වසර තුළදී ක්‍රියාත්මක නොකරන ලද අතර ආංශික නිපුණතා සභා සහ කර්මාන්ත මණ්ඩල ආයතන සමඟ කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

9.3.11 ප්‍රතිපත්ති සංවර්ධනය උදෙසා ජාතික වෘත්තීය මාර්ගෝපදේශන නියාමන කමිටුවක් ක්‍රියාත්මක කිරීම.

කාර්මික හා අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා වෘත්තීය මාර්ගෝපදේශන සේවාව වඩාත් ශක්තිමත් කරමින් ජාතික වෘත්තීය මාර්ගෝපදේශන නියාමන කමිටුවක් ස්ථාපිත කල අතර ඒ සඳහා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ මාර්ගෝපදේශන කටයුතුවල නියැලෙන ආයතන බොහෝ ගණනාවක නියෝජිතයන් සහභාගී විය. එහිදී වෘත්තීය මාර්ගෝපදේශන සේවාව පොදු සේවාවක් ලෙස ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලද අතර ඒ අනුව වෘත්තීය මාර්ගෝපදේශන සේවාව පිළිබඳ පුළුල්ව අධ්‍යනය සඳහා සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි කමිටු පිහිටුවා ඇති අතර 2020 වර්ෂයේදී රැස්වීම් 2ක් පවත්වන්නට යෙදුනි.

9.3.12 පොදු වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන සංවර්ධනය හා වැඩිදියුණු කිරීමට දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථානවලට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම.

දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන අලංකාරවත්ව සිත් ඇදගන්නා සුළු ආකාරයට පවත්වාගෙන යාමට අවශ්‍ය මධ්‍යස්ථාන 04 ක් සඳහා මුදල් ප්‍රතිපාදන අදාල ප්‍රධාන කාර්යාලය වෙත ලබා දෙන ලදී. ඒ අනුව දිස්ත්‍රික් මාර්ගෝපදේශන මධ්‍යස්ථාන පිහිටුවා ඇති වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ කටුගස්තොට, කළුතර, පොළොන්නරුව හා පුත්තලම යන මධ්‍යස්ථානවලට ප්‍රතිපාදන ලබා දී සංවර්ධන කටයුතු නිමකර ඇත.

9.3.13 කර්මාන්තගත පුහුණුව විධිමත්ව සිදුකිරීම සඳහා විමර්ශන කටයුතු සිදුකිරීම.

කර්මාන්තගත පුහුණුව වඩාත් විධිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට සාකච්ඡා වාර දෙකක් ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සහභාගිත්වය සහිතව පවත්වන ලද අතර Online ක්‍රමවේදයක් තුළින් කර්මාන්තගත පුහුණුව ක්‍රියාත්මක කිරීමට ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී. මේ අනුව ඉදිරි පියවර ගැනීමට ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය එකඟතාවය පළකර ඇත.

9.3.14. නිපුණතා සංවර්ධන නිලධාරීන්, වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන්, වෘත්තීය මාර්ගෝපදේශන ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා කුසලතා වර්ධන වැඩසටහන් පැවැත්වීම.

කාර්මික වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව ප්‍රජාව අතරට නිවැරදිව ලබා දෙන ප්‍රධානතම නිලධාරී සමූහය වන්නේ වෘත්තීය මාර්ගෝපදේශන හා නිපුණතා සංවර්ධන නිලධාරීන්ය. එම නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම හා නවතම දත්තයන් පිළිබඳව දැනුවත් කිරීම තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කර්මාන්ත සබඳතා අංශයෙන් ක්‍රියාත්මක කරන ලද විශාල සේවයකි. එහිදී වෘත්තීය මාර්ගෝපදේශනයේ නියුතු නිලධාරීන් 25ක් උදෙසා දින තුනක හෝටල් හා සංචාරක අංශය පිළිබඳව පුහුණු වැඩමුළුවක් යූ ලිඩ් ආයතනය සමඟ ඒකාබද්ධව පවත්වන්නට යෙදුනි. මෙම වැඩමුළුව සඳහා ක්ෂේත්‍ර චාරිකාවක්ද ඇතුළත් කොට තිබුණි.

එමෙන්ම වෘත්තීය මාර්ගෝපදේශනයේද නියුතු නිලධාරීන් 50 දෙනෙකු වෙනුවෙන් තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික වැඩමුළු දෙකක් නේවාසිකව පැවැත්වීම. මෙම වැඩමුළු ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්වූ අතර නවතම තොරතුරු තාක්ෂණය පිළිබඳ මෙහිදී ප්‍රායෝගිකව සිදුකරන ලදී. මේ සඳහාද යූලිඩ් ආයතනය අනුග්‍රහය සපයන ලදී.

9.3.15. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සඳහා වාර්තාමය වැඩසටහනක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

සාරප්‍රභාගිර ගුවන් විදුලි වැඩසටහන තුළ විකාශනය කරන ලද සියලුම වැඩසටහන් ඇතුළත් කර වැඩසටහනක් සකස් කර තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා Youtube ඇතුළත් කර ඇත.

9.3.16 ජාතික වෘත්තීය සුදුසුකම් ජාත්‍යන්තරව පිළිගැනීමට ලක්කිරීම සඳහා අදාල පාර්ශවයන් සමඟ සම්බන්ධ වීම.

ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමවේදය ජාත්‍යන්තරව පිළිගැනීමට ලක්කිරීම සඳහා සෞදි අරාබිය සුදුසුකම් පිළිගැනීමට ලක්කරන ආයතනය සමඟ ඒකාබද්ධව අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලද අතර ඒ සඳහා විදේශ අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එමෙන්ම එමිරේට් (UAE) රාජ්‍ය සමඟද සාකච්ඡා වටයක් පවත්වන ලදී. ඊට අමතරව අනෙකුත් රටවල් සමඟ අවශ්‍ය පරිදි සම්බන්ධවීමට ඉල්ලීම් විදේශ කටයුතු අමාත්‍යාශය වෙත ඉදිරිපත් කර ඇත.

9.3.17 කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා විවිධ ආයතන ව්‍යාපෘති සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.

ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ලෝක කම්කරු සංවිධානය, Youlead, KOICA මෙන්ම ඉන්දියා Schneider Electric සමඟ සම්බන්ධ වී කටයුතු කරන ලදී. Schneider Electric සමඟ සාකච්ඡා කරන ලද සත්කාරක වැඩසටහන යටතේ විදුලි කාර්මික පුහුණු ආයතන සංවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

කර්මාන්ත සම්බන්ධතා අංශය විසින් සිදුකරන ලද විශේෂ වැඩසටහන්

- කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ආධාර සපයන ව්‍යාපෘති/ වැඩසටහන් සමඟ කටයුතු කිරීම.
- වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා ජාතික නිපුණතා සම්මතයක් හා විෂය මාලාවක් සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- සෞඛ්‍ය හා රැකවරණ කවුන්සිලය සමඟ මාසික රැස්වීම් පැවැත්වීම හා එහි සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම. එම කවුන්සිලය මඟින් සකස් කරනු ලබන ජාතික නිපුණතා සම්මතයන් හා විෂය මාලාවන් සම්බන්ධීකරණය කිරීම.
- වෘත්තීය මාර්ගෝපදේශනයෙහි නියුතු නිලධාරීන් කාණ්ඩගත කිරීම සඳහා දත්ත පද්ධතියක් ස්ථාපිත කොට ඒ සඳහා තොරතුරු එක්රැස් කිරීම.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සේවාවන් පිළිබඳව සමස්ථ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ප්‍රදර්ශන ඇතුළු වැඩසටහන් සංවිධානය කිරීම හා සහභාගී වීම. 2020 පෙබරවාරි මස 28 දින සිට මාර්තු මස 01 දින දක්වා හෝමාගම ජනාධිපති විද්‍යාලයේදී පැවැත්වූ ජංගම සේවය සඳහා සහභාගිවෙමින් ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමවේදය සහ කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයට අදාල තොරතුරු ලබා දීම සිදු කරන ලදී.
- Touch Your Future නිපුණතා හා නව නිර්මාණ තරගාවලිය 2020 පෙබරවාරි මස 29 වන දින දිවයින පුරා මධ්‍යස්ථාන 03කදී මූලික වටයේ තරඟ අපේක්ෂකයින් 111 වෙනුවෙන් පවත්වන ලදී .

- ජාතික වශයෙන් පවත්වන ක්ෂේත්‍රයට සම්බන්ධ වැඩසටහන් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නියෝජනය ලබාදීම.

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රතීතනය ලත් පෞද්ගලික පුහුණු ආයතනවල ගැටළු නිරාකරණය කරමින් සබඳතාව මනා ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.

- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සඳහා කර්මාන්ත සම්බන්ධතා අංශයේ නිලධාරීන් සම්බන්ධ වූ අතර ප්‍රාදේශීය කර්මාන්ත සභා හා ඒකාබද්ධව කටයුතු කිරීම සඳහා මෙම කමිටුවලට යෝජනා ඉදිරිපත් කිරීම.

- ආංශික නිපුණතා සභාවන්ගෙන් ආවරණය නොවන අනෙකුත් ක්ෂේත්‍රයන් සඳහා ස්වේච්ඡාවෙන් කටයුතු කළ හැකි ප්‍රවීණයන්ගේ සහය ලබාගැනීමට පුවත් පත් දැන්වීම් පළකොට අයදුම්පත් කැඳවීම

10.0 තොරතුරු පද්ධති අංශය

කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශය මගින් විවිධ වූ තොරතුරු එක්රැස් කර අවශ්‍ය පරිදි පිරිසැකසුම් කර එම තොරතුරු අදාල පාර්ශවයන්ට ලබාදීමේ කාර්යය ඉටු කරනු ලැබේ. මෙම කාර්ය සඳහා පරිගණක හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගන්නා අතර,එමගින් තොරතුරු භාවිතයට ගැනීමට වැඩි පහසුවක් හා උපයෝගීතාවයක් ඇති වේ. තොරතුරු සාමුහිකව පරිහරණය කිරීම තුලින් ආයතනික සංවර්ධනය ලඟා කර ගත හැකිය. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශයෙන් මෙම අත්‍යවශ්‍ය තොරතුරු සේවාව විධිමත් පරිදි ලබාදීම සඳහා නවීනතම තාක්ෂණය උපයෝගි කරගනී. එම තොරතුරු ආයතනික දියුණුව සඳහා සාර්ථකව පරිහරණය කිරීමට හැකි වන අයුරින් උපාය මාර්ග හා විධිවිධාන සැලසීම මගින් දිනපතා සිඝ්‍රයෙන් වර්ධනය වන තොරතුරු ගබඩාව තුලින් සිදුවේ.

තොරතුරු පද්ධති අංශයේ ප්‍රධාන අරමුණු

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යයන් විධිමත් හා පහසු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු පද්ධති සංවර්ධනය කිරීම, ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම සිදුකරයි. තොරතුරු පද්ධති අංශය අධ්‍යක්ෂ, වැඩ බලන ශ්‍රම වෙළෙඳපොළ විශ්ලේෂක හා සංඛ්‍යාලේඛණඥ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා පුස්තකාලාධිපති, වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂක, සහකාර අධ්‍යක්ෂකවරු 3ක් හා පරිගණක චිත්‍රක ශිල්පී ඇතුළු කාර්යය මණ්ඩලයකින් 2020 වසරේදී සමන්විත විය.

තොරතුරු පද්ධති අංශයේ ප්‍රධාන කාර්යයන් සහ වැඩසටහන් පහත දැක්වේ.

- ශ්‍රම ඉල්ලුම පිළිබඳව පුවත්පත් දැන්වීම් සමීක්ෂණය සිදුකර ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සංග්‍රහය සැකසීම හා වර්ෂයකට දෙවරක් ප්‍රකාශයට පත්කිරීම
- ඉල්ලුම අනුව ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු විශ්ලේෂණය කිරීම
- ඉදිරි වර්ෂය සඳහා වෘත්තීය අධ්‍යාපනයට හා වෘත්තීය පුහුණුවට මඟ (TVET Guide) ප්‍රකාශයට පත්කිරීම හා අවශ්‍ය තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම
- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය හා වෙබ් පිටුව සංවර්ධනය කර පවත්වාගෙන යාම
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පුවත් ලිපිය (Newsletter) සැකසීම හා ප්‍රකාශයට පත් කිරීම
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් අංශයන්ගේ කටයුතු සාර්ථකව පවත්වා ගැනීම සඳහා පරිගණක පද්ධති නිර්මාණය කිරීම සහ පවත්වාගෙම යෑම
- කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී ඇති සහ ලියාපදිංචි විය යුතු ආයතන සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය වන පරිගණක මෘදුකාංග පවත්වාගෙන යාම සහ එම කටයුතු සාර්ථකව කරගෙන යෑමට අවශ්‍ය තොරතුරු එම ආයතන වෙත ලබා දීම

- UNEVOC ප්‍රාදේශීය මධ්‍යස්ථානය පවත්වගෙනයාම සහ එහි කාර්යයන් සහ වැඩසටහන් දිගටම ක්‍රියාත්මක කිරීම

- අප ආයතනය යටතේ ක්‍රියාත්මක වන සේවාවන් පිළිබඳව තොරතුරු මහජනතාව සඳහා ලබා දීමට අවශ්‍ය වන TVEC වෙබ් අඩවිය නිර්මාණය කිරීම, පවත්වාගෙන යෑම සහ යාවත්කාලීන කිරීම

- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකපත් මුද්‍රණ කටයුතු සඳහා අවශ්‍ය වන පරිගණක මෘදුකාංග පවත්වාගෙන යෑම, අවශ්‍ය දත්ත ඇතුලත් කිරීම සඳහා අනෙකුත් ලියාපදිංචි පුහුණු ආයතන වෙත උපදෙස් ලබා දීම හා එම දත්ත කළමනාකරණය

- නිපුණතා බලපත්‍රය (Skills Passport) සඳහා අවශ්‍ය වන පරිගණක මෘදුකාංග පවත්වාගෙන යෑම සහ නිපුණතා බලපත්‍රය නිකුත් කිරීම

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන සෑම අංශයකටම අවශ්‍ය වන පරිගණක යන්ත්‍ර සහ ඒ ආශ්‍රිත උපකරණ මිලදී ගැනීමේදී ඇති වන අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය වන පිරිවිතරයන් ලබා දීම. හා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාදීම

- ආයතනය තුල පරිගණක ජාලගත කිරීම, අන්තර්ජාල සහ විද්‍යුත් තැපෑල පහසුකම් ලබා දීම, මේ සඳහා අවශ්‍ය Servers නිසි ආකාරයෙන් පවත්වාගෙන යෑම හා ඒවයේ දෘඩාංග හා මෘදුකාංග යාවත්කාලීන කිරීම

- කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලයට පුස්තකාල සේවාව හා ආශ්‍රිත තොරතුරු පහසුකම් සැලසීම හා පුස්තකාලය පවත්වාගෙන යාම

- අවශ්‍ය අවස්ථාවන්හිදී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු විශ්ලේෂණය කර සම්පාදනය කිරීම, කොමිෂන් සභාවේ කටයුතු වලට අවශ්‍ය පරිගණක චිත්‍ර නිර්මාණය කිරීම යනාදී කටයුතු මින් ප්‍රධාන ස්ථානයෙහි ලා ගැනේ

- ජාත්‍යන්තර මට්ටමින් රටවල් වල අධ්‍යාපන දර්ශකයන් පිළිබඳව තොරතුරු ප්‍රකාශයට පත්කිරීම සඳහා අවශ්‍යය සංඛ්‍යාලේඛන සඳහා යුනෙස්කෝ ආයතනය වෙත ලංකාවේ කාර්මික, වෘත්තීය අධ්‍යාපන හා පුහුණු කිරීම පිළිබඳ තොරතුරු වාර්ෂිකව පිළියෙල කිරීම

මෙම අංශයේ ප්‍රධාන තොරතුරු පද්ධතිය සමන්විත වන්නේ ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය, ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමේ පද්ධතිය, සැලසුම් සහ පර්යේෂණ පද්ධතිය හා ආයතන ලියාපදිංචි කිරීමේ හා පාඨමාලා ප්‍රතිනය කිරීමේ තොරතුරු පද්ධතිය යනාදී තොරතුරු පද්ධතීන්ගෙනි. 2021 වර්ෂය තුලදී මෙම අංශය මඟින් පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් හා සේවාවන් ඉටුකිරීමට සමත් වී ඇත.

10.1 ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ වර්තමාන රැකියා ඉල්ලුම සහ අනෙකුත් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සැපයීම අරමුණු කරගෙන ඊට අදාල ශ්‍රම වෙළෙඳපොල තොරතුරු පද්ධතියක් ස්ථාපනය කර ඇත.

දත්ත සමීක්ෂණය හා විශ්ලේෂණය මගින් ලබාගන්නා ලද ශ්‍රම වෙළෙඳපොළ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදකයන්, වෘත්තීය මාර්ගෝපදේශකයන්, රැකියාගත කිරීමේ නියුතු ආයතන, පුහුණුකරුවන්, සේවායෝජකයන් හා රැකියා අපේක්ෂකයින් යනාදී පාර්ශවවල ප්‍රයෝජනය සඳහා ප්‍රකාශයට පත්කරනු ලැබේ.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ශ්‍රමවෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය (LMI Bulletin) මගින් හා කොමිෂන් සභාවේ අන්තර්ජාල පිටුව (TVEC website:www.tvec.gov.lk) මගින් ලබාගත හැක.

10.2 ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය පිළියෙල කිරීම හා ප්‍රකාශ කිරීම

2020 වසර තුළ දී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශන 2 ක් ප්‍රකාශයට පත්කිරීමට තොරතුරු පද්ධති අංශයට හැකිවිය. මෙම ප්‍රකාශන මගින් 2020 වසරේ මුල් භාගයේදී සහ 2019 වර්ෂය තුල ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපොළේ පැවැති ස්වභාවය විනිවිදව විශ්ලේෂණය කර ඉදිරිපත් කිරීමට සමත් වී තිබේ.

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සංග්‍රහය පහත සඳහන් පරිදි කොටස් 5 කින් යුක්ත වේ.

1. රැකියා සඳහා ඇති ඉල්ලුම
2. සේවානියුක්තිය
3. සේවාවියුක්තිය
4. ශ්‍රම වෙළෙඳපොළ සැපයීම හෙවත් විවිධ රැකියාවලට ඇති ශ්‍රම සැපයුම
5. ශ්‍රම වෙළෙඳපොළ ප්‍රවණතා සහ පර්යේෂණ තොරතුරු

2020 වර්ෂයේදී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයට නව මුහුණුවරක් දෙමින් ශ්‍රම වෙළෙඳපොළ සම්බන්ධව කරන ලද පර්යේෂණ හා ශ්‍රම බලකාය පිළිබඳ තොරතුරු,ශ්‍රම වෙළෙඳපොළ ගමන්මග පිලිබඳ විශේෂ උනන්දුවක් දක්වන අයට වඩා ප්‍රයෝජනවත් වන ආකාරයට මෙම ප්‍රකාශනය තුලින් එළි දැක්වීමට කටයුතු කරන ලදී.

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයේ දේශීය හා විදේශීය වශයෙන් රැකියාවලට ඇති ඉල්ලුම, දේශීය හා විදේශීය වශයෙන් ඇති පුවත්පත් දැන්වීම් පදනම් කරගෙන එක් එක් කර්මාන්ත අංශයන්හි ඇති රැකියා අවස්ථා, රැකියාගත වීම්, අධ්‍යාපන සුදුසුකම්, ස්ත්‍රී/පුරුෂ භාවය හා පලපුරුද්ද ආදී වශයෙන් රැකියාවට සම්බන්ධ අදාල තොරතුරු අන්තර්ගත කර ඇත.

2006 සිට 2019 වර්ෂය දක්වා එක් එක් වර්ෂයන්හි "ඉරිදා ලංකාදීප" හා "Sunday Observer" පුවත්පත් මගින් සමීක්ෂණය කරන ලද දැන්වීම් ගණන අංක 8.1 වගුවේ දැක්වේ.

වගුව 8.1 - සම්පාදනය කරන ලද රැකියා පිළිබඳ දැන්වීම් සංඛ්‍යාව

වර්ෂය	රැකියා පිළිබඳ දැන්වීම් සංඛ්‍යාව
2006	104,839
2007	113,060
2008	116,157
2009	82,167
2010	124,741
2011	108,193
2012	136,994
2013	107,698
2014	91,430
2015	81,369
2016	74,245
2017*	226,555
2018	215,991
2019	160,933

2017* වර්ෂයේ සිට සිළුමිණ පුවත්පත වෙනුවට ලංකාදීප පුවත්පත යොදාගැනීම.



2006-2019 වර්ෂය දක්වා පැවති රැකියා පිළිබඳ දැන්වීම් පහත ස්ථම්භ ප්‍රස්ථාරය මඟින් දැක්වේ.



10.3 ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු වෙබ් පිටුව

කාර්යක්ෂම හා ඵලදායී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සේවාවක් යාවත්කාලීනව ලබාදීමට ඒවා භාවිතා කරන්නන් හට ලබාදීමේ අරමුණින්ම වෙන් වූ මෙම වෙබ් අඩවිය 2020 වසර තුල යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් ඇත.

- වත්මන් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු විශ්ලේෂණය
- පුහුණු පාඨමාලා තොරතුරු අන්තර්ජාලයෙන් බලාගත හැකිවීම
- පසුගිය ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශන
- ශ්‍රම වෙළෙඳපොළ පිළිබඳ සංකල්ප හා අර්ථ දැක්වීම
- ප්‍රයෝජනවත් වෙබ් අඩවිවලට පිවිසුම
- කාර්මික හා ඊට සම්බන්ධ වෘත්තීය ක්ෂේත්‍රයේ ඉහළ ඉල්ලුමක් ඇති රැකියා 10 ක් ප්‍රදර්ශනය කිරීම යනාදී වැදගත් කරුණු ලබාදීමට කටයුතු කර ඇත.
- වාර්ෂික TVET Guide (වෘත්තීය පුහුණුවට මඟ) පාඨමාලා විස්තර

10.4 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන / පුහුණු මාර්ගෝපදේෂය (TVET Guide)

කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශය මගින් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශයට අමතරව 2021 වර්ෂය සඳහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව පිළිබඳ මග පෙන්වීමේ ප්‍රකාශනය (TVET GUIDE 2021) 2020 වසර අවසානයේ දී ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම (TVET GUIDE) ප්‍රකාශය පලාත් මට්ටමින් ආයතන අනුව හා අධ්‍යාපන ක්ෂේත්‍ර අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පුද්ගලික අංශයේ වෘත්තීය පුහුණු පාඨමාලා විස්තර, පාඨමාලා බඳවා ගැනීමේ සුදුසුකම් ආදී විස්තර, පාඨමාලා ගාස්තු, ලියාපදිංචි පුහුණු ආයතන පිළිබඳ විස්තර හා ප්‍රතිතනය කල පාඨමාලා පිළිබඳ විස්තර එහි ඇතුලත් කර ඇත. පළාත් මට්ටමින් එක් එක් ආයතනවල පාඨමාලා හැදෑරීමට අවශ්‍ය සුදුසුකම් අනුව වර්ග කර දක්වා ඇත.

TVET GUIDE 2021 හි අනුරුවක් පහත දැක්වේ.



මෙම ප්‍රකාශනය පළාත් 9 ඇතුළත්වන සේ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇති අතර, ඒ තුළින්

1. පළාත් සහ අධ්‍යයන ක්ෂේත්‍ර අනුව ආයතන විස්තර
2. පළාත් සහ අධ්‍යාපන සුදුසුකම් අනුව ආයතන විස්තර
3. පළාත් සහ අධ්‍යයන ක්ෂේත්‍ර අනුව පාඨමාලා තොරතුරු ලබා ගත හැක.

මෙම වෙබ් පිටුවේ අනුරුවක් පහත දැක්වේ.



10.5 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා වෙබ්අඩවිය සංවර්ධනය හා පවත්වාගෙන යාම.

තොරතුරු පද්ධති අංශය මගින් කොමිෂන් සභා අන්තර්ජාල අඩවිය පාලනය කරනු ලබයි.කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් වඩාත් හිවැරදිව හා යාවත්කාලීනව පවත්වාගෙන යාම හා කොමිෂන් සභාවේ නව වැඩිදියුණු වීම් හා වෘත්තීය හා කාර්මික අධ්‍යාපන පුහුණු ක්ෂෙත්‍රයේ නව සංවර්ධනයන් හදුන්වාදීම් කොමිෂන් සභා අන්තර්ජාල වෙබ් අඩවියේ ඇතුලත් වේ. මෙම තොරතුරු එකී ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන අයට අතිශයින්ම ප්‍රයෝජනවත් වේ.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අන්තර්ජාල අඩවියේ අනුරුවක් පහත දැක්වේ


Home
About Us
TVE Policy
Training Centers & Courses
Publications
Circular
Career Guidance Services
Services & Charges
Research
Procurement Information
Online Services & Forms (Downloads)
TVET Courses
Mature Candidate Route
Vacancies
Contact Us
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
மூன்றாம் நிலைக்கல்வி, தொழிற்கல்வி ஆணைக்குழு
TERTIARY AND VOCATIONAL EDUCATION COMMISSION
TVEC
State Ministry of Skills Development, Vocational Education, Research & Innovations
Tertiary and Vocational Education Commission
WYSD
WORLD YOUTH SKILLS DAY
2021
TVEC
NVQ
Welcome to TVEC
The Tertiary and Vocational Education Commission was established in 1991 as the apex body in the technical and vocational education and training sector under the provisions of the Tertiary and Vocational Education Act No 20 of 1990. Its primary responsibility is policy formulation, planning, quality assurance, coordination and development of tertiary and vocational education in the country.
The amendments introduced in December 1999 to the Tertiary and Vocational Education Act No. 20 of 1990, ensures that 10 out of 17 members of the TVEC including its Chairman, represent the Employer Associations and Private Sector entrepreneurs. This provides a forum at the highest level for the private sector to contribute towards developing policies and programmes that would help achieve the vision of the Government of maintaining a demand-driven training system.
The Chairman and the Director General of the Commission are assisted by a team of Directors, in charge of development functions and a Secretary who oversees the personnel, financial and administration functions.
Guideline for Registration of Training Institutions
Registration of Training Institutions - Apply Online
Accreditation of Training Courses - Apply Online
NVQ
National Vocational Qualifications
පාඨමාලා
பாடநெறிகள்
Courses
Instructions to fill the Application
Names of QMS Certified Institutions
Information on Registered Training Centres
Non-NVQ Programmes Mapped with Equivalent NVQ Levels

NVQ ප්‍රතිඵල එම ආයතන වලට ලබාගැනීමේ පහසුකම් සැලසීම හා ඇගයීම් ප්‍රතිඵල එම ආයතනවලට අදාල තොරතුරු ලබාගැනීමේ පහසුකම් ලබාදීම සඳහා දත්ත ඇතුලත් කිරීමට 2015 වර්ෂයේ සිට සලසා දී තිබු පහසුකම් 2020 වර්ෂයේ වැඩි දියුණු කර ඇත.

කොමිෂන් සභාවේ ප්‍රධාන අන්තර්ජාල වෙබ් අඩවිය තුලින් පහත සඳහන් වෙබ්පිටුවලට පිවිසීමට අවස්ථාව සලසා ඇත.

- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රතිපත්ති
- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු (LMI)
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)
- පාඨමාලා ලියාපදිංචිය හා ප්‍රතීතනය (Registration & Accreditation)
- සැලසුම් හා පර්යේෂණ (Planning & Research)
- අභ්‍යන්තරජාලය (Intranet)
- කොමිෂන් සභාවේ පර්යේෂණාකවය
- පුවත් හා සිදුවීම්
- NVQ තොරතුරු පද්ධතිය සඳහා පිවිසුම
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු මගපෙන්වීම
- ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමේ ක්‍රමවේදය
- අයදුම්පත් හා තොරතුරු බාගත කිරීම
- අභ්‍යන්තර වෙබ් ජාලය

පහත දැක්වෙන වෙබ්අඩවි 2020 වසරේ දී නවදුරටත් සංවර්ධනය කර අන්තර්ජාලය වෙත සම්බන්ධ කර ඇත.

10.6 ලියාපදිංචි හා ප්‍රතීතන වෙබ් අඩවිය

මෙම වෙබ්අඩවිය මගින් ආයතන ලියාපදිංචිය හා පාඨමාලා ප්‍රතීතනය පිළිබඳ සියළුම තොරතුරු ලබාගැනීමට හැකිය. තවද මෙම වෙබ්අඩවියේ ලියාපදිංචි ආයතන හා කොමිෂන් සභාව විසින් ප්‍රතීතනය කරන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු, තත්ත්ව කළමනාකරණ පද්ධතිය පිළිබඳ තොරතුරු, ලියාපදිංචි ඉල්ලුම්පත්, ලියාපදිංචිය අළුත්කිරීමේ ඉල්ලුම්පත්, පාඨමාලා ප්‍රතීතන අයදුම්පත් ආදිය අඩංගු කර ඇත. වෙබ්අඩවිය මගින් පාඨමාලා ලියාපදිංචිය, ආයතන ලියාපදිංචි කිරීම සඳහා Online ක්‍රමයට අයදුම්කල හැකිවීම සහ එක් එක් ආයතන සඳහා වෙනම ද්වාරයක් වෙන් කර තිබීම විශේෂත්වයකි. මෙම ක්‍රියාවලිය 2020 වසරේ දී නවදුරටත් වැඩි දියුණු කරන ලදී. මෙම වෙබ් අඩවිය 2019 වර්ෂයේ සිට NVQ සහතිකපත් මුද්‍රණය කරන වෙබ් අඩවිය හා සම්බන්ධ කර ඇත. මේ මගින් තත්ව කළමනාකරණයේ ඉදිරි පියවරක් තබන ලදී.

පුහුණු ආයතන ලියාපදිංචි හා ප්‍රතීතන තොරතුරු වෙබ් පහසුකම.

මෙම පහසුකම මගින් ලියාපදිංචි වී ඇති ආයතන හා ප්‍රතීතනය කරන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු අන්තර්ජාලය ඔස්සේ පරීක්ෂා කල හැකි අතර එමගින් ඕනෑම අයෙකුට පහත සඳහන් ක්‍රමවේදයන්ට අනුව තොරතුරු සොයාගත හැකිය.

1. පළාත් සහ ක්ෂේත්‍ර අනුව ආයතන විස්තර
2. පළාත් සහ හිමිකාරීත්වය අනුව ආයතන විස්තර
3. පළාත් නම හෝ නමින් කොටසක් මගින් ආයතන විස්තර
4. පාඨමාලා නම සහ දිස්ත්‍රික්ක අනුව ආයතන විස්තර

10.7 අන්තර්ජාලය,විද්‍යුත් තැපෑල හා පහසුකම්

විද්‍යුත් තැපෑල භාවිතා කිරීම පිළිබඳව වූ රජයේ චක්‍රලේඛය අනුව කාර්යාල තොරතුරු හුවමාරු කිරීමේදී කාර්යක්ෂමතාවය වැඩිකිරීම, වියදම අඩුකිරීම සහ කාලය ඉතුරු කර ගැනීම සඳහා නවතාවයකින් යුතුව අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල් පහසුකම් කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකුටම භාවිතා කිරීමට පහසුකම් සලසා ඇත. එමගින් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සන්නිවේදන කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමට මෙන්ම අන්තර්ජාලය තුලින් නව දැනුම ලබාගැනීමට පහසුකම් සලසා ඇත. කාර්යය මණ්ඩලය වෙත තොරතුරු ලබාදීම සඳහා අභ්‍යන්තර ජාලයක් නඩත්තු කරනු ලබයි.

මෙම නව සන්නිවේදන ක්‍රමයේ ඇති නම්‍යශීලි බව හා එමගින් තොරතුරු ලබාගැනීමේ ඇති පහසුව නිසා එය පරිහරණය කරන්නන්ගේ අවධානයට ලක්ව තිබේ.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට කාර්යක්ෂමව තොරතුරු සන්නිවේදනය කර ගැනීමේ වැඩි ඉඩ ප්‍රස්ථාවක් සලසනු වස් විද්‍යුත් තැපෑල (Email) සහ අන්තර්ජාල පහසුකම් 2020 වසරේ දී වැඩිකර ඇත.

තොරතුරු පද්ධති අංශය අභ්‍යන්තර පරිගණක ජාලයල අන්තර්ජාල හා ඉලෙක්ට්‍රෝනික තැපැල් පද්ධති, පරිගණක ජාල පිවිසුම් බාධක :Network Firewall) ආදිය ආයතනයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා 2020 වසර තුළ පවත්වාගෙන ගොස් ඇත.

10.8 TVEC පුවත් ලිපිය

2020 වසර තුළ දී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් සිදුකරන ලද කාර්යයන් පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් TVEC පුවත් ලිපියක් (TVEC Newsletter) ප්‍රකාශයට පත්කර සියලුම ලියාපදිංචි පුහුණු මධ්‍යස්ථාන හා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් අතරේ නොමිලයේ බෙදා හරින ලදී. එම පුවත් ලිපියෙහි අනුරුවක් පහත දැක්වේ.



10.9 කොමිෂන් සභාවේ පුස්තකාලය

කොමිෂන් සභාවේ පුස්තකාලය තොරතුරු පද්ධති අංශය මගින් පාලනය වේ. පුස්තකාලය මගින් දෙස් විදෙස් විවිධ අධ්‍යාපන ක්ෂේත්‍රවල නියුතු විවිධ තරාතිරම් වලට අයත් පර්යේෂකයන් විද්වතුන් වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ පුද්ගලයන්ට පුස්තකාල පහසුකම් සලසා ඇත. ඒ අනුව පුස්තකාලය මගින් පහත සඳහන් සේවාවන් ලබා දීම සිදුවේ.

- වෘත්තීය හා කාර්මික අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයට අදාල පොත්පත්, පර්යේෂණ වාර්තා සැපයීම.
- කොමිෂන් සභාවේ ප්‍රකාශන පාලනය හා බෙදාහැරීම.
- වාර සඟරා පරිහරණයට ඉඩ සැලසීම.
- දිනපතා පුවත්පත් පරිහරණයට ඉඩසැලසීම හා අනෙකුත් ප්‍රලේඛන කාර්යයන්
- වෙනත් විවිධ තොරතුරු පරිශීලන, ප්‍රලේඛන සේවා සහ තොරතුරු සේවා සැපයීමේ පහසුකම්

ඊට අමතරව කොමිෂන් සභාවේ පුස්තකාලයේ නොමැති එහෙත් උනන්දුවක් දක්වන පාඨකයන්හට අන්තර් පුස්තකාල සේවාව මගින් අවශ්‍ය පුස්තකාල තොරතුරු සේවාව සපයා ඇත. කාර්යය මණ්ඩලයේ නිලධාරීන්ගේ තොරතුරු අවශ්‍යතා ඉටුකරනු වස් පසුගිය වසර තුළ ද වෙනත් පුස්තකාල මගින් තොරතුරු සම්පත් හුවමාරු කරගෙන ඇත.

බ්‍රිතාන්‍ය කවුන්සිලයේ ඇති පුස්තකාලයේ ආයතනික සාමාජිකත්වය ද ලබාගෙන තිබේ. එමගින් අතිරේක පොතපත පරිශීලනය කිරීමට පහසුකම් සළසා ඇති අතර අන්තර්ජාතික දැනුම පාඨකයන්ට ලබා දීමට පුස්තකාලය 2020 වසරේ ද කටයුතු කර ඇත.

10.10 2020 වසරේ දී NVQ තොරතුරු පද්ධති මෘදුකාංගය සඳහා එක් වූ නව අංගයන්,

2020 වර්ෂයේ දී තොරතුරු පද්ධති අංශය මඟින් කොමිෂන් සභාවේ ප්‍රධාන පරිගණක ගත මෘදුකාංග වන NVQ තොරතුරු පද්ධති මෘදුකාංගය සඳහා පහත නව අංගයන් එකතු කර පද්ධතිය වැඩි දියුණු කිරීම සිදු කරන ලදී. මේ මඟින් අපගේ සියළු පාර්ශවකරුවන්ට ගුණාත්මක බවින් ඉහළ සේවාවක් ලබා දීමට හැකි වී ඇත.

1. ස්වයංක්‍රීයව NVQ ඇගයීම්කරුවන් තෝරා ගැනීම.
2. ජාතික නිපුණතා සම්මත හා විෂය මාලා නොමිලේ බාගත කර ගැනීම සඳහා පහසුකම් සැලසීම.
3. කර්මාන්ත පාදක සුදුසුකම් (EBT) සඳහා ආයතන ලියාපදිංචි කිරීම.
4. කර්මාන්ත පාදක පුහුණුව (EBT) සහ පෙර දැනුම ඇගයීමේ ක්‍රමය (RPL) සඳහා අයදුම්කරුවන්ගේ විස්තර ඇතුලත් කිරීම.(Batch Entry)
5. NVQ සහතිකපත් මුද්‍රණය සඳහා ගෙවීම් ආකෘතියක් හඳුන්වා දීම.
6. කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) මඟින් පවත්වන NVQ ඇගයීම් සඳහා ඇගයීම්කරුවන්ට ගාස්තු ගෙවීමට ක්‍රමයක් ස්ථාපිත කිරීම.
7. NVQ සහතික පත් සඳහා QR Code හඳුන්වාදීම.
8. කෙටි පණිවිඩ සේවාව පද්ධතියේ අංශ කිපයකට ව්‍යාප්ත කිරීම

දැනුම පරීක්ෂා කිරීමේ විභාග (Knowledge Assessment Test) සඳහා ඉල්ලුම් කිරීම

කොමිෂන් සභාව මඟින් පවත්වන දැනුම පරීක්ෂා කිරීමේ විභාග (Knowledge Assessment Test) සඳහා ඉල්ලුම් කිරීමට, විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා පද්ධතියක් නිර්මාණය කර වෙබ් අඩවිය හරහා පවත්වාගෙන යාම 2020 වර්ෂයේදීද සාර්ථකව සිදු කරන ලදී.

10.11 NVQ සහතිකපත් ලාභීන් සඳහා නිපුණතා බලපත්‍රය (Skills Passport) නිකුත් කිරීම.

ජාතික වෘත්තීය සුදුසුකම්ලාභීන් (NVQ) සඳහා නිපුණතා බලපත්‍ර නිකුත් කිරීම 2020.07.15 දින ලෝක තරුණ නිපුණතා දිනයට සමගාමීව ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය. මෙම නිපුණතා බලපත්‍රය මඟින් සුදුසුකම් සඳහා අගය එකතුකිරීමක් සිදු කරන අතර, NVQ ලාභීන්ට අමතරව, රජය, කර්මාන්තය සහ පොදුවේ සියළු මහජනතාව මෙහි ප්‍රතිලාභීන් වේ. මෙය ලෝක කම්කරු සංවිධානය (ILO) ශ්‍රී ලංකා හාම්පුතුන්ගේ සංගමය (EFC) සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) ඒකාබද්ධ ව්‍යාපෘතියකි.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශය

ආදායම්	සටහන	2020 (රු.)	2019 (රු.)	2018 (රු.)
භාණ්ඩාගාර ප්‍රදාන	01	135,076,338	136,260,126	138,056,007
ව්‍යාපෘති ප්‍රදාන	02	28,979,442	40,173,953	54,135,555
ඉපයූ මෙහෙයුම් ආදායම්	03	28,548,468	45,177,812	40,721,852
මූල්‍ය ප්‍රදාන ආපසු ලැබීම්		227,885	287,675	20,986
ඉපයූ මෙහෙයුම් නොවන ආදායම්	04	229,718	71,993	362,212
		193,061,852	221,978,846	233,296,611
සේවක ණය පොළී ආදායම්	05	416,336	714,459	966,413
ස්ථාවර වත්කම් විකුණුම් ලාභ				
		193,478,187	222,693,305	234,263,024
කල් දැමූ ආදායම්		6,396,799	7,849,676	8,958,303
		199,874,987	230,542,981	243,221,327
වියදම්				
පාලක මණ්ඩල සහ කළමනාකරණ කමිටු දීමනා	06	607,654	342,337	730,531
පුද්ගලික පාරිශ්‍රමික	07	78,512,906	76,924,458	72,335,945
ගමන් වියදම්	08	334,499	1,305,468	812,182
සැපයුම් සහ පාරිභෝජන ද්‍රව්‍ය	09	9,356,879	10,692,989	8,697,873
නඩත්තු වියදම්	10	4,133,883	6,006,287	6,350,539
පුනරුත්තාපන වියදම්	11	539,550	1,330,351	1,652,163
ගිවිසුම්ගත සේවා	12	11,856,272	11,861,917	12,707,820
මෙහෙයුම් වියදම්	13	43,306,818	67,322,485	56,279,705
		148,648,462	175,786,292	159,566,758
ව්‍යාපෘති වියදම්	14	29,061,642	40,181,505	54,068,925
		177,710,104	215,975,083	213,635,683
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/ ඌණතාවය		22,164,882	14,567,897	29,585,644
වෙන්කිරීම්වලට පසු ශුද්ධ අතිරික්තය /ඌණතාවය		22,164,882	14,567,897	29,585,644

කොමිෂන් සභාව වෙනුවෙන් අත්සන් කරන ලදී.

ඒ.එස්.අමරසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)

ජේ.ඒ.ඩී. ජයලත්
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

වත්කම්	සටහන	2020 (රු.)	2019 (රු.)	2018 (රු.)
ජංගම නොවන වත්කම්				
දේපළ, පිරියත හා උපකරණ	15	19,472,941	27,087,974	29,296,226
ජංගම වත්කම්				
ණයගැතියෝ	16	13,802,390	13,401,905	8,664,138
තැන්පත් සහ ලැබීම්	17	28,040,186	26,406,065	15,435,476
ඉතිරි තොගය	18	4,094,190	3,270,017	2,958,906
මුදල් හා මුදල් සමකය	19	62,487,207	41,610,507	38,399,595
		108,423,973	84,688,495	65,458,115
මුළු වත්කම්		**127,896,914**	**111,776,469**	**94,754,341**
හිමිකම් හා වගකීම්				
සමුච්චිත අරමුදල		3,327,777	3,327,777	175,452
පරිවර්තිත සංචිත	20	69,894,665	49,513,730	37,136,079
කල් දැමූ ආදායම්	21	19,472,941	27,087,974	29,296,226
		92,695,383	79,929,481	66,607,757
ජංගම නොවන වගකීම්				
පාරිතෝෂික ප්‍රතිපාදන (උප ලේඛන -01)		24,957,438	20,582,534	16,757,188
		117,652,821	100,512,015	83,364,945
ජංගම වගකීම්				
ණයහිමියෝ	22	2,785,445	4,645,621	521,140
ගෙවිය යුතු	23	7,458,647	5,916,873	10,868,256
		10,244,093	11,264,455	11,389,396
මුළු වගකීම්		**127,896,914**	**111,776,469**	**94,754,341**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

ඒ.එස්.අමරසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)

ජී.ඒ.ඩී. ජයලත්
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)

යූ. වික්‍රමසිංහ
සභාපති

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2020 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

	සමුච්චිත අරමුදල	පරිවර්තිත සංචිත	එකතුව
	රු.	රු.	රු.
2018.01.01 දිනට ශේෂය	175,452	14,799,740	14,975,201
පෙර වර්ෂ ගැලපුම්		2,139,760	2,139,760
ආරම්භක ශේෂ ගැලපුම		29,585,644	29,585,644
ප්‍රතිපාදන ගැලපීම - (අඩුවීම/වැඩිවීම)		-9,389,424	-9,389,424
වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය		350	350
2018.12.31 දිනට ශේෂය	175,452	37,136,079	37,311,531
ආරම්භක ශේෂ ගැලපුම			
වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය	3,152,325	14,567,899	17,720,224
පෙර වර්ෂ ගැලපුම්		-2,190,248	-2,190,248
ක්ෂය නිවැරදි කිරීම			
2019.12.31 දිනට ශේෂය	3,327,777	49,513,730	52,841,507
පෙර වර්ෂ ගැලපුම්		-1,783,946	-1,783,946
වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය		22,164,882	22,164,882
ක්ෂය නිවැරදි කිරීම		-1	
2020.12.31 දිනට ශේෂය	**3,327,777**	**69,894,665**	**73,222,443**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2020 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2020 (රු.)	2019 (රු.)	2018 (රු.)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය			
වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය	22,164,882	14,567,899	29,585,644
වත්කම් විකුණුම් ලාභය			
මූල්‍ය නොවන සිද්ධීන්			
පෙර වර්ෂ ගැලපීම්	-1,783,946	-1,488,286	(9,389,424)
ක්ෂය කිරීම්	6,396,799	7,849,676	8,958,303
ආරම්භක ශේෂ වෙනස ගැලපීම්			1,975,224
ගැලපුම්			
ගණුදෙනු වැටයීම		-5	350
පාරිතෝෂික වෙන් කිරීම්	4,654,654	4,117,366	3,046,836
කල්දැමූ ආදායම	-6,396,799	-7,849,676	-5,271,703
	2,870,708	**1,927,113**	**28,905,230**
පොලී ආදායම්			
පාරිතෝෂික ගෙවීම්	279,750	292,016	
කාරක ප්‍රාග්ධන වෙනස ගැලපීමට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් වල වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**24,755,841**	**16,904,956**	**28,905,230**
ණයගැතියෝ (අඩුවීම/වැඩිවීම)	-400,485	-4,737,767	559,206
තැන්පත් සහ ලැබීම් (අඩුවීම/වැඩිවීම)	-1,626,834	-10,977,876	(5,458,181)
ඉතිරි තොගය (අඩුවීම/වැඩිවීම)	-824,173	-311,111	(700,049)
ණයහිමියෝ (අඩුවීම/වැඩිවීම)	-1,860,176	4,124,481	66,010
ගෙවිය යුතු වියදම් සහ තැන්පතු (අඩුවීම/වැඩිවීම)	839,813	- 4,951,383	1,072,973
	(3,871,855)	**(-16,151,695)**	**(-4,460,041)**
පොලී ආදායම්			
මෙහෙයුම් ක්‍රියාකාරකම් වල වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**20,883,986**	**58,587**	**24,445,189**
ආයෝජන වලින් වූ මුදල් ප්‍රවාහය			
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම	-1,173,662	-5,641,424	(3,522,064)
වත්කම් ඉවත් කිරීමේ ශුද්ධ අගය			
වත්කම් ඉවත් කිරීමේ මුදල් ප්‍රවාහය			

	2020 (රු.)	2019 (රු.)	2018 (රු.)
ආයෝජන වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**-1,173,662**	**-5,641,424**	**(3,522,064)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය			
සමුච්චිත අරමුදල		3,152,325	
මහා භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන සහ නිපුණතා අංශික සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් මිලදී ගැනීම්	1,173,662	5,641,424	
සංචිත (සාමාන්‍ය භාණ්ඩාගාරයට මාරු කිරීම)			
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය			
වසර තුල මුදල් හා මුදල් සමකය	20,883,987	3,210,912	20,923,125
වසර ආරම්භයේ මුදල් හා මුදල් සමකය	41,603,220	38,399,595	17,476,470
වසර අවසානයේ වූ මුදල් හා මුදල් සමකය	**62,487,207**	**41,610,507**	**38,399,595**
බැංකු ගත මුදල් ශේෂය			
මහජන බැංකුව - ගිණුම් අංකය -078-1001-72266044	58,141,549	39,771,616	29,951,031
මහජන බැංකුව - ගිණුම් අංකය -078-1001- 12268324	3,062,256	424,004	2,978,140
මහජන බැංකුව - ගිණුම් අංකය - 078- 1001- 42266050	1,283,402	1,414,887	494,510
ඉතුරුම් තැන්පත්			4,975,914
	62,487,207	**41,610,507**	**38,399,595**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන්

	සටහන	2020 (රු.)	2019 (රු.)	2018 (රු.)
01. භාණ්ඩාගාර ප්‍රදාන				
පුනරාවර්තන		131,000,000	130,000,000	130,000,000
ප්‍රාග්ධන ප්‍රදාන - පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්	1.1	600,000	1,950,000	1,660,000
ප්‍රාග්ධන ප්‍රදාන - වත්කම් අත්පත් කරගැනීම්	1.2	1,200,000	3,560,000	1,943,993
ප්‍රාග්ධන ප්‍රදාන - හැකියා ගොඩනැගීම	1.3	3,450,000	4,390,000	6,396,007
		136,250,000	139,900,000	140,000,000
අඩුකලා- කල්දැමූ ආදායමට මාරුකිරීම්		1,173,662	3,639,874	1,943,993
මහාභාණ්ඩාගාරය වෙත නැවත ගෙවීම්				
		135,076,338	**136,260,126**	**138,056,007**
02. ව්‍යාපෘති ප්‍රදාන				
කෙටිකාලීන වැඩසටහන් (දේශීය)	2.1	1,887,670	2,777,923	213,630
නිපුණතා ආංශික සංවර්ධන	2.2	27,091,772	37,396,030	53,921,925
		28,979,442	**40,173,953**	**54,135,555**
03. මෙහෙයුම් ආදායම්				
ආයතන ලියාපදිංචි ගාස්තු	3.1	2,517,800	2,873,500	1,938,800
ප්‍රතිනන ගාස්තු	3.2	1,522,900	2,594,000	2,098,400
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණය	3.3	23,020,681	38,064,210	35,598,038
ඇගයුම් නිළධාරීන් ලියාපදිංචි ගාස්තු	3.4	86,250	100,500	99,650
අනෙකුත් ප්‍රකාශන අලෙවිය	3.5	419,650	748,475	838,750
ශිෂ්‍ය වාර්ථා පොත් විකුණුම් ශුද්ධ ආදායම	3.6	981,187	797,127	148,214
		28,548,468	**45,177,812**	**40,721,852**
04. මෙහෙයුම් නොවන ආදායම්				
අබලි ද්‍රව්‍ය විකිණීම		2,642	33,207	13,603
පුද්ගලික භාවිතය සඳහා වාහන පැවරීමේ ආදායම		25,500	37,500	25,617
ආපසු නොගෙවිය යුතු තැන්පතු මුදල්				6,000
අතිරික්ත දුරකථන බිල්පත් අයකර ගැනීම		201,576	1,286	208,992
වෙනත් ආදායම් (පොත් ප්‍රකාශනය)				108,000
		229,718	**71,993**	**362,212**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන්

	සටහන	2020 (රු.)	2019 (රු.)	2018 (රු.)
05. කාර්ය මණ්ඩල ණය පොලී ආදායම්				
කොමිෂන් සහ ණය පොලී		67,424	49,068	34,517
ආපදා ණය පොලී		345,730	344,446	512,765
විශේෂ අත්තිකාරම් පොලී		3,182	3,359	1,522
ස්ථාවර තැන්පත් පොලී			317,585	417,610
		416,336	**714,459**	**966,413**
06.පාලක මණ්ඩල සහ කළමනාකරණ කමිටු දීමනා				
පාලක මණ්ඩල දීමනා		578,154	259,024	667,161
කළමනාකරණ කමිටු දීමනා		29,500	83,313	63,370
		607,654	**342,337**	**730,531**
07. පෞද්ගලික පඩිනඩි				
වැටුප් හා වේතන		60,751,973	57,641,438	56,892,874
සේවක අර්ථ සාධක අරමුදල		6,900,194	6,398,083	5,886,544
සේවක භාරකාර අරමුදල		1,724,647	1,600,148	1,491,155
අතිකාල හා නිවාඩු දින දීමනා		3,059,208	5,422,423	2,265,263
පුහුණු දීමනා		522,230	920,000	932,050
සභාපති දීමනා		900,000	825,000	825,525
පාරිතෝෂිකය		4,654,654	4,117,366	4,042,534
		78,512,906	**76,924,458**	**72,335,945**
08. ගමන් වියදම්				
දේශීය		334,499	787,748	675,744
විදේශීය			517,720	136,437
		334,499	**1,305,468**	**812,182**
09. සැපයුම් හා පරිභෝජන				
මුද්‍රණ ලිපි ද්‍රව්‍ය	9.1	2,234,628	4,409,956	3,967,414
ඉන්ධන - ලිහිසි තෙල්	9.2	2,759,424	2,939,105	2,346,043
ප්‍රවාහන වියදම්		2,369,837	1,361,028	236,130
නිළ ඇඳුම්		152,000	152,000	126,000
පුවත්පත්		95,035	132,020	108,730

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන්

	සටහන	2020 (රු.)	2019 (රු.)	2018 (රු.)
අනිකුත් සේවා ගාස්තු		736,185	801,198	1,195,355
සංග්‍රහ වියදම්		368,370	268,857	282,401
සුභ සාධන වියදම්		641,400	628,825	435,800
		9,356,879	**10,692,989**	**8,697,873**
10. නඩත්තු වියදම්				
වාහන නඩත්තු හා රක්ෂණ වියදම්	10.3	2,547,537	4,890,352	5,320,986
යන්ත්‍ර සූත්‍ර නඩත්තු වියදම්		188,740	50,140	146,741
ගොඩනැගිලි නඩත්තු වියදම්		549,276	576,364	388,808
පරිගණක සේවා		620,470	291,450	402,750
යාන්ත්‍රික හා විදුලි උපකරණ		219,618	178,421	64,117
නඩත්තු වියදම්		8,241	19,559	27,137
		4,133,883	**6,006,287**	**6,350,539**
11. පුනරුත්තාපන වියදම්				
වාහන පුනරුත්තාපන වියදම්		539,550	1,176,794	696,387
යන්ත්‍ර පුනරුත්තාපන වියදම්				193,100
ගොඩනැගිලි පුනරුත්තාපන වියදම්			153,557	762,676
		539,550	**1,330,351**	**1,652,163**
12. ගිවිසුම්ගත සේවා				
දුරකථන ගාස්තු		3,503,584	3,305,604	3,125,459
තැපැල් වියදම්		154,345	505,541	213,500
විදුලි වියදම්		2,514,973	2,628,081	2,993,048
ජල ගාස්තු		79,326	122,613	167,512
වරිපනම්		214,200	214,200	171,360
ආරක්ෂක සේවා		1,592,718	2,337,096	2,187,920
පවිත්‍රතා සේවා		1,523,190	1,087,257	1,424,590
විගණන ගාස්තු				250,000
නීති ගාස්තු		130,000	138,923	7,500
සාමාජික ගාස්තු -දේශීය		47,621	33,512	43,282
සාමාජික ගාස්තු -විදේශීය		18,276	16,401	
කාර්යය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය		1,142,400	566,222	1,015,750

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන්

	සටහන	2020 (රු.)	2019 (රු.)	2018 (රු.)
රක්ෂණ (මාර්ගස්ථ මුදල්)		13,682	14,867	15,073
සේවා ගිවිසුම්		919,795	891,600	1,092,825
බැංකු වියදම්		2,162		
		11,856,272	**11,861,917**	**12,707,820**
13. මෙහෙයුම් වියදම්				
ඇගයීම හා ලියාපදිංචිය	13.1	1,480,371	1,286,777	443,935
මූල්‍ය ප්‍රදාන	13.2		-	1,444,105
ප්‍රතිනත වැඩසටහන්	13.3	1,050,670	1,222,478	273,110
ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන්	13.4	28,500,421	45,694,062	34,366,382
වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් ක්‍රියාත්මක කිරීම	13.5	547,500	1,996,240	1,774,478
ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශය වියදම්	13.6	970,523	2,194,614	3,043,365
කර්මාන්ත සබඳතා ක්‍රියාකාරකම් බැංකු වියදම් - බැංකු ගාස්තු	13.7	2,338,464	5,217,125	4,200,139
තත්ත්ව කළමනාකරණ පද්ධති		89,555	43,308	56,580
නිපුණතා සම්මත සංවර්ධනය		1,411,442	1,536,747	954,517
පර්යේෂණ වියදම්		440,305	96,815	414,020
මූල්‍ය ප්‍රදාන නැවත ඇගයීම			13,000	83,550
පරිවර්ථන ගාස්තු		80,767	171,644	267,222
වාර්ෂික ක්ෂය		6,396,799	7,849,676	8,958,303
		43,306,818	**67,322,485**	**56,279,705**
14. ව්‍යාපෘති වියදම්				
කෙටිකාලීන වැඩසටහන් වියදම් (දේශීය)	14.1	1,968,870	2,785,474	147,000
නිපුණතා ආංශික සංවර්ධන	14.2	27,092,772	37,396,030	53,921,925
		29,061,642	**40,181,505**	**54,068,925**

		සටහන	2020 (රු.)	2019 (රු.)	2018 (රු.)
15. දේපල පිරියත හා උපකරණ					
පිරිවැය	**සටහන්**	**01.01.2020**	**මිලදී ගැනීම්**	**විකුණුම්**	**31.12.2020**
වාහන	15.1	68,451,256	-		68,451,256
ලිබඩු සහ සවිකිරීම්	15.2	6,630,425	77,112	273,270	6,434,267
පිරියත හා උපකරණ	15.3	7,475,408		28,650	7,446,758
කාර්යාල උපකරණ	15.4	10,989,527	367,200	3,770,824	7,585,903
පරිගණක හා උපාංග	15.5	34,321,293	729,350	9,599,970	25,450,673
පුස්තකාල පොත්	15.6	1,001,482	.		1,001,482
නාම පුවරු	15.7	519,290		8,500	510,790
මෘදුකාංග	15.8	7,784,979		150,995	7,633,984
		137,173,660	**1,173,662**	**13,832,209**	**124,515,113**
ක්ෂයවීම	**%**	**01.01.2020**	**වසර සඳහා**	**විකුණුම්**	**31.12.2020**
වාහන	25%	60,934,414	1,879,211		62,813,625
ලිබඩු සහ සවිකිරීම්	10%	3,801,544	275,797	164,123	3,913,219
පිරියත හා උපකරණ	25%	3,956,050	877,847	20,679	4,813,218
කාර්යාල උපකරණ	25%	7,627,496	669,774	3,015,457	5,281,814
පරිගණක හා උපාංග	33%	25,800,945	2,360,503	8,086,406	20,075,043
පුස්තකාල පොත්	25%	852,273	37,302		889,575
නාම පුවරු	25%	478,052	10,172	7,951	480,273
මෘදුකාංග	25%	6,634,912	286,193	145,698	6,775,406
		110,085,686	**6,396,799**	**11,440,313**	**105,042,172**
		27,087,974			**19,472,941**
		SUB NOTE	**2020 (Rs)**	**2019 (Rs)**	**2018 (Rs)**
16. ණය ගැතියෝ					
මෙහෙයුම් ණය ගැතියෝ		16.1	304,695	304,695	304,695
සේවක ණය		16.2	13,497,695	13,097,210	8,359,443
			13,802,390	**13,401,905**	**8,664,138**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන්

	සටහන	2020 (රු.)	2019 (රු.)	2018 (රු.)
17. තැන්පත් සහ ලැබීම්				
කාර්ය මණ්ඩල අත්තිකාරම්	17.1	12,613,079	13,849,894	10,955,039
පිටස්තර පාර්ශවයන්ගෙන් අයවිය යුතු	17.2	10,204,696	10,275,692	2,887,219
කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු අගයන්		279,855	279,855	279,855
කලින් ගෙවීම්	17.3	36,856	36,856	36,856
අයවිය යුතු දුරකථන ගාස්තු		77,526		559,774
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණ වියදම්	17.4	3,923,173	1,963,768	716,733
අත්තිකාරම් ගෙවීම් (ඇනවුම් කල)		905,000		
		28,040,186	**26,406,065**	**15,435,476**
18. අවසන් තොගය				
ඉතිරි තොගය - ශිෂ්‍ය වාර්ථා පොත්		578,112	262,500	
ඉතිරි තොගය - ලිපි ද්‍රව්‍ය		891,469	543,219	345,666
ඉතිරි තොගය - සහතිකපත්		2,624,610	2,464,298	2,613,240
		4,094,190	**3,270,017**	**2,958,906**
19. මුදල් හා මුදල් සමකය				
මහජන බැංකුව - ගිණුම් අංකය - 078 - 1001 - 72266044		58,141,549	39,771,616	29,951,031
මහජන බැංකුව - ගිණුම් අංකය - 078 - 1001 - 12268324		3,062,256	424,004	2,978,140
මහජන බැංකුව - ගිණුම් අංකය - 078 - 1001 - 42266050		1,283,402	1,414,887	494,510
ඇමතුම් තැන්පත්				4,975,914
		62,487,207	**41,610,507**	**38,399,595**
20. පරිවර්තන සංචිත				
පරිවර්තන සංචිත - වසරේ ආරම්භය		49,513,730	37,136,079	14,799,749
ආරම්භක ශේෂ ගැලපුම්				2,139,760
ප්‍රතිපාදන ගැලපීම - (අඩුවීම/වැඩිවීම)				
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය		22,164,882	14,567,899	29,585,644
ආරම්භක ශේෂය වැටයීම		-1		350
පෙර වර්ෂ ගැලපුම්		-1,783,946	-1,488,286	(9,389,424)
		69,894,665	**50,215,690**	**37,136,079**

	සටහන	2020 (රු.)	2019 (රු.)	2018 (රු.)
21. කල් දැමූ ආදායම				
ආරම්භක ශේෂය		27,087,974	29,296,226	34,567,929
ගැලපුම්				
සමුච්චිත ක්ෂයවීම් ගැලපුම				164,536
		27,087,974	**29,296,226**	**34,732,465**
එකතු කරන්න: - දේපල, පිරියත සහ උපකරණ		1,173,662	3,639,873	1,943,990
ව්‍යාපෘතිය මඟින් ලබා දෙන වත්කම්			2,001,551	1,578,074
		28,261,636	34,937,650	38,254,529
අඩු: ඉවත්කරනු ලැබූ ස්ථාවර වත්කම්වල ශුද්ධ වටිනාකම		2,391,896		
		25,869,740	34,937,650	38,254,529
අඩු: මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා මාරු කිරීම		6,396,799	7,849,676	8,958,303
වසර අවසානයේ විලම්බිත ආදායම		19,472,941	27,087,974	29,296,226
22. ණයහිමියෝ				
මෙහෙයුම් ණය හිමියෝ	22.1	2,785,445	4,645,621	521,140
23. ආපසු ගෙවිය යුතු තැන්පතු				
මහාභාණ්ඩාගාරය වෙත නැවත ගෙවීම්	23.1	162,351	539,140	1,805,160
ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවීම්	23.2	103,434	117,659	105,789
ගෙවිය යුතු ව්‍යාපෘති ප්‍රදාන	23.3	2,184,367	1,587,442	4,739,767
ගෙවිය යුතු පෞද්ගලික පඩිනඩි	23.4	712,200	1,030,396	1,618,562
ටෙන්ඩර් තැන්පතු		621,611	621,611	641,809
විගණන ගාස්තු		500,655	500,655	500,655
රදවාගත් තැන්පතු		595,777	656,124	954,372
තත්ත්ව කළමනාකරණ පද්ධති තැන්පතු		15,000	15,000	15,000
ගිණුම මාරුකිරීම		49,536	49,536	49,536
ගැලපීම් සඳහා මාරු කිරීම		1,600	1,600	20,965
උපචිත වියදම්		934,828	379,594	221,120
චෙක්පත් අවලංගු කිරීම්		159,345		110,927
වෘත්තීය පුහුණු අධිකාරිය				84,594

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන්

	සටහන	2020 (රු.)	2019 (රු.)	2018 (රු.)
තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍ර සභාව		118,116	418,116	
සංචාරක කර්මාන්ත නිපුණතා ක්ෂේත්‍ර සභාව		108,375		
කාර්ය මණ්ඩල නිළධාරීන් සඳහා ගෙවීම්		1,191,452		
		7,458,647	**5,916,873**	**10,868,256**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ උප සටහන්

	2020 (Rs)	2019 (Rs)	2018 (Rs)
2.1. කෙටිකාලීන වැඩසටහන් (දේශීය)			
කෙටිකාලීන වැඩසටහන් (දේශීය)	1,392,500		202,000
Touch Your Future වැඩසටහන	495,170	1,282,538	11,630
UNFPA		1,495,386	
	1,887,670	**2,777,923**	**213,630**
2.2. නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන			
නිපුණතා ආංශික සංවර්ධන	27,091,772	37,396,030	53,921,925
	27,091,772	**37,396,030**	**53,921,925**
3.1 ආයතන ලියාපදිංචි ගාස්තු			
ආයතන ලියාපදිංචි ගාස්තු	2,517,800	2,796,300	1,932,400
ආයතන වර්ග කිරීමේ ගාස්තු			
ආයතන ලියාපදිංචි ප්‍රමාද ගාස්තු		77,200	6,400
	2,517,800	**2,873,500**	**1,938,800**
3.2 ආයතන ප්‍රතීතන ගාස්තු			
ආයතන ප්‍රතීතන ගාස්තු	1,522,900	2,594,000	2,098,400
	1,522,900	**2,594,000**	**2,098,400**
3.3 ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණ ආදායම			
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණ ආදායම	2,740,630	3,318,555	1,914,675
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නැවත මුද්‍රණ ආදායම	28,050	66,600	38,400
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික පිටපත් මුද්‍රණ ආදායම	25,650	44,375	40,125
ජාතික වෘත්තීය සුදුසුකම් සැසඳුම් ආදායම	1,281,500	4,715,500	5,334,200
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මූලික මුද්‍රණ ආදායම	46,600		
තත්ත්ව කළමනාකරණ පද්ධති ඇගයුම් ගාස්තු	695,000	890,000	3,340,000
ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයුම් ගාස්තු			12,500
සහතික කිරීමේ ගාස්තුව - (NVQ නොවන)	415,000	1,227,000	1,063,750
ජාතික වෘත්තීය සුදුසුකම් විභාග ගාස්තු	17,772,251	27,802,180	23,854,388
නිපුණතා බලපත්‍රය	**23,020,681**	**38,064,210**	**35,598,038**
3.4 ඇගයුම් නිළධාරීන් ලියාපදිංචි ගාස්තු			
ඇගයුම් නිළධාරීන් ලියාපදිංචි ගාස්තු	85,250	100,500	99,650
ඇගයුම් බලපත්‍ර ගාස්තු	1,000		
	86,250	**100,500**	**99,650**

	2020 (Rs)	2019 (Rs)	2018 (Rs)
3.5 ප්‍රකාශන විකිණීම			
ජාතික නිපුනතා සම්මත විකිණීම			
විෂය මාලා විකිණීම	418,050	742,025	654,500
වෘත්තීය පුහුණු සැලසුම් විකිණීම	1,600	900	
වෘත්තීය පුහුණු මාර්ගෝපදේශන අත්පොත් විකිණීම			500
ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශන විකිණීම		450	2,700
තේමා ගීත සංයුක්ත තැටිය විකිණීම			
වෙනත් ප්‍රකාශන විකිණීම		5,100	181,050
	419,650	**748,475**	**838,750**
3.6 ශිෂ්‍ය වාර්ථා පොත් විකිණීම			
ශිෂ්‍ය වාර්ථා පොත් විකුණුම් ආදායම	3,059,575	4,348,050	2,401,650
ආරම්භක තොගය	262,500		836,452
ශිෂ්‍ය වාර්ථා පොත් මුද්‍රණ වියදම	2,394,000	3,813,423	1,416,984
ශිෂ්‍ය වාර්ථා පොත්විකුණුම් වියදම			
	2,656,500	3,813,423	2,253,436
අඩු කලා - ඉතිරි තොගය	578,112	262,500	
ශිෂ්‍ය වාර්ථා පොත් විකුණුම් වලට අදාල මුලු වියදම	2,078,388	3,550,923	2,253,436
	981,187	**797,127**	**148,214**
9.1 මුද්‍රණ ලිපි ද්‍රව්‍ය			
ලිපි ද්‍රව්‍ය	1,297,618	2,073,338	2,383,128
මුද්‍රණ වියදම්	160,850	512,390	475,348
පුවත්පත් දැන්වීම්	776,160	1,824,228	1,108,938
	2,234,628	**4,409,956**	**3,967,414**
9.2 ඉන්ධන - ලිහිසි තෙල්			
අනුයුක්ත වාහන සඳහා ඉන්ධන - ලිහිසි තෙල්	1,820,464	2,164,407	1,615,668
සංචිත වාහන සඳහා ඉන්ධන - ලිහිසි තෙල්	938,960	774,698	730,375
කාර්යාල ප්‍රවාහන වාහන සඳහා ඉන්ධන - ලිහිසි තෙල්			
	2,759,424	**2,939,105**	**2,346,043**
10.3 වාහන නඩත්තුහා රක්ෂණ වියදම්			
වාහන නඩත්තු KE-0488	113,362	449,477	270,284
වාහන නඩත්තු KB-9869	104,533	312,469	237,372
වාහන නඩත්තු KF-6350	253,493	409,003	375,310
වාහන නඩත්තු KF-7354			19,183
වාහන නඩත්තු 18-1901	5,832	123,577	284,548
වාහන නඩත්තු PB-4729	205,539	586,251	401,030
වාහන නඩත්තු 57-7603	127,413	145,294	419,286

	2020 (Rs)	2019 (Rs)	2018 (Rs)
වාහන නඩත්තු PD-2405	262,104	335,733	481,122
වාහන නඩත්තු KR-7697	66,600	125,965	328,323
වාහන නඩත්තු KS-2350	205,623	223,594	296,174
වාහන නඩත්තු KS-2645	123,505	190,611	358,144
වාහන නඩත්තු NB-2942	212,329	668,306	523,244
වාහන නඩත්තු PE-0572	196,670	280,789	410,540
වාහන නඩත්තු NC -0021	340,858	458,609	379,052
වාහන නඩත්තු PF -6302	329,676	580,676	537,373
	2,547,537	**4,890,352**	**5,320,986**
13.1 ආයතන ලියාපදිංචි වියදම්			
ආයතන ලියාපදිංචි සහ ඇගයුම් වියදම	1,480,371	1,087,537	174,365
ඉන්ධන වියදම්		33,100	2,000
ආයතන ලියාපදිංචි සහ ඇගයුම් වැඩසටහන් වියදම්		166,140	267,570
	1,480,371	**1,286,777**	**443,935**
13.2 මූල්‍ය ප්‍රදාන			
රාජ්‍ය අංශය සඳහා මූල්‍ය ප්‍රදාන			
පුද්ගලික අංශය සඳහා මූල්‍ය ප්‍රදාන			1,444,105
පීඩාවට පත් අය සඳහා මූල්‍ය ප්‍රදාන			
			1,444,105
13.3 ප්‍රතිතන වියදම්			
පාඨමාලා ඇගයුම් ගාස්තු	994,720	1,222,478	131,050
ඉන්ධන වියදම්	47,450		
ප්‍රතිතන වැඩසටහන්	8,500		142,060
	1,050,670	**1,222,478**	**273,110**
13.4 ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන්			
ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන්			523,362
ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයුම් සහයන්			
ඇගයුම් නිළධාරීන් ලියාපදිංචිය	546,810	171,480	
ප්‍රවර්ධන වැඩසටහන්		70,560	379,013
තත්ත්ව කළමණාකරණ පද්ධති/එස් 5 වැඩසටහන්	86,400	117,728	100,903
ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයුම් ගාස්තු	12,327,319	12,141,216	17,908,976
විභාග ගාස්තු	13,889,344	25,985,268	13,787,818
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණ වියදම්	1,205,688	4,231,951	277,810
ඇගයුම් බලපත්‍රගාස්තු		6,150	4,650
ඇගයුම් සහ ඇගයුම් ක්‍රියාත්මක කිරීම	322,400	2,087,978	1,378,069

	2020 (Rs)	2019 (Rs)	2018 (Rs)
ජාතික වෘත්තීය සුදුසුකම් මාර්ගගත පද්ධතිය	29,565	388,671	
ඇගයුම් විගණනය		49,950	5,782
ඇගයුම් නිළධාරීන් ලියාපදිංචිය	92,895	443,110	
	28,500,421	**45,694,062**	**34,366,382**
13.5 වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් පිළියෙල කිරීම			
වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් (නව)		8,000	1,230,478
වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් (යාවත්කාලීන)	547,500	1,988,240	544,000
	547,500	**1,996,240**	**1,774,478**
13.6 ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශය වියදම්			
ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශය /ප්‍රවෘත්ති ලිපි වියදම්	8,170	474,890	721,615
ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශ දත්ත සැකසුම්	936,573	601,869	1,106,917
වෘත්තීය පුහුණු මාර්ගෝපදේශය		736,835	972,413
ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශය/ප්‍රවෘත්ති ලිපි තැපල් වියදම්	25,780	183,120	241,080
යුනිවොක් වියදම්		197,900	1,340
ශ්‍රම වෙළඳපොළ සමීක්ෂණය			
	970,523	**2,194,614**	**3,043,365**
13.7 කර්මාන්ත සබඳතා අංශ ක්‍රියාකාරකම්			
සංවර්ධනය හා අධීක්ෂණය	115,225	1,313,796	435,185
වෘත්තීය මාර්ගෝපදේශ ශක්තිමත් කිරීම	510,821	2,563,554	2,143,151
වෘත්තීය මාර්ගෝපදේශ නියාමනය කිරීම	516,850	217,392	623,785
මෙහෙයුම් කමිටුව පැවැත්වීම	95,365	23,028	50,756
ප්‍රචර්ධන වැඩසටහන්	884,804	823,084	947,263
රැකියා ස්ථානගත කිරීම	215,400	276,270	
	2,338,464	**5,217,125**	**4,200,139**
14.1 කෙටිකාලීන වැඩසටහන් (දේශීය / විදේශීය)			
Touch Your Future වැඩසටහන	576,370	1,283,472	
UNFPA වැඩසටහන	89,500	1,502,002	
ඇෆ්ගන් වැඩසටහන			147,000
SL CERT	103,000		
EDB	1,200,000		
	1,968,870	**2,785,474**	**147,000**

	2020 (Rs)	2019 (Rs)	2018 (Rs)
14.2 නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන			
ආයතන ප්‍රතිපත්ති	725,900	1,802,650	1,344,859
විෂයමාලා පිළියෙල කිරීම	5,627,003	10,269,473	2,462,794
තත්ත්ව කළමණාකරණ පද්ධති	407,988	870,037	2,064,212
අනිකුත්			250
නිපුණතා වාර්ථා වියදම්	12,462	878,004	616,480
දීමනා	2,717,007	1,841,104	1,868,412
සේවක පුහුණුව හා සංවර්ධනය			1,113,921
පුහුණු ආයතන ලියාපදිංචිය	243,000	891,643	1,200,680
ඇගයුම් ගාස්තු	1,409,870	4,776,100	25,095,899
මෘදු නිපුණතා		1,419,560	277,991
ගොඩනැගිලි සංවර්ධනය			3,275,326
NVQ විභාග වියදම්			155,129
පර්යේෂණ වියදම්	928,900	1,780,745	1,226,430
ක්ෂේත්‍ර සහා	11,999,606	9,600,728	10,621,592
නිපුණතා පරතරය විශ්ලේෂණය		690,736	693,420
සේවක පුහුණු දීමනා	1,818,675	1,475,238	1,582,800
මෘදු නිපුණතා / ඉංග්‍රීසි වැඩසටහන			321,730
තත්ත්ව සම්මානය	1,202,362	1,100,012	
	27,092,772	**37,396,030**	**53,921,925**
16.1 මෙහෙයුම් ණය ගැතියෝ			
සකුරා පරිගණක ආයතනය	167,895	167,895	167,895
අනිකුත් ණය ගැතියන්	136,800	136,800	136,800
	304,695	**304,695**	**304,695**
16.2 කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්			
කොමිෂන් සහා ණය	1,812,142	2,217,302	708,544
ආපදා ණය	11,518,455	10,573,880	7,357,304
සුනාමි ණය	39,000	39,000	39,000
උත්සව අත්තිකාරම්	62,300	67,300	62,300
විශේෂ අත්තිකාරම්	4,213	103,122	19,122
ලැබිය යුතු විශේෂ අත්තිකාරම් පොළිය	3,359	3,359	
සුනාමි විශේෂ ණය (II)	58,225	93,247	173,173
	13,497,695	**13,097,210**	**8,359,443**

	2020 (Rs)	2019 (Rs)	2018 (Rs)
17.1 අත්තිකාරම් - සේවක හා අනෙකුත්			
සේවක අත්තිකාරම්	5,384,000	5,319,048	3,077,593
ව්‍යාපෘති අත්තිකාරම්- තොරතුරු සන්නිවේදන			1,276,756
ව්‍යාපෘති අත්තිකාරම්- නිෂ්පාදන හා ඉංජිනේරු	4,376,466	4,831,430	4,455,933
ව්‍යාපෘති අත්තිකාරම්- ඉදිකිරීම්	2,852,614	3,235,393	1,246,507
ව්‍යාපෘති අත්තිකාරම්- සංචාරක		464,023	898,251
	12,613,079	**13,849,894**	**10,955,039**
17.2 පිටස්තර පාර්ෂවයන්ගෙන් ලැබිය යුතු			
නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය	89,500		
SSDD	10,115,196	10,275,692	2,887,219
	10,204,696	**10,275,692**	**2,887,219**
17.3 කලින් ගෙවීම්			
කලින් ගෙවීම් - මාර්ගස්ථ මුදල් රක්ෂණ වාරික	11,556	11,556	11,556
සේවා ගිවිසුම්	25,300	25,300	25,300
	36,856	**36,856**	**36,856**
17.4 ලැබිය යුතු ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණ වියදම්			
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ ආයතනය	851,700		78,931
වෘත්තීය පුහුණු අධිකාරිය	1,666,126	1,272,866	
ජාතික තරුණ සේවා සභාව			16,800
ජාතික යොවුන් සේනාංකය	5,325		
කාර්මික අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව	964,108	254,988	254,988
ජර්මානු කාර්මික අධ්‍යාපන ආයතනය	74,750	74,750	74,750
මිනින්දෝරු දෙපාර්තමේන්තුව	69,900	69,900	
රාජ්‍ය නොවන සංවිධාන /පුද්ගලික හා රාජ්‍ය ආයතන	291,264	291,264	291,264
	3,923,173	**1,963,768**	**716,733**
22.1 මෙහෙයුම් ණය හිමියෝ			
මෙහෙයුම් ණය හිමියෝ	1,880,445	2,082,380	29,214
සේවක		1,417,876	361,730
අනිකුත්	905,000	1,145,365	130,196
	2,785,445	**4,645,621**	**521,140**

	2020 (Rs)	2019 (Rs)	2018 (Rs)
23.1 මහාභාණ්ඩාගාරය වෙත ගෙවීම්			
රාජ්‍ය භාග ගෙවීම්	162,351	539,140	1,805,160
වැටුප් රහිත අයකරගැනීම්			
	162,351	**539,140**	**1,805,160**
23.2 ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවීම්			
රඳවා ගැනීම් බදු	59,511	59,511	59,511
මුද්දර බදු	43,923	58,148	46,278
වැටුප් මත බදු			
	103,434	**117,659**	**105,789**
23.3 ගෙවිය යුතු ව්‍යාපෘති ලැබීම්			
රුහුණු ආර්ථික සංවර්ධන අධිකාරිය			48,923
ජාත්‍යන්තර කම්කරු සංවිධානය			3,103,402
කෙටිකාලීන වැඩසටහන් (දේශීය / විදේශීය)	2,180,875	1,583,950	1,583,950
කා.අ.සං.ව්‍යාපෘතිය	3,492	3,492	3,492
යෞවන කටයුතු අමාත්‍යංශය			
	2,184,367	**1,587,442**	**4,739,767**
23.4 ගෙවිය යුතු පෞද්ගලික පඩි නඩි			
අතිකාල සහ නිවාඩු දින දීමනා			
සේවක භාරකාර අරමුදල		1,589,120	9,566
වැටුප්	10,239	9,759	
සේවක අර්ථසාධක අරමුදල	701,961	887,159	1,608,995
	712,200	**1,030,396**	**1,618,562**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශ උප ලේඛන

උප ලේඛන 01 - පාරිතෝෂික වෙන්කිරීම්

නම	සේවක අංකය	පත්වීමේ දිනය	වසර ගණන	වැටුප (රු)	පාරිතෝෂික ප්‍රතිපාදන (රු)
ඩබ්. පී. එස්. ඒ. කීර්ති	5	2001.02.01	19	60,975.00	579,263
එන්. ඩබ්. පී. එන්. පීවන්ත	6	2001.02.01	19	52,665.00	500,318
කේ. සිරිසේන	9	2001.02.05	19	41,770.00	396,815
ආර්. එන්. පී. සිල්වා	10	2001.03.01	19	50,400.00	478,800
ඩී. බී. ආර්. මංජුලා	11	2001.03.01	19	51,910.00	493,145
වයි. පී. එස්. උදයකාන්ති	12	2001.02.01	19	50,400.00	478,800
එම්. එන්. අසංක රංගන	15	2001.09.03	19	39,250.00	372,875
පී. කේ. හෑගොඩආරච්චි	20	2001.11.01	19	47,160.00	448,020
එම්. එල්. එන්. එස්. එදිරිසුරිය	22	2001.11.02	19	88,095.00	836,903
එච්. බී. ඉන්දික සම්පත්	24	2001.11.16	19	53,420.00	507,490
පී. එස්. අමරසේකර	25	2001.11.15	19	40,450.00	384,275
බී. කේ. එස්. දිනේෂ්	26	2001.11.16	19	40,450.00	384,275
පී. පී. අජිත් කුසුම්	28	2001.12.03	19	92,635.00	880,033
ඩබ්. එන්. ටී. අනුර වීරකෝන්	31	2002.07.01	18	91,915.00	827,235
එස්. විජේසේකර	40	2005.04.20	15	39,490.00	296,175
ඩබ්. වී. පී. සී. ජගත් කුමාර	41	2005.05.16	15	36,790.00	275,925
වසීර පෙරේරා	43	2005.06.15	15	119,875.00	899,063
ටී. සෙන්තුරන්	46	2005.01.04	15	80,455.00	603,413
පී. එම්. සී. පී. ගුණතිලක	47	2005.01.18	15	70,600.00	529,500
ඩබ්. කේ. ඩී. හරිස්චන්ද්‍ර	48	2005.01.03	15	78,345.00	587,588
පී. ඒ. එම්. යූ. ගනේපොළ	49	2005.01.02	15	90,365.00	677,738
යූ. ඒ. පී. ධර්මසේන	51	2005.01.03	15	67,850.00	508,875
එම්. ඩී. චාමලී ද සිල්වා	56	2005.10.06	15	42,960.00	322,200
ආර්. ජේ. සමරවීර	57	2005.11.21	15	84,275.00	632,063
පී. බන්දුල	58	2006.02.20	14	39,490.00	276,430
ඒ. එස්. අමරසිංහ	60	2006.05.16	14	97,645.00	683,515
පී. පී. එස්. කුමාර	62	2006.07.14	14	37,480.00	262,360
එස්. යූ. කේ රුඹසිංහ	65	2007.02.02	13	99,445.00	646,393
එම්. විද්‍යානපතිරණ	66	2007.02.02	13	82,365.00	535,373
ජේ. ඒ. ඩී. ජේ. ජයලත්	68	2007.08.01	13	121,045.00	786,793
පී. පී. පී. නානායක්කාර	70	2007.10.15	13	82,365.00	535,373
ඩබ්. ඒ. ඩබ්. සී. ප්‍රේමරත්න	71	2007.11.01	13	92,635.00	602,128
පහළට ගෙන යන ශේෂය					**17,229,152**

නම	සේවක අංකය	පත්වීමේ දිනය	වසර ගණන	වැටුප (රු)	පාරිතෝෂික ප්‍රතිපාදන (රු)
ඉදිරියට ගෙන ආ ශේෂය					**17,229,152**
ඩබ්. ජේ. එල්. ඒ. දමයන්ති	72	2007.12.12	13	80,455.00	522,958
සද්ධා මංගල	73	2008.02.01	12	38,890.00	233,340
ආර්. පී. ඒ. ටී. කුමාර	74	2008.11.03	12	40,810.00	244,860
එන්. ඩී. විජේසේකර	75	2008.11.03	12	40,810.00	244,860
එස්. එස්. කල්පගේ	76	2008.11.03	12	36,610.00	219,660
පී. සී. ජේ. ද සිල්වා	78	2009.09.01	11	40,000.00	220,000
කේ එස් සමීර	84	2011.08.01	9	36,520.00	164,340
පී. සී. එස්. එම්. නානායක්කාර	85	2011.08.01	9	36,520.00	164,340
බී. එස්. ජේ. විපුල්සි	86	2012.01.02	9	63,725.00	286,763
එච්. එම්. ඒ. ඩී. කේ. හේරත්	87	2012.01.02	9	69,225.00	311,513
ඩී. එන්. අයි. ඩී. ද සිල්වා	90	2012.01.02	9	66,475.00	299,138
චන්දි මේනකා	91	2012.03.01	8	37,810.00	151,240
ඒ. පී. ඉන්ද්‍රානි	92	2012.03.01	8	34,300.00	137,200
පී. මුතුකුමාරණ	95	2012.11.03	8	53,420.00	213,680
පී. පී. එස්. චතුරංගනී	99	2013.06.06	7	33,548.00	117,418
කේ. ඩී. එල්. පී. කරුනාදාස	101	2013.07.15	7	65,100.00	227,850
ටී. එල්. ඩබ්. මධුෂානි	103	2013.07.15	7	40,890.00	143,115
කේ. ඩබ්. ඒ. අනුරුද්ධිකා	104	2013.07.15	7	40,210.00	140,735
එන්. එල්. එස්. දයාරත්න	105	2013.09.02	7	34,300.00	120,050
බී. පී. එන්. කමල්ප්‍රිය	106	2013.09.10	7	35,980.00	125,930
එච්.ආර්. එම්. යූ. යූ. විජේබණ්ඩාර	109	2014.01.16	6	63,725.00	191,175
මදන් ආර්.	110	2014.01.27	6	69,225.00	207,675
ද. සිල්වා ඊ. ඒ. කේ.	112	2014.02.10	6	73,350.00	220,050
සමරවික්‍රම සී. සී. කේ.	116	2014.08.01	6	42,225.00	126,675
හදපාන්ගොඩ බී. සී.	117	2014.09.15	6	69,225.00	207,675
කුමාර එච්. එල්. කේ. එස්.	118	2014.09.22	6	35,710.00	107,130
කාරියවසම් පී. ඩී. එස්.	119	2014.10.01	6	80,100.00	240,300
ඒ. එච්. එන්. සදමාලි	122	2015.06.03	5	41,335.00	103,338
එල්. කේ. කොහොම්බන්	125	2015.06.06	5	40,000.00	100,000
එන්. එච්. එස්. දර්ශන	126	2015.06.07	5	40,000.00	100,000
එස්. බී. කරුණානායක	128	2015.06.08	5	40,000.00	100,000
බී. එල්. කේ .පී. සංදීපනි	129	2015.06.09	5	36,910.00	92,275
අයි. එම්. පී. එච්. ලක්මාල්	131	2015.07.08	5	33,800.00	84,500
එච්. එම්. වී. එන්. හේරත්	132	2015.07.22	5	38,410.00	96,025
සුජානි දිල්හාරා	134	2017.08.29	3	39,010.00	58,515
පී. ඩබ්. එස්. භාෂිනි	136	2016.09.01	4	63,725.00	127,450
එන්. රාජපක්ස	137	2016.09.01	4	60,975.00	121,950
C/F					**23,802,875**

නම	සේවක අංකය	පත්වීමේ දිනය	වසර ගණන	වැටුප (රු)	පාරිතෝෂික ප්‍රතිපාදන (රු)
ඉදිරියට ගෙන ආ ශේෂය					**23,802,875**
ඩබ්. පී. එස්. කුමාර	138	2016.10.03	4	69,087.50	138,175
ඒ. සී. යූ. ගුණතුංග	139	2016.09.01	4	65,100.00	130,200
ඩබ්. එම්. ඩබ්. බී. විජේසිංහ	140	2016.09.01	4	65,100.00	130,200
කේ. එම්. ඩී. එච්. ලක්මිණී	141	2016.09.01	4	66,475.00	132,950
ජයමිණී මධුෂා	145	2017.05.22	3	33,050.00	49,575
ඒ. ඩබ්ලිව්. විජයංග	148	2017.05.22	3	36,610.00	54,915
ඩී. ඩබ්. ඉෂානි	149	2017.05.22	3	36,310.00	54,465
රවිඳු රන්දික කුමාර	151	2017.08.25	3	33,300.00	49,950
වී. එන්. රම්මාවඩු	152	2017.08.25	3	39,010.00	58,515
නුවංගි කන්කානමගේ	155	2018.04.02	2	40,445.00	40,445
ජී.වී.අයි. පියුමාලි	156	2018.04.02	2	40,445.00	40,445
ආර්.එස්. ප්‍රනාන්දු	159	2018.04.02	2	63,725.00	63,725
ඒ.එස්. කල්පගේ	162	2018.04.02	2	30,487.50	30,488
ජී.එල්. මාසකෝරාල	163	2018.04.02	2	63,725.00	63,725
පී.එල්.අයි.ඒ. ද සොයිසා	164	2018.04.02	2	40,445.00	40,445
පී.ඒ.පී.කේ. පනංගල	167	2018.07.02	2	51,155.00	51,155
එස්. දිසානායක	171	2019.11.19	1	50,400.00	25,200
					24,957,448

★ **වැටුප = දෙසැම්බර් මස මූලික වැටුප + ජීවන වියදම් දීමනාව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } විවිවයි/ඊ/විවිඊසී/1/20/9 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2021 මැයි 21 දින

අධ්‍යක්ෂ,

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් : 1. ලේකම් - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අමාත්‍යාංශය

2. ලේකම් - මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.nsaosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. VTY/E/TVEC/1/20/9

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021.මැයි 21 දින

අධ්‍යක්ෂ ජනරාල්
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ නත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | agjf@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2014 වර්ෂයේ දී කොමිෂන් සභාව විසින් පරිත්‍යාග වශයෙන් ලබා දී තිබූ පිරිවැය රු. 5,760,324 ක් වූ චන්කම ගිණුම්වලින් ඉවත් නොකිරීමේ වරද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය පරිදි සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් හෝ අනිනාතුයෝගීව ගැලපීමෙන් නිවැරදි කල යුතු වුවද එයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී පොත් වලින් ඉවත් කර තිබුණි. ඒ හේතුවෙන් එම චන්කම්වලට අදාලව 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු. 1,881,720 ක් වූ ක්ෂය අදාළ වර්ෂයන්හි ලාභයෙන් අඩු වී තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් සමුච්චිත ලාභය අඩුවෙන් හා සමුච්චිත ක්ෂය වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණවල සාධාරණ අගය වෙනස්වීම් මත ප්‍රත්‍යාගණනයන් සිදුකල යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ඉදිද්ධ අගය රු. 19,472,941 ක් වූ චන්කම් සම්බන්ධයෙන් 2008 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 8 හි 22 ඡේදය ප්‍රකාරව නෛතික බැඳීමේ ප්‍රමාණය විශ්වාසදායී ලෙස ඇස්තමේන්තුකල හැකි විටක, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සැලසිය යුතුය. එසේ වුවද, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත ගෙවියයුතු රු. 3,102,571 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාල එකතුව රු. 477,859 ක් වූ වියදම් පෙර වර්ෂයේ ලාභය මත ගැලපීම් වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගැලපීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් රු. 5,384,000 ක් වූ අත්තිකාරම් ශේෂය තුල 2017 වර්ෂයේ සිට පවතින රු. 1,879,170 ක් වූ හඳුනා නොගත් අත්තිකාරම් ශේෂයට අදාල උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ නිත්‍යානුකූලතාව සහ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කොමිෂන් සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් කොමිෂන් සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම් අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණු මා විසින් වාර්තා කිරීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාවේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ

ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහඇරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය නිරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍ර කාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික නත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (i) මුදල් රෙගුලාසි 396	කොමිෂන් සභාවේ බැංකු ගිණුම් දෙකකට අදාලව වලංගු කාලය ඉක්මවා මාස 6 සිට වසර 4 දක්වා කාලයක් ගත වී ඇති වටිනාකම් රු. 6,868,602 ක් වූ චෙක්පත් 593 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි පරිදි කටයුතු කර නොනිබුණි.
(ii) මුදල් රෙගුලාසි 188(2)	කොමිෂන් සභාවේ බැංකු ගිණුම් දෙකකට අදාලව වසර 1 සිට වසර 5 ක් දක්වා තැන්පත් කලත් උපලබ්ධි නොවූ එකතුව රු. 5,025,693 ක් වූ චෙක්පතු/ මුදල් 448 ක් සම්බන්ධයෙන් අදාල රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොනිබුණි.
(iii) මුදල් රෙගුලාසි 753	පිරිවැය රු. 5,760,324 ක් වූ භාණ්ඩ රජයේ පාසලක් වෙත පරිත්‍යාග ලෙස ලබාදී තිබුණද අදාල පාසලෙන් භාණ්ඩ භාරගත් බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.
(ආ) 2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා 30 වක්‍රලේඛය හා 2012 ජූලි 17 දිනැති බදවාගැනීමේ පටිපාටිය	බදවාගැනීමේ පටිපාටිය අනුමත කිරීමේදී ලබාදී තිබුණු සේවා අන්තර්ග්‍රහණයන් වැරදි ලෙස යොදාගෙන නතනුරු, ශ්‍රේණිය පෙරා දානම් කර නිලධාරීන් 04 දෙනෙකු වෙත හිහ වැටුප් ලෙස රු. 604,345ක් ගෙවීම් කර තිබුණි.
(ඇ) අනුමත බදවාගැනීමේ පටිපාටිය හා 2016 අගෝස්තු 15 දිනැති අංක DMS/1675-VII දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය	අදාල සේවා කාලය සම්පූර්ණ කර නොනිබු නිලධාරීන් 04 දෙනෙකු සඳහා අධ්‍යක්ෂ නතනුරු පිරිනමා තිබුණු අතර ඉන් එක් නිලධාරියෙකු අධ්‍යක්ෂ නතනුරට අවශ්‍ය පශ්චාත් උපාධිය ලබාගෙන නොනිබුණි.

(ඇ)	2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	රජයේ ආයතනවල ගොඩගැසී ඇති අපහරණය කලයුතු භාණ්ඩ කඩිනමින් අපහරණය කලයුතු වුවත් කොමිෂන් සභාව මගින් රු. 8,071,885 ක් වටිනාකමින් යුත් භාණ්ඩ අයිතම 212 ක් අවුරුදු 05 සිට 08 අතර කාලයක සිට කාර්යාල පරිශ්‍රයේ ගොඩගසා තිබුණි.
(ඈ)	2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371(2)(ආ) රෙගුලාසිය	විශේෂිත කාර්යයක් සඳහා එක් අවස්ථාවකදී රු. 100,000 ක උපරිමයක් දක්වා පමණක් තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකි වුවත් ඊට පටහැනි ලෙස භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු. 5,239,895 ක් තත්කාර්ය අතුරු අග්‍රිමයක් සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණි.
(ඉ)	2018 පෙබරවාරි 15 දිනැති අංක 01/2018 දරන චක්‍රලේඛය හා 2020 ජනවාරි 27 දිනැති අංක TIP/SS/01/27 දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය	යොමුගත චක්‍රලේඛය පරිදි රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ වසර 12 ක සක්‍රීය සේවා කාලයක් ඇති නිලධාරියෙකුට සහනදායී පදනම් මත මෝටර්රථ බලපත්‍රයක් ලබාදිය හැකි වුවත් ඊට පටහැනි ලෙස අදාල විධායක මට්ටමේ වසර 08 මාස 04 දින 18ක සේවා කාලය සහිත නිලධාරියෙකුට සහනදායී මෝටර්රථ බලපත්‍රයක් ලබාදී තිබුණි. ඒ සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි පරිදි විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය ඇතුව පහත සඳහන් නිරීක්ෂණ හැර කොමිෂන් සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

	බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
(අ)	1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත හා 1990 අංක 50 දරන (සංශෝධන) පනත	කොමිෂන් සභාවේ බලතල යටතේ වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳව කරන පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් භාරගැනීමට පමණක් කොමිෂන් සභාවට බලතල පවරා තිබිය දී කොමිෂන් සභාව විසින් නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති අරඹුදල් භාවිතා කරමින් පර්යේෂණ සිදු කරමින් පැවතුණි.
(ආ)	ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණු සුදුසුකම් රාමුව සඳහා වූ මෙහෙයුම් අත්පොත (Nation Vocational Qualification Frame Work of Sri Lanka, Operation Manual – 2009)	
	(i) 3.1.1 වගන්තිය	නිපුණතා සම්මත සකස් කර ඇතත් පාඨමාලා සකස් කර නොමැති ක්ෂේත්‍ර හා වෘත්තීන් 66 ක් නිරීක්ෂණය විය.
	(ii) 3.1.7 වගන්තිය	වර්ෂ 03 කට වරක් නිපුණතා සම්මත යාවත්කාලීන කලයුතු අතර වෙනයෙන් වෙනස් වන තාක්ෂණික ක්ෂේත්‍රයන් සඳහා ඊට වඩා අඩු කාලයක් තුල යාවත්කාලීන කිරීම් සිදුකල යුතු වුවත් ක්ෂේත්‍ර 11 කට අදාල නිපුණතා සම්මත හා පාඨමාලා වසර 01 සිට වසර 10 දක්වා කාලයක සිට යාවත්කාලීන කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

කොමිෂන් සභාවේ 2012 ජූලි 17 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර තිබුණු බදවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අවස්ථා රාශියකදී සංශෝධනය කර තිබීම හේතුවෙන් ඒම සංශෝධන සියල්ල ඇතුලත් බදවාගැනීමේ හා උසස්කිරීමේ පරිපාටියක් සකස් කර අනුමත කරවා ගන්නා ලෙස 2016 අගෝස්තු 15 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කොමිෂන් සභාව වෙත දන්වා තිබුණද 2020 නොවැම්බර් 10 දින දක්වාම ඒ අනුව කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2021.05.21 TVEC/E2/Audit 2020

විගණකාධිපති,

විගණකාධිපති දෙපාර්තමේන්තුව,

බත්තරමුල්ල.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

ඔබගේ අංක වීටිවයි/ජ/ටිවිඊසි /1/20/09 හා 2021.05.21 දිනැති උක්ත විගණන විමසුම සඳහා පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2014 මැයි මස 12 වන දින පරිත්‍යාග කරනු ලැබූ වත්කම් වල අගය 2020 වර්ෂය දක්වා පොත් වලින් ඉවත් කර නොමැති බැවින් 2014 සිට 2019 වසර දක්වා ක්ෂය වශයෙන් ගණනය වූ වටිනාකම සහ ඒ නිසා සමුච්චිත ලාභයට වූ බලපෑම 2021 වර්ෂයේ මූල්‍ය වාර්ථාවල සටහනක් ලෙස හෙළිදරව් කිරීමට පියවර ගනිමි..

(ආ) 2020 වර්ෂයට අදාළව වත්කම් කාණ්ඩ අනුව ප්‍රත්‍යාගණනය කිරීම පිණිස කමිටු 03ක් පත්කර ඇත. ඒ අනුව ප්‍රත්‍යාගණන කාර්යය සිදුවන බව සඳහන් කරමි.ප්‍රත්‍යාගණනයෙන් පසු අදාල වාර්ථා විගණනය වෙත ඉදිරිපත් කරමි.

(ඇ) මෙහිදී 2020 වර්ෂයට අදාළව ගිණුම් පිළියෙල කිරීමේ දී හඳුනාගන්නා ලද සියලු තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කල අතර මෙම ගෙවිය යුතු අගය පිලිබඳව තොරතුරු ගිණුම් අංශයට ඉදිරිපත් නොවුනු හෙයින් අදාල වගකීම සඳහා වෙන් කිරීමක් සිදුකළ නොහැකිවිය. ඒ අනුව 2021 වර්ෂයේදී ඒ සඳහා අදාල වන ගිණුම් සටහන් යෙදවීමට පියවර ගනිමි.

(ඈ) 2021 වසරට අදාළව ගිණුම් පිළියෙල කිරීමේදී මේ පිළිබඳ හෙලිදරව් කිරීමට පියවර ගනිමි.

(ඉ) අත්තිකාරම් ශේෂය තුළ ඇතුලත්ව ඇති 1,879,170 ක් වූ ශේෂය පිළිබඳව විස්තරාත්මක උපලේඛනය ඉදිරිපත් කිරීමට පියවර ගනිමි.

නීතිරීති/ විධානයට යොමුව

(අ)

i. 2017 වර්ෂයේ සිදු වූ පරිගණක මෘදුකාංගයේ බිඳ වැටීම නිසා නිකුත් කර ඇතත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මෙම චෙක්පත් නිවැරදි කිරීමට 2020 වර්ෂයේ දී සැලසුම් කර තිබුන ද Covid - 19 නිසා උද්ගත වූ තත්ත්වය මත මේ සම්බන්ධව කටයුතු කිරීමට නොහැකි විය. එසේ වුවද අදාල නිවැරදි කිරීම් මු.රේ. අනුව සිදුකිරීමට පියවර ගෙන ඇත.

ii. 2017 වර්ෂයේ සිදු වූ පරිගණක මෘදුකාංගයේ බිඳ වැටීම නිසා නිකුත් කර ඇතත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මෙම චෙක්පත් නිවැරදි කිරීමට 2020 වර්ෂයේ දී සැලසුම් කර තිබුන ද Covid - 19 නිසා උද්ගත වූ තත්ත්වය මත මේ සම්බන්ධව කටයුතු කිරීමට නොහැකි විය. එසේ වුවද අදාල නිවැරදි කිරීම් මු.රේ. අනුව සිදුකිරීමට පියවර ගෙන ඇත.

iii. අදාල භාණ්ඩ භාරගත් බවට තහවුරු කිරීමේ ලිපියක් එවන ලෙස පුලියන්කුලම ප්‍රාථමික විද්‍යාලය වෙත දන්වා යවා ඇත. එය ලද විගස විගණනය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගනිමි.

(ආ) මෙහිදී එස්.යූ.කේ.රූබසිංහ මයා, ඩබ්.ඒ.ඩබ්.සී.ප්‍රේමරත්න මිය සහ ඒ.එස්.අමරසිංහ මිය යන නිළධාරීන් තිදෙනා බඳවාගෙන ඇත්තේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් වශයෙන් වන අතර අපිත් කුසුම් පොල්වත්ත මයා 2007.09.14 දින නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට උසස්වීම් ලබා ඇත. ඒ අනුව මෙම නිළධාරීන් 04දෙනා නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ට (MM1-1 පළමු ශ්‍රේණියට) හිමි වැටුපෙහි පිහිටුවා, මෙතෙක් ගෙවන ලද වැටුප හා නව වැටුප අතර වෙනස හිඟ මුදල් වශයෙන් ගණනය කර ගෙවා ඇති බව සඳහන් කරමි.

(ඇ) එස්.යූ.කේ.රූබසිංහ මයා,ඩබ්.ඒ.ඩබ්.සී ප්‍රේමරත්න මිය සහ ඒ.එස්.අමරසිංහ මිය මෙම ආයතනයට බඳවා ගන්නා විට පැවති බඳවා ගැනීමේ පරිපාටියට අනුව මෙම කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට බඳවා ගෙන ඇත. 2012 වන විට මෙම ආයතනයේ සහකාර අධ්‍යක්ෂ තනතුරක් නොතිබූ අතර 2012.05.11 අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව එවකට සේවයේ සිටි වැඩසටහන් නිළධාරීන්, සංඛ්‍යාලේඛනඥ සහ පුස්තකාලයාධිපති යන තනතුරු දැරූ අය සහකාර අධ්‍යක්ෂ තනතුරෙහි පිහිටුවා ඇත. 2012.05.11 දින අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට සෘජු බඳවා ගැනීමක් කළ නොහැකි අතර සහකාර අධ්‍යක්ෂ තනතුරෙහි සිට උසස්වීම් ලැබිය යුතුය.

2012.05.11 දින අනුමත බඳවා ගැනීමේ පරිපාටිය 4.4 හි සඳහන් කාර්යක්ෂමතා කඩඉම් සහ මෙම නිළධාරීන්ට අදාළත්වය පහත පැහැදිලි කර ඇත.

4.4 කාර්යක්ෂමතා කඩඉම්

2006 සහ 2007 වර්ෂයේදී තනතුර ස්ථිර කළ නිලධාරීන්ට ලබා දී ඇති පත්වීම් ලිපි අනුව 2 කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම සම්බන්ධව සඳහන් කර නොමැති අතර එසේ පත් වූ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම සම්බන්ධව 2017.07.17 අනුමත කළ බඳවා ගැනීම් පටිපාටියෙහිද සටහනක් දක්වා නොමැත.

4.4.1. II වන ශ්‍රේණියට පත්වී වසර තුන (3)ක් ප්‍රථම පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය.

පිළිතුර : II වන ශ්‍රේණිය යනු සහකාර අධ්‍යක්ෂ තනතුරු වන අතර මෙම නිලධාරියා බඳවා ගෙන ඇත්තේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට වේ. එබැවින් පළමු කාර්යක්ෂමතා කඩඉම අදාල නොවේ.

4.4.2. I වන ශ්‍රේණියට උසස් වී වසර පහක් (5)ක් ගතවීමට ප්‍රථම දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය.

පිළිතුර : මෙම නිලධාරියා පත්ව ඇත්තේම නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට වන බැවින් එය පළවන ශ්‍රේණියට උසස්වීමක් ලෙස සැලකිය නොහැකි බැවින් එය අදාළ නොවේ.

4.4.3. අදාල නොවේ

4.4.4. අදාල නැත.

ජී. ඒ. එම්. යූ. ගනේපොල මහතා බාහිර අයඳුම්කරුවකු ලෙස අයඳුම්කර අධ්‍යක්ෂ තනතුරට පත්වීම් ලබා ඇත. මේ සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2010.07.15 දින සිට MM 1-1 සහකාර අධ්‍යක්ෂ තනතුරෙහි (2016.01.12 දින සිට 2017.10.24 දක්වා නියෝජ්‍ය අධ්‍යක්ෂ - වැඩ බලන තනතුර සහ 2017.10.25 දින සිට 2018.04.01 දක්වා අධ්‍යක්ෂ- වැඩ ආවරණ තනතුර) සේවා කාලයට අමතරව 1996.04.04 දින සිට 2003.06.09 දින දක්වා HIAT STEELS (PVT) LTD. ආයතනයේ COMPUTER PROGRAMMER/ANALYST සේවා කාලය ගණනය කර පත්වීම ලබා දී ඇත. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමු ස්ථිර පත්වීම ලබා ඇත්තේ 2005.08.04 දින ව්‍යාපෘති සහකාර තනතුර සඳහා වේ.

බඳවා ගැනීමේ පරිපාටිය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2016 අගෝස්තු 15 දිනැති DMS/1675-VII අංක දරන ලිපිය පරිදි බාහිර අයඳුම්කරුවන් සඳහා වන අනෙක් සුදුසුකම් ගනේපොල මහතා පහත ආකාරයට සපුරා ඇත.

1. ප්‍රථම උපාධිය - විද්‍යාවේදී (භෞතීය විද්‍යා) 1995 වර්ෂයේදී කැළණිය විශ්වවිද්‍යාලයෙන් ලබා තිබීම.
2. පශ්චාත් උපාධිය- පරිසරණක විද්‍යාව 2010 වර්ෂයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ලබා තිබීම.
3. 2010 වර්ෂයේදී පශ්චාත් උපාධිය ලබා ගැනීමෙන් පසුව 2018 වර්ෂය දක්වා කළමනාකාර මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම.

(ඈ) නිසි ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කරමින් මෙම භාණ්ඩ අපහරණය කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත.

(ඊ) රට තුල පැවති වාතාවරණය මත මහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ලිඛිත අනුමැතිය ලබාගැනීමට නොහැකි වුවද වාචික අනුමැතිය මත මෙම අත්තිකාරම් විභාග කටයුතු සඳහා ලබා දුන් අතර ලිඛිත අනුමැතිය ලබාගැනීමට කඩිනමින් පියවරගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත.

(උ) විධායක මට්ටමේ වසර 08 මාස 04 දින 19 ක සේවා කාලයක් සහිත නිළධාරියෙකුට සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍රයක් ලබා දී තිබුණු බව පිළිගන්නා අතර, ඉදිරියේදී මෙවැනි දෝෂයන් සිදු නොවන සේ කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත.

2.2.3 බලතල, කර්තව්‍ය කාර්යයන්

(අ) මහාභාණ්ඩාගාරයෙන් පර්යේෂණ සඳහා ප්‍රතිපාදන සලසා තිබුණද, ලබාදී තිබූ ප්‍රතිපාදන සීමිත බැවින් SSDP ව්‍යාපෘතිය මඟින් වෙන්කරන ලද අයවැය ඇස්තමේන්තුවේ පර්යේෂණ සඳහා වෙනම වැය විෂයක් එනම්, DLI (Disbursement Link Index) එකක් ස්ථාපනය වී තිබූ හෙයින්, එසේ වෙන් කරන ලද මුදල් පර්යේෂණ සඳහා උපයෝගි කරගන්නා ලදී.

(ආ)

(i) මෙහිදී පනත අනුව පැවරී ඇති බලතල අනුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ ජාතික වෘත්තීය සුදුසුකම් මෙහෙයුම් අත්පොත් නිර්ණායක වලට අනුව ජාතික නිපුණතා සම්මත හා විෂයමාලා සංවර්ධනය කිරීමේ කාර්යය ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) හා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය Univotec යන ආයතන මඟින් ඉටුකරනු ලබයි.

නිපුණතා සම්මත සංවර්ධනයට ඇති ඉල්ලුම හඳුනාගැනීම සඳහා නොයෙකුත් ක්‍රමවේද භාවිතා කරනු ලබයි. ඒ අතර ශ්‍රම වෙළඳපොළ විශ්ලේෂණය, නිපුණතා ආංශික සභා මඟින් ජාතික නිපුණතා සම්මත හා විෂයමාලා සංවර්ධනය කල යුතු ක්ෂේත්‍ර හඳුනාගැනීම යනාදිය දැක්විය හැක. තවද ජාතික නිපුණතා සම්මත හා විෂයමාලා සංවර්ධනය කිරීමේ කාර්යය ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) හා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය Univotec යන ආයතන මඟින් ඉටුකරගනු ලැබූවද ඒ සඳහා ඉල්ලුම වැඩි වූ අවස්ථාවේ දී හා නිපුණතා සම්මත කඩිනමින් අවශ්‍ය වූ අවස්ථාවල දී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) මඟින් ජාතික නිපුණතා සම්මත හා විෂයමාලා සංවර්ධනය සිදු කරනු ලබයි.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් සංවර්ධනය කරන ලද සහ යාවත්කාලීන කරන ලද ජාතික නිපුණතා සම්මත වලංගුභාවයට පත් කිරීම සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය (NAITA) වෙත යවනු ලබන අතර NITAC කමිටුව මඟින් එය වලංගුභාවයට පත්කරනු ලබයි.

නිපුණතා පාදක පුහුණුව (CBT) සහ ආයතනික පාදක පුහුණු (EBT) යන ක්‍රම වලට පාඨමාලා පවත්වනු ලබන සහ පුහුණු ආයතන වලින් ඉල්ලීමක් කළ වෘත්තීන්ට පමණක් අදාළ ජාතික නිපුණතා සම්මත සඳහා මෙතෙක් නිපුණතා පාදක පුහුණු විෂය මාලා සංවර්ධනය කර ඇත. තවද විෂයමාලා සකස්කර නොමැති ක්ෂේත්‍ර සඳහා ද විෂයමාලා සකස්කරන ලෙස අධ්‍යක්ෂ (ජා.වෘ.සු.) වෙත උපදෙස් දී ඇත.

(ii) යාවත්කාලීන කිරීම සඳහා ජාතික නිපුණතා සම්මත හා විෂයමාලා තෝරාගැනීමේ දී මෙතෙක් එම වෘත්තීන්ට අදාළව නිකුත්කර ඇති සහතික පත්‍ර සංඛ්‍යාව , සිදුවී ඇති තාක්ෂණික වෙනස්කම් සහ කර්මාන්තයෙන් සිදුකර ඇති ඉල්ලීම් සැළකිල්ලට ගනු ලබයි. ඒ අනුව යාවත්කාලීන කලයුතු විෂය මාලා යාවත්කාලීන කිරීම සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබූවද මේ සඳහා විශාල පරිශ්‍රමයක් හා වියදමක් දැරීමට සිදුවේ. කෙසේ වුවද මෙතෙක් යාවත්කාලීන නොකරන ලද විෂයමාලා යාවත්කාලීන කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස අධ්‍යක්ෂ (ජා.වෘ.සු.) වෙත උපදෙස් දී ඇත.

2.2.4 විගණනයෙන් සඳහන් කර ඇති පරිදි ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කිරීමට පියවර ගනිමි.

2.3 වෙනත් කරුණු

වර්තමාන බඳවා ගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි සංශෝධනය සඳහා අභ්‍යන්තර කමිටුවක් පත්කර අභ්‍යන්තර සාකච්ඡා පවත්වා සංශෝධනයන් කර ඇති අතර, කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.



ආචාර්ය කේ.ඒ.ලලිතධීර
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

ලේකම් - නිපුණතා සංවර්ධන, රැකී රක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය (කා.දැ.ගැ.ස)
විගණන අධිකාරී - රජයේ විගණන අංශය (කා.දැ.ගැ.ස)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක හා විමර්ෂණ) - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (දැ.ගැ.ස)

Tertiary and Vocational Education Commission
State Ministry of Skills Development, Vocational Education, Research & Innovation

3rd Floor, "Nipunatha Piyasa"
354/2, Elvitigala Mawatha, Narahenpita, Colombo 05.

Telephone : 011-7608000 | Fax : 011-2555007 | e-mail : info@tvec.gov.lk

www.tvec.gov.lk